**<u>වෂර් 2022 ක් වූ ජුනි මස 15 වන දින පෙ.ව. 10.00 ට සභා රැස්වීම් ශාලාවේදී</u>**
**<u>පවත්වන ලද</u>**
**<u>මතුගම ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාතර්ාව</u>**

සහභාගිත්වය :- සභිකවරු

01. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු සභාපති
02. ආර්.ඒ.ඩී. ලලිත් රණසිංහ මහතා - ගරු උප සභාපති
03. මද්දුමගේ දොන් අතුල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. කේ.කේ.ඩී. ලලිත් නිශාන්ත කුලතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. කසුන් හිරෝෂන මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
09. සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. කේ. ප්‍රියන්කා දමයන්ති ගුණවධර්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
11. කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. ප්‍රේමරත්න නාකන්දල මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. එච්.ඩී. නාමල් ප්‍රදීප් විජේකුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. සීතා ඩයස් ජයසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
16. සූරියආරච්චිගේ සුජීව නිමර්ාන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
17. පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
18. සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගණී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
19. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
20. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. මද්දගේ හින්ටන් ගුණසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
23. එච්.ඩී. සුරේෂ් දශර්න ජයසේකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. දිසානායක සුදේශ් ලක්මාල් ජයවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
25. හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. කරුණාමුණි ප්‍රසාදික නඳුන් ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

නොපැමිණි සභිකවරු :-

01. වික්‍රමආරච්චි කංකානම්ගේ කමිල් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
02. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
03. අධිකාරිවත්තගේ ප්‍රියන්ත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. දෝන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
05. ජේ.කේ.ඩී. පුබුදු මධුරංග ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

**07.** කේ.ඩබ්. නිලූකා දශර්නී සිල්වා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි

**08.** අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවධර්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

මෙදින පෙ.ව. **10.00** ට පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාසික මහ සභාව රැස්වුහ. පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් සභාවට පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුලු ගරු මන්ත්‍රී මණ්ඩලයත්, නිලධාරීන් හා මාධ්‍යවේදීනුත් පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

**01. 2022.05.24** වන දින පැවති මහ සභා රැස්වීමේ වාතර්ාව සභා අනුමැතිය සලකා බැලීම **:**

ඉහත සභා වාතර්ාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. ඒ සිරිසේන මහතාගේ ස්ථිරත්වයෙන් පහත සංශෝධන වලට යටත්ව සභා සම්මත විය.

පසු ගිය වාතර්ාවේදී සිදු වු ප්‍රමාද දෝෂයක් හේතුවෙන් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ලලිත් රණසිංහ මහතා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ප්‍රියංකා ගුණවධර්න මහත්මිය, සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා විසින් සිදු කරන ලද ප්‍රකාශ වල අඩුවෙන් සටහන් වු කොටස පහත පරිදි සංශෝධනය කර ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ලලිත් රණසිංහ මහතා
සභා වාතර්ාව සත්‍ය වාතර්ාවක් විදියට ස්ථිර වුණාට මේ පසුගිය වාතර්ාවේ මම කරපු ප්‍රකාශය සඳහන් වෙලා නෑ.ඒ සඳහා අවස්ථාව ලබා දෙනවානම් මම නැවත ඒ ප්‍රකාශය කරන්නම්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අවස්ථාව දෙන්නම්.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ලලිත් රණසිංහ මහතා
අවස්ථාව ලබා දිය යුතුයි.නැත්නම් අපිට ආයෙත් ඇවිත් ගහලා යනවා.මේකේ පෙත්තකන්දක් සම්බන්ධව දාලා තියෙනවා.මම එහෙම දෙයක් කිව්වේ නෑ.ඇත්තටම මම වෙන මතයක ඉදියේ.නමුත් මට දැනගන්න ලැබුණා එදා දිනයේ පටිගත කිරීම් සිදු වෙලා නොමැති බව.ඒ නිසායි වාතර්ාවේ මෙහෙම අඩුපාඩු වුණේ කියලා.ඇත්තටම මම ඒ ගැන මම කණගාටු වෙනවා.මමත් පලාත් පාලනයේ හිටපු කෙනෙක්.මේකේදී වෙන්නේ පලාත් පාලනයේ ඉන්න අයව ටික දවසක් යනකොට අධ්‍යාපනයට වගේ වෙනත් ඒවට මාරු කරනවා.ඒවයේ එකිනෙකට විෂය පථය වෙනස්.එකක් ඉගෙනගන්නකොටම ෙවන එකකට මාරු කරනවා.ඒක නිසා තමයි මේ වගේ සිදුවීම් සිදු වෙන්නේ.විශේෂයෙන් මම සඳහන් කරා **09** වෙනිදා වුණ සිද්ධිය පිළිබඳව. එදා මහින්ද රාජපක්ෂ මහත්තයා අනුරාධපුරයට යනකොට ඉතා කණගාටුවෙන් මම බලන් හිටියේ.මොකද එතුමා ඉල්ලා අස් වෙන්න තමයි යන්නේ කියල මම හිතුවේ.මම හිතුවා එතුමා කියයි කියලා දහස් ගානක් මරපු එල්.ටී.ටී සංවිධානය මම අයින් කරලා දැම්මා.නමුත් දැන් ත්‍රෛනිකායික ස්වාමින් වහන්සේලා අපේ ලිපි භාර ගන්නේ නෑ. මම මේ ලිපිය අනුරාධපුරයට ඇවිත් භාර දෙනවා කියලා කියයි කියලා මම හිතුවා.ඊට පස්සේ අපේ සභාපතිතුමාලා කැඳවලා තිබුණා.පස්සේ අපිව කැඳවපු වෙලාවේ මම සභාපතිතුමාට කිව්වා මට එන්න වෙන්නේ නෑ.ඔබතුමාත් රජයේ වාහනවල යන්න එපා කියලා.මට තේරුණා මොකක්ද වෙන්නේ

කියලා.දවල් වෙලා මම දැන ගත්තාම මම සභාපතිතුමාට කථා කරාම එතුමා එන ගමන් කිව්වා.අපේ අය ආවා.නමුත් ඇවිත් සමහර අය කරේ අන්තවාදී වැඩ. අනුප පස්කුවල් මහත්තයාගේ ගෙදරට ගැහුවා.එතුමා මොනවා කරලද?සභාපතිතුමාලගේ ගෙදරට ගැහුවා. අනුප පස්කුවල් මහත්තයාගේ ගෙදරට ගහලා ආවේ අපේ ගෙදරට.මගේ ළඟ විනාඩි 20ක වීඩියෝ එකක් තියෙනවා. මම මේ ප්‍රකාශය එදා කරේ නෑ.අද මට ඒක කියන්න පුළුවන්. ඒකේ තියෙනවා "ලලිත් ලලිත් උඹ හිටපන් උඹ බලන්න අපි එන්නම්".ඒ විදියට කිය කිය පාර දිගේ එනවා.ඒ වෙලාවේ එතන උගත් පිරිසකුත් සම්බන්ධ වෙලා ඉන්නවා.ෆිනෑන්ස් කම්පැනි වල අයත් ඉන්නවා.මම ඒ අයගේ විස්තර අර ගත්තා.ඒ වීඩියෝ සහ විස්තර මම අදාල ආයතන වලට භාර දෙනවා.මොකද මම ආයිත් ඡන්දේ ඉල්ලන්න බලාපොරොත්තුවක් නෑ.අවශ්‍ය නම් අභියෝග කරොත් ස්වාධීනව හෝ ඉල්ලලා දිනලා පෙන්නන්න පුළුවන් අය අපි.අපි වැඩ කරලා තියෙනවා.ඒ වගේම මම කියන්න ඕනා මට ගහන්න ඇත්තේ මෙන්න මේ දේවල් කරපු නිසා වෙන්න ඇති කියලා මම හිතනවා.මතුගම කන්ද මුදුනට හැමෝම පාරවල් කපලා තිබුණා.පල්ලෙහාට පාරක් කපලා තිබුනේ නෑ.හැබැයි ඒක සඳහන් කරලා තිබුණේ පෙත්තකන්ද කියලා.මම 1994-1996 දක්වා මගේ යුතුකම මම ඉෂ්ඨ කරා.මම පාර කපලා එක පැත්තකින් ගිහින් අනෙක් පැත්තෙන් එන්න පුළුවන් තත්වයක් ඇති කරා. ඔය මදුරුගොඩ කන්ද පාර තිබුණේ නෑ.මම තමයි කඩලා හැදුවේ.ඒ විතරක් නෙවෙයි තව පාරවල් කීපයක් හදලා තියෙනවා.මේ නිසා අද තියෙන ඩීසල් ප්‍රශ්නයටත් ලොකු පිළිසරණක් වෙලා තියෙනවා.මම එතකොට එක්සත් ජාතික පක්ෂයේ හිටියේ.ඒ කාලේ ඉඳපු මන්ත්‍රීතුමෙක් මට උදව් කරා.ඒකත් විශේෂයෙන් මතක් කරන්න ඕනා.ඒ වගේම තමයි අපි කොරියාවට අරින කොට ගම් වල විශාල පිරිසක් ඇරියා.ගෙවල් ළඟ ගෙදරක කෙනෙක්ව තානාපති කාර්යාලයට යැවුවේ.මට රජයෙන් දීලා තිබුණ වාහනේ අරන් ගියේ. මම කොරියාවට ගියා.ඕනම කෙනෙක්ගෙන් අහන්න මම කිසි කෙනෙක්ගෙන් රුපියලක්වත් අරන් නෑ.එහෙම කියනවානම් මම හෙට මේකෙන් අයින් වෙන්න ලෑස්තියි.අපි එහෙම කරපු අය.

ඒ විතරක් නෙවෙයි මම මේ සභාවට එනකොට මට වාහනයක් තිබුනේ නෑ.මට එවකට ඉඳපු ලේකම්තුමා වාහනයක් කුලියට ගන්න දුන්නා.දවස් 14ක් දිව්වා.බිල දාහත්දහස් ගානක් වුණා.ඒක නතර කරලා දාලා මම බයිසිකලෙන් ගියේ.ඊට පස්සේ සභාවේ කැබ් එක හදන්න දාලා තිබුණා.ලක්ෂ 6ක් යනවා කියලා.ඒක ලක්ෂ තුනයි ගානට හදවලා පාවිච්චි කරා.රණවක මෝටර්ස් ආයතනය තමයි ඒක කරලා දුන්නේ.ඒ අධිපතිතුමාට ස්තුති කරන්න ඕනා.ඒ වගේම ඒ ආයතනයෙන්ම අයින් කරලා තිබුණ ට්‍රැක්ටරයක් අපි හදවා ගත්තා.එහෙම වැඩ කරපු අපිට තමයි මේ විදියට ඇවිත් ගැහුවේ.නැතුව මම හොරකම් කරලාවත්,එදා ගෝල්ෆේස් ගිහිල්ලා ගහලාවත් නෙවෙයි අපේ ගෙදරට ගැහුවේ.මම ඒ වෙලාවේ ගෙදර ඉඳියේ.ගල් ගහලා සීට් ගානක් විනාශ වෙලා.මගේ දරුවා බයවෙලා කථා කරලා ඇහුවා මට මම කිව්වා මුකුත් නෑ කියලා.ගල් වගයක් ගැහුවා විතරයි කියලා.ඒ වෙලාවේ ගෙදර සෙනඟ ඉඳියා.ඒ ඉඳපු ආච්චි කෙනෙක්ගෙන් අහන්න කියලා මම කිව්වා.ඒ වෙලාවේ ඒ කාන්තාව කිව්වා පුතේ තාත්තාට මුකුත් නෑ කියලා.ඒ වෙලාවේ තමයි කිව්වේ සහතික ගැන.අපේ දරුවන්ගේ සහතික ටික නැතිවුනාම මොකද වෙන්නේ.ඒ වේදනාව දැනෙන්නේ ඔයගොල්ලන්ටත් ඒ වේදනාව ඇති වුනොත්.ඒක නිසා මම මේ සභාවේ කියනවා මම මැරිලා මිනිය ගෙදරට ගෙනාවම පැය 8කට වඩා

තියන්න එපා.මගේ අවසාන ඉල්ලීම ඒක.භූමදානය කරනවා නම් කරන්න.සභාපතිතුමා ජීවතුන් අතර හිටියොත් ඒ ආදාහනයට සල්ලි දෙන්න ඔබතුමාලා එකතු වෙලා.

ඒ වගේම මහින්ද සමරසිංහ මැතිතුමා එක්ක මම දේශපාලනය පටන් ගත්තේ.අපේ අගමැතිතුමා ඉල්ලා අස් වෙයි කියලා මම හිතුවේ එක හේතුවක් උඩ.මේ වගේ එක්සත් ජාතික පක්ෂයේ රනිල් මහත්තයා අගමැති වෙලා ඉන්න කොට ඇමතිකම් දෙකක් ගත්තා.ඒ වෙලාවේ අපි ගුවන්තොටුපලට ගියා.රනිල් මහත්තයා ඇවිත් කිව්වේ "ආවට ගොඩක් ස්තුතියි වුවමනාවක් වුනොත් කැඳවන්නම්" කියලා.අපි කල්පනා කරා අපි ආවේ මොකටද කියලා?මම මහින්ද සමරසිංහ මැතිතුමාගෙන් ඇහුවම එතුමා කිව්වේ "ලලිත් ඒක තමයි හරි කියලා "රටක් ගිනි තියන්න නෙවෙයි ඕනා රටක් බේර ගන්න කියලා".මේ සමහර අය ගිනි තිබ්බා. අදත් රට අගාධයට දාලා මේක කරන්නේ.අදත් මේ තරම් රට වැටිලා තියෙද්දි රට ගැන තීරණයක් ගන්නේ නෑ.එහෙම රටක ඉන්න හිටින්න ආසාවක් නැති වෙලා තියෙන්නේ.ඒ මේ රට නිසා නෙවෙයි පාලකයෝ නිසා.අපි පක්ෂ පාට බැලුවේ නෑ.ගමේ හැම මළ ගෙදරටම හාමුදුරුවෝ වඩම්මලා තියෙනවා.කෙනෙක්ට රෝහලකට යන්න තියෙනවා නම් මම එක්කර ගෙන ගිහින් තියෙනවා.අපේ දරුවන් ලවා පෝයට සිල් ගන්න යන අයව පන්සලට ඇරලවලා තියෙනවා.එහෙම කෙනෙක් මම.ඒකනම් මම බලාපොරොත්තු වුණේ මම වයසට ගියාමත් මගේ දරුවෝ ඒ විදියට සලකයි කියලා.ඒ පුරුද්ද ඇති කරන්න.අන්න එහෙම කරපු අපිට තමයි ගැහුවේ.මේ දේශපාලනය කරා කියලා අපි විනාශ කරේ නෑ.අපි සම්පත් නැති කරේ නෑ.මම ඉන්න කාලේ තමයි මම ආඩම්බරයෙන් කියන්නේ.**94-96** දක්වා එකම කොන්ත්‍රාත් එකක්වත් දීලා නෑ.සේරම කරේ සභාවෙන්.අමතර සේවකයින් බඳවා ගන්න අවසරයක් අරගෙන සේරම සභාවෙන් කරේ.පියසිරි විජේනායක මැතිතුමා මට කිව්වා දෙන්න කියලා.මම කිව්වා දෙන්නේ නෑ.ඒකසභා තීරණයක් කියලා.රත්නසිරි වික්‍රමනායක මැතිතුමාත් කිව්වා දෙන්න කියලා මම දුන්නේ නෑ.මම එක මතයේ හිටියා. එහෙම කරලා සභාවට ලක්ෂ ගානක් ලාභ අරගෙන දීලා මේ සභාව දියුණු කරා.අපිට ඒ දවස්වල රජයෙන් දුන්නේ නෑ.එහෙම කරපු අපිට ගහපු එකට ලොකු වේදනාවක් මට තියෙනවා.උගත් පිරිස්, අපේ ධම්මික මන්ත්‍රීතුමාලගේ කේෂ්ත්‍රයේ ඉන්න අය, වගේ තමයි මේ ඇවිත් උද්ඝෝෂණය කරේ.අපිට ලොකු අපහාසයක් සිද්ධ වුණා.අපිට මිනිස්සුන්ගේ තිබුණ ගෞරවය නැත්තටම නැති කරා.ඒ සම්බන්ධව මට වුණ අපහාසයට විරුද්ධව මම ක්‍රියා කරනවා.මට ඇත්තටම කණගාටුවක් තියෙන නිසායි මම මේ ප්‍රකාශය නැවත කරේ.ඒ වගේම කියන්න ඕනා අපේ ආණ්ඩුවෙත් තව දේවල් තිබුණා.සුදුස්සාට සුදුසු තැන දුන්නේ නෑ.මහින්ද සමරසිංහ මහත්තයාලව පසුපෙළ වාඩි කරා.මම අහන්න කැමතියි මේ සභාවෙන් මෙතුමා වගේ කෙනෙක් මේ කළුතර දිස්ත්‍රික්කයේ ඉන්නවද කියලා.අභියෝගයක් විතරයි.එක ඇමති කෙනෙක් රටකින් දෙයක් ගෙනත් දීලා තියෙනවද සභාවට?ඒ දීලා තියෙනවානම් එතුමා විතරයි.ජේනරේටරය පවා තියෙන්නේ එතුමා දීපු එකක්.ඒ විතරක් නෙවෙයි බෝට්ටු එන්ජින්,ආපදාවලට අවශ්‍ය ටෙන්ට්,අගලවත්ත ශ්‍රවණාගාරය වගේ දේවල් කරපු මෙතුමාව පිටිපස්සේ වාඩි කරා.ඇමෙරිකාවේ ජනාධිපතිතුමා එතුමාව විනාඩි පහකට කැඳවලා රටේ තත්වය අහලා තිබුණා. එතුමා ඒ කාලය තුල මගේ රට වැටිලා තියෙන්නේ.ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක්ක සාකච්ඡා කරනවා.ඒක නිසා මගේ රටට උදව් කරන්න කියන ඉල්ලීමත් එතුමා කරනවා.එහෙම අයව තමයි අයින් කරලා තිබ්බේ.ඒ වගේම විශ්ව විද්‍යාලයට යන්න බැරි දරුවෝ බලලා හෙද සේවයට පුහුණු කරලා ප්‍රංශය,ජමර්නියට වගේ රටවලට යවන්න එතුමා කටයුතු කරන බව ෙද්ශපාලන

වේදිකාවේ කිව්වා.එතුමාව ජයග්‍රහණය කරන්න විශාල පිරිසක් කටයුතු කරා.එතුමා මේ රට වෙනුවෙන් යමක් කරපු කෙනෙක්.මම එතුමා ගැන කථා කරේ වෙන දෙයක් කියන්න.උපන්දින දවසේ රෝහිත ඇමතිතුමාව ගෙනල්ලා කඩ පේලිය විවෘත කරපු එකේ ප්‍රතිඵලයක් තමයි මේ ප්‍රහාරය.මේ ප්‍රහාරයට ඒක හේතු වුණා කියලා කියනවා.මම කණගාටු වෙනවා.මම එතුමත් එක්ක සම්බන්ධ වුනෙත් නෑ.උපන් දිනය දවසේනම් ආවා.ඉතින් මට අවසාන වශයෙන් කියන්න තියෙන්නේ ඊෂරීයාව තමයි මේකට හේතු වුණේ.මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය පුද කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා ගුණවර්ධන මිය
පළමුව මා 2022.05.09 දින සිදු වූ සිදුවීම් දෙක සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරනවා.මොකද මේ සිංහලයන්ට වෙලා තියෙන්නේ,83 ජූලි කලබල වෙලාවෙත් සිංහල මිනිස්සු දෙමළ ජනතාව රැක ගත්තා.අද අපි අපිම කා ගන්නවා.අපේ රටේ වටිනාකම සිංහල භාෂාවට අනුව අලංකරණ යොදා විග්‍රහ කරලා තියෙනවා.මිනිස් සම්පත,වන සම්පත,ජල සම්පත,මත්ස්‍ය සම්පත ආදී වශයෙන් .ඇත්තටම මේ රට සම්පත් ආකරයක්.මෑතකදී අපි මාධ්‍ය තුලින් දුටුවා නේපාල ජාතික සංචාරකයෙක් යාපනයේ සිට දෙවුන්දර දක්වා පා ගමනක් යනවා,අපේ රටේ ස්වභාව සෞන්දර්යය ගැන ලෝකයාට කියා පෑමට.ඇයි අපිට ඒ බව වැටහෙන්නේ නැත්තේ?
සිස්ටම් චේන්ජ් එකකට අපිත් කැමතියි.හැබැයි අරගල භූමියේ සිටින සමහර දරුවන් මාධ්‍යයට ඇවිත් අදහස් දැක්වීමේදී ,ව්‍යාවස්ථාව,රටේ නීතිය,ජාත්‍යන්තර සබඳතා හා ගෝලීය තත්වයන් හමුවේ රටක් වශයෙන් මුහුණ දිය යුතු ආකාරය සම්බන්ධයෙන් අපට හරවත් යමක් හෝ ඔවුනට අවබෝධයක් තිබේද යන්න ප්‍රශ්නයක්.එම නිසා පළමුව අපේ මාතෘ භූමිය රැක ගැනීමට සැවොම වග බලා ගමු කියලා මා කියා සිටිනවා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා
මේ වාතර්ාවේ මගේ ප්‍රකාශය දාලා තියෙන්නේ තේරුමක් නැති විදියට.මම සභාපතිතුමාගේ ගෙදරට ගැහුවා වගේ.මේ වාතර්ාව වැරදියි. අපි මේ ගැන සභාවේ කථා කරා කියලාවත් නීතිය ඉදිරියට ගෙනියන්න හැකියාවක් නෑ.ඒක නිසා මේකේ සංශෝධනයක් කරන්න.
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඔබතුමාගේ ප්‍රකාශ ටිකත් ලියලා හෝ දෙන්න.ඒ සංශෝධනවලට යටත්ව සභා වාතර්ාව අනුමත කරන්නේ.ඒක නැති වුනොත් සභා වාතර්ාව පිලිගන්නේ නැති තත්වයට යනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
සභාවේ වාතර්ාව පිළිබඳ තිබුණු දෝෂයක් තමයි උප සභාපතිතුමා සඳහන් කලේ.එතුමාගේ කථාව සම්පූර්ණයෙන්ම සංක්ෂිප්ත වෙලා වාතර්ාවට ඇවිත් නැති නිසා මේ ගැන ඇහුවා.ඇහුවම විෂය භාර නිලධාරිනිය කිව්වේ පටිගත කිරීමේ ප්‍රශ්නයක් කියලා.පටිගත කිරීමේ ගැටළුවක් නම් රෙකෝඩරයක් ගන්න බැරිනම් වැඩක් නෑ.ජංගම දූරකථනයෙන් පටිගත කරලා හරියන්නේ නෑ.කෝල් එනකොට කට් වෙනවා.ඇයි මේ සභාවට රෙකෝඩරයක් ගන්න බැරි?බැරිනම් අපි සල්ලි එකතු කරලා හරි ගෙනත් දෙන්නම්.ඒක වගකීමෙන් කරන්න.සභා වාතර්ාව කියන්නේ වැදගත් දෙයක්.මේ සිද්ධියට අදාල වෙච්ච මන්ත්‍රීවරුන්ට තියෙන වේදනාව ඒ අය තමයි දන්නේ.තමන්ගේ නිවස කුඩු

කරලා දැම්මාම ඒක හදා ගන්න තියෙන අමාරුව.මටත් කියන්න තියෙන්නේ ඒකයි.මට වගේම,සමන්ත මන්ත්‍රීතුමා,උප සභාපතිතුමාටත් ඒ වගේ.මේ පරීක්ෂණ ගැන අපේ නෑ ප්‍රසාදයක්. පොලිස් නිලධාරීන් ඇවිත් ලියාගෙන ගියා.කිසිම කැඳවීමක් නෑ.මේ වෙනතුරු කිසිම ක්‍රියාමාගර්යක් නෑ. තාම මේ රටේ යම් බයක් තියෙනවා.මේවාට සමහර පුද්ගලයෝ ආශිවර්ාද කරනවා.ඒක අනාගතයට නරක පූවර්ාදශර්යක්.අපි ඉන්නෙත් ලොකු වේදනාවක.ගෙවල්වල නිදාගන්න නෑ අපට.මේක ගැන රජයට අපේ අප්‍රසාදය පල කරනවා.රටේ නායකයන්ටයි අප්‍රසාදය පල කරන්නේ.කිසිම සොයා බැලීමක් කරලා නෑ. මේ සම්බන්ධව ලොකු භීතියක ඉන්නේ.පසුගිය දවසක මතුගම නගරයේ රැස්වීමක් කැඳෙව්වා.ඒවා අනවසරයෙන් තියන රැස්වීම් වෙනවා.මේක ලොකුවට සිතිය යුතු දෙයක්.මේක ආශිවර්ාද කළ යුතු දෙයක් නෙවෙයි.මේවට සම්බන්ධ වුණේ හයහතරක් නොදන්න අය වෙන්න පුළුවන්.දන්න අය වෙන්න පුළුවන්.මත්පැන් බීලා ඇවිත් කරා වෙන්න පුළුවන්.පාරේ යනකොට සත්වයාගේ හෝන් එක ගහනවා.වේදනාවෙන් ඉන්න මිනිස්සුන්ට මේ ගහන්නේ.මේක හොඳ දෙයක් නෙවෙයි. සියලු පක්ෂ එකතු වෙලා මේක නැති කරන්න ඕනා.ලලිත් මහත්තයා එදාට වඩා ප්‍රකාශ කිහිපයක් අද කරා.මමත් ගියා එතුමාගේ හඳුනා ගැනීමේ පෙරට්ටුව වෙලාවට.එතුමට ඒක කියන්න අමතක වුණා.ඒ වෙලාවේ අපේ මන්ත්‍රීතුමන්ලට යෝජනා කරලා තිබුණා මේක සමාදාන කර දෙන්න කියලා.ඒ මන්ත්‍රීතුමන්ලා ඒවා භාර ගත්තේ නෑ.නමුත් සම්බන්ධ වුණ අය මේක සුළුවට තකන්නේ. ලලිත් මහත්තයාට සභා වාතර්වේ වුණ දේ ගැන කණගාටුව ප්‍රකාශ කරනවා.තවත් මන්ත්‍රීතුමන්ලා ඉනනවානම් ඒ පිළිබඳ අදහස් දක්වන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා
පසු ගිය සභාවේ අපි ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කරා.ඒවට මොකද වුණේ කියලා දැන ගන්න අවශ්‍යයි.හොරවල ඉඩම ගැන.ඒ වගේම පරිගණක සම්බන්ධව කථා කරා වියදම වැඩියි කියලා.ඔබතුමා කිව්වා මම කියන්නේ බොරුයි කියලා.මමත් පරිගණක අළුත්වැඩියා කරා.මට එච්චර මුදලක් ගියේ නෑ.ඔබතුමා හොරකම් කරන අය ආරක්ෂා කරනවා නම් ඒක ඔබතුමාටත් ගෑවෙනවා.මීට කලිනුත් මම ටයර් ප්‍රශ්න සහ අනෙකුත් දේවල් පෙන්නලා දීලා තියෙනවා.අවුරුදු හතරක් තිස්සේ මේවාට විසඳුමක් ලැබුනේ නෑ.මහජන නියෝජිතයෝ නෙවෙයි නිලධාරීන් එකතු වෙලා යම් යම් ගිවිසුම් ගහගෙන හොරකම් කරනවා.අපි මේවා නතර කරන්න ඕනේ.යම් කිසි කොටසක් මේකේ හොරකම් කරනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මම බොරු කියලා කිව්වේ නෑ.එහෙම තියෙනවා නම් මම ඒක අයින් කර ගන්නම්.ඔබතුමා ඒ සම්බන්ධව විමශර්නයක් ඉල්ලන්න.මමත් මේ වගේ අළුත්වැඩියාවක් කරා.මේ වගේ වියදමක් මට ගියේ නෑ.ඒක නිසා මේ සභාවේ වියදම පිලිගන්න බෑ කියලා. ඒ වගේම මම කාරක සභාවක් කරලා ලේකම්තුමියට භාර දෙනවා පරිගණක ගැටළුව විසඳන්න.

නිලධාරීන් එකතු වෙලා යම් යම් ගිවිසුම් ගහගෙන හොරකම් කරනවා කියලා කියන්නේ.මේවා නිරවුල් වෙන්න ඕනා.ලේකම් මිස්ට කෙහොමද මේ තොරතුරු දෙන්න පුළුවන් කියලා කියන්න

ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් මිය
සභාපතිතුමාගේ ලිඛිත අවසරයක් මත දෙන්න පුළුවන්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ලේකම්තුමිය පොරොන්දු වුණා සභාව ඉවර වෙන්න ඉස්සර වෙලා ඒ ගැන වාතර්ාවක් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

ටයර් නැවත පිරවීම සම්බන්ධව අපි කථා කරා.මේ සභාවට යම් මුදලක් ඉතිරිකර දෙන්න අපි හදන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ටයර් නැවත පිරවීම සඳහා ආයතනයකට දීලා තියෙනවා.මේකේ ෙල්කම් පරිපාලන කාලේ ඉඳලා ටයර් නැවත පුරවලා නෑ.ඊට ඉස්සෙල්ලා අපි ඒක කලා.දැන් කාරක සභා අවස්ථාව අවසාන කරනවා.

ඒ වගේම සමන්ත මන්ත්‍රීතුමාගේ සංශෝධනත් අරගෙන ඊට යටත්ව සභා වාතර්ාව සම්මත කිරීමයි අපේ තීරණය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ප්‍රියංකා ගුණවධර්න මිය.

ගියවර සභාවේ මගේ කථාව අඩුවෙන් සටහන් වෙලා තියෙන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒ ටිකත් දැන් ලියලා දෙන්න ඊළඟ වාතර්ාවේ ඇතුලත් කරන්න කටයුතු කරන්න.

**02.** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතාගේ නිවේදනය :- මේ යටතේ කාන්තා සංවිධානය ගැන පලාත් පාලන ආයතනයත් එක්ක කාන්තා උපදේශන කාරක සභාවක් පත් කිරීම සම්බන්ධව සීතා මන්ත්‍රීතුමිය ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා.ඒක සභාගත කරනවා.

**03.** නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :-

**3.1** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා
**3.2** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවධර්න මහතා
**3.3** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි නිලූකා දශර්නි මහත්මිය
**3.4** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පුබුදු මධුරංග ජයනෙත්ති මහතා
**3.5** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඩී.එල් මුණසිංහ මහත්මිය
**3.6** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය
**3.7** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි

යන මන්ත්‍රීවරු නොපැමිණෙන බව සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවධර්න මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පුෂ්පා නන්දනී මන්ත්‍රීතුමිය ප්‍රමාද වී පැමිණෙන බව දන්වන ලදී.

**04.** සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම් හා පැමිණිලි සභාගත කිරීම :-

**05.** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න -:

**5.1** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා විසින් යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න -:

**5.1.1** ඉදිරියේදී ඇති වන ආහාර හිඟය හා රටේ පවතින ව්‍යාසනයට මුහුණ දීම සඳහා මෙම සභාව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන සැලසුම් මොනවාද?

පිළිතුරු ලබා දී ඇත.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

අපි මීට කලිනුත් සභාවේ කිව්වා වගා වැඩ සටහනට එකතු වෙන්න කියලා.අපේ මන්ත්‍රීවරු කීප දෙනෙක් වගා වැඩ සටහනට එකතු වුණා.අපේ උප සභාපතිතුමා,නිශාන්ත මන්ත්‍රීතුමා, කාන්ත මන්ත්‍රීතුමා,කසුන් මන්ත්‍රීතුමා වගා වැඩ සටහන් කරා.අපි ඒවා ගිහින් බැලුවා.අපි සේවකයෝ දෙන්නම්.තමන්ගේ ගෙවත්තේ මේ කාලයට උචිත වගාවක් කරන්න.ඒ වගේම ලලිත් සිරිවර්ධන මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කරා වගා වැඩසටහනට සම්පූර්ණ සහයෝගය දෙනවා කියලා.දැන් රට පුරා කියනවා වගාවට යොමු වෙන්න කියලා.නමුත් සභාවල ඒවගේම ගොවිජන සේවාවල තාම මේක ක්‍රියාත්මක නෑ.ප්‍රාදේශීය ලේකම් එකේ නම් වගා වැඩසටහනක් යනවා.මේ වැඩසටහනට ලක්ෂ දහයක මුදලක් වෙන් කරලා තියෙද්දිත් අපි ලොකු පසුබෑමක ඉන්නේ. අපි **LRC** ඉඩම් හඳුන ගෙන තියෙනවා. **LRC** ඉඩම් තියෙනවා වැලිපැන්න ප්‍රදේශයේ,රිටිකැටිය,අළුත්ගම්ගොඩ,ප්‍රදේශවල.ඒවා ගැන සාකච්ඡා කරලා තියෙනවා.ඊට අමතරව ප්‍රාදේශීය ලේකම්තුමියට දැනුම් දීලා තියෙනවා අපේ සුසාන භූමි සඳහා පැවරුම් නියෝග යටතේ ලබා නොදීපු කීපයක් තියෙනවා.කුරුදිප්පිට ප්‍රදේශයේ තමයි අපිට ලොකු ඉඩමක් තියෙන්නේ.සුසාන භූමියට අයිති ඉඩමේ.හෙට දවසේ අපි ඒ කටයුතු ආරම්භ කරනවා.කොට්ඨාශයේ මන්ත්‍රීතුමන්ලට ඒ බව දැනුම් දෙනවා.ඒ වගේම පල්ලේගොඩ අක්කර **04**ක ඉඩමක් තියෙනවා.දැන් සිකුරාදා දිනයේ ඉඳලා රජයේ නිලධාරීන්ට නිවාඩු දීලා තියෙනවා වගා කටයුතු සඳහා යොමු වෙන්න.ඒ සඳහා අපි සභාවෙන් තව දවසක් දීලා හරි වගා කටයුතු සඳහා අවතීර්ණ වෙමු.අපි වැලිපැන්න ප්‍රදේශයේ එළවළු කොටුවක් කර ගෙන යනවා.ඒක ප්‍රමාණවත් නෑ.තව අපි බීජ ගෙනත් තියෙනවා.අපි යෝජනා කර ගත්තා බීජ ඇට තවාන් කරන්න.පස් ,පැලට් අපි ගෙනත් දෙනවා.පැකට් අපි පොලිතීන් කරා.මන්ත්‍රීවරුන්ට පැල **50**ක් හෝ**100** ක් දෙන්නම්.අපිම හිටවලා දෙන්නම්.මුලින් මේක කරන්න.ගමේ අයව සම්බන්ධ කරගෙන කරන්න.මේ සම්බන්ධව තමයි මන්ත්‍රීතුමා අහලා තියෙන්නේ.අපේ සභාවේ අයවැය මඟින් වෙනත් ශීර්ෂය යටතේ වෙන් කරලා තියෙන මුදල් මේ වගා කටයුතු සඳහා යොදවන්න පුළුවන්.ඒ බව දැනුම් දෙනවා.මේක එක සැලසුමක්.අනෙත් එක තමයි අපි අලෙවිසැල් හදන්න වැඩ සටහනක් තියෙනවා.උප සභාපතිතුමාගේ ස්ථානයක් තියෙනවා.කමිල් මන්ත්‍රීතුමාගේ ස්ථානයක් තියෙනවා.අපි නගරයේ තැන් කිහිපයක අලෙවිසැල් හදනවා.ඔබතුමන්ලාගේ නිෂ්පාදන ගෙනල්ලා දෙන්න.ඒ වගේම කසළ කළමණාකරණය කරන්න, ප්‍රතිචක්‍රීකරණය කල හැකි දේවල් වලින්. ඒකෙන් ආර්ථිකය දියුණු කර ගන්න බලාපොරොත්තු වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

වගා කරනවා කිව්වට අපේ ප්‍රදේශවල හැමදේම හරියන්නේ නෑ.මම යෝජනාවක් කරනවා.සුරේශ් මන්ත්‍රීතුමාත් මේ සමබන්ධව යෝජනාවක් කරලා තිබුණා.ඒකටම මමත් මේ යෝජනාව කරන්නම්.බෝපිටිය පැත්තේ තියෙනවා අක්කර 05ක, 10ක පමණ හොඳ සශ්‍රීක ඉඩමක්.අපි සභාව මැදිහත් වෙලා අරගෙන,මන්ත්‍රීවරුන්ගේ මාසික දීමනාව හරි දාලා ශුද්ධ කරලා,ගමේ දුප්පත් අයට කොටස් බෙදලා දීලා මඤ්ෙඤාක්කා වගාවක් කරමු කියලා මම යෝජනා කරනවා.අමු මිරිස්,බණ්ඩක්කා,වම්බටු වගේ ඒවට විශාල මුදලක් වියදම් කරාට බොහෝම කෙටි කාලයයි.ගෙදර අවශ්‍යතාවයවත් සම්පූනර් කරගන්න බෑ. මම කියන්නේ ඒ වියදම් කරන සල්ලි වගා කරන්න පුළුවන් දිස්ත්‍රික්කවලට යොදවන්න කියලා.අපිට කල හැකි දේට අවධානය යොමු කරලා වැඩපිළිවෙලක් සකස් කරලා සියලු මන්ත්‍රීවරු සම්බන්ධ කරගෙන ප්‍රායෝගික වැඩපිලිවෙලකට යන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රුවන්දි තිරිමාන්න මිය

එම යෝජනාවට පක්ෂව අදහස් පල කරනවා.වෙන්දේසි ඉඩම්වල සභාව සතු කොටස් තියෙනවා.රන්දිලවත්ත පචර්ස් 20ක් තියෙනවා.වැලිමානාන පචර්ස් 10 ක් තියෙනවා.ඊට අමතරව LRC ඉඩමක් තියෙනවා හේනේගම සහා පුස්තකාලය පිටිපස්සේ .ඒ වගේ ඉඩම් අරගෙන ප්‍රදේශවාසීන්ට වෙන් කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
හේනේගම ඉඩම කිතුල් වගාවට දීලා තියෙන්නේ.

**06.** යථා පරිදි කල් දී ඇති යෝජනා -:

**6.1** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා -:

**6.1.1** **2018.04.10** දින මහ සභාවේ **5.1.8** යෝජනා සම්මුතිය අනුව ආවරණ අනුමැතියට යටත්ව මා වෙත පැවරී ඇති බලතල අනුව **2022.04.01** දින සිට **2021.04.30** දින දක්වා, කරන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | නම | වවුචර් අංකය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|---|---|
| | 4/1/2022 | | | |
| 01 | W.D.සුනිල් ශාන්ත | 01 | 2022 පෙබරවාරි නිවාඩු දින වැටුප් (ආදායම් පරීක්ෂක) | 4905.32 |
| 02 | D.S.M.කුමාරසිංහ | 02 | 2022 ජනවාරි,පෙබරවාරි අතිකාල දීමනා (ක.සේ.නි. ) | 6594.14 |
| 03 | W.J.උදයංග | 03 | සංවධර්න නිළධාරි 2022 ජනවාරි,පෙබරවාරි අතිකාල දීමනා | 10283.33 |
| 04 | R.M.සන්දනායක | 04 | ප්‍රධාන කළමණාකරණ සේවා නිළධාරි රාජකාරි ගමන් වියදම් | 1600.00 |
| 05 | U.S.මුණසිංහ | 05 | සංවධර්න නිළධාරි රාජකාරි ගමන් වියදම් | 3500.00 |
| 06 | අජර්න කිරිඇල්ල | 06 | තණකොළ කපන යන්ත්‍ර සඳහා නූල් KG 13 x 1800 ලබා ගැනීමට අත්තිකාරම් | 23400.00 |
| 07 | ගයාන් මධුසංඛ | 07 | රාජකාරි ගමන් වියදම් | 2100.00 |
| 08 | P.A.D.V.C.ගුණතිලක | 08 | ගල්මත්ත පොළ භූමියේ ළිඳ ඉසීම සඳහා කුලී පදනමට ජල මෝටරයක් ගැනීම | 650.00 |
| 09 | මුදල් භාරකරු | 09 | සංවධර්න නිළධාරි දෙදනෙකු සඳහා 2022 ජනවාරි සිට මාතර්‍ු 31 දක්වා වැටුප් ගෙවීම | 223313.24 |
| 10 | මුදල් භාරකරු | 10 | 2022 මාතර්‍ු සැලසුම් කමිටු දීමනා | 30000.00 |
| 11 | සාලිය මෝටසර් | 11 | L J 6098 ටිපර් රථයේ ඩීසල් ටැංකිය පැස්සීම හා පිල්ටරය ශුද්ධ කිරීම | 6800.00 |
| 12 | අරුණ රබර් කම්පැණි | 12 | කොස්ගහකන්ද පෙර පාසැල සඳහා 1*1 බොක්ස් බාර් 3 ක් මිලදී ගැනීම | 7500.00 |
| 13 | P.V.කපිල | 13 | කොස්ගහකන්ද පෙර පාසලට ජලය සැපයීමට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීම | 10709.00 |

| | | | | |
|---|---|---|---|---|
| 14 | සඳුන් ටෙක්ස්ටයිල්ස් | 14 | සෞඛ්‍ය අංශයේ කාන්තා නිල ඇඳුම් සඳහා චීත්ත රෙදි 8 ක් මිලදී ගැනීම | 4200.00 |
| 15 | අගලවත්ත මෝටසර් | 15 | RF 1964 ට්‍රැක්ටරයට පැන් බෙල්ට් 1ක් දැමීම | 2190.00 |
| 16 | නාමල් හාඩ්වෙයාර් | 16 | 5m ස්ටීල් ටේප් 1 ක් මිලදී ගැනීම | 430.00 |
| | 4/4/2022 | | | |
| 17 | ගුණවර්ධන ගරාජ් | 17 | ABU 3966 ත්‍රී රෝද රථය සේවා කිරීම | 8100.00 |
| 18 | ගුණවර්ධන ගරාජ් | 18 | QQ 1984 ත්‍රී රෝද රථය සේවා කිරීම | 5550.00 |
| 19 | I.B.සුසන්ත | 19 | ZA 2657 JCB යන්ත්‍රයට අඩි 5 හෝස් 1 ක් ගැනීම | 5750.00 |
| 20 | ජයසිරි එන්ටප්‍රයිසස් | 20 | ගල්මත්ත උප කායර්ාලයේ තණකොළ කපන යන්ත්‍රය සඳහා අවශ්‍ය උපාංග මිලදී ගැනීම | 4800.00 |
| 21 | ජයසිරි එන්ටප්‍රයිසස් | 21 | යටදොල උප කායර්ාලයේ තණකොළ කපන යන්ත්‍ර 2 අළුත්වැඩියාව හා උපාංග මිලදී ගැනීම | 13930.00 |
| 22 | ඩිපෝ ඉංජිනේරු අළුත්ගම ලං.ග.ම ඩිපෝව | 22 | LJ 9413 ටිපර් රථයේ ඉංජිනේරු වාතර්ාව ලබා ගැනීම | 4000.00 |
| 23 | P.S.K.සවර්ස් සෙන්ටර් | 23 | LL 7571 කෘ කැබ් රථය සේවා කිරීම | 16605.00 |
| 24 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 24 | RB 2269 ට්‍රැක්ටරය අළුත්වැඩියාව | 3800.00 |
| 25 | අගලවත්ත මෝටසර් | 25 | RS1956 ට්‍රැක්ටරයට ඔයිල් ෆිල්ටර් දැමීම | 1450.00 |
| 26 | ජයලත් එන්ටප්‍රයිසස් | 26 | ඉන්ධන බිල්පත් ගෙවීම ඇමුණුම 01 | 183744.00 |
| | 4/5/2022 | | | |
| 27 | A.D.ශ්‍යාමල් චින්තක | 27 | ප්‍රධාන කායර්ාලයේ වතුර ෆිල්ටරය අළුත්වැඩියාව | 6500.00 |
| 28 | සී/ස වි.සේ.ස සමිතිය මතුගම | 28 | ඉන්ධන ලබා ගැනීම ඇමුණුම 02 | 61010.24 |
| 29 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 29 | RF 1056 ජල බවුසරය අළුත්වැඩියාව | 4800.00 |
| 30 | ගුණවර්ධන ගරාජ් | 30 | ABU 3964 ත්‍රී රෝද රථය සේවා කිරීම | 9300.00 |
| 31 | I.B.සුසන්ත | 31 | ZA 0452 JCB යන්ත්‍රය හෝස් එක අළුත්වැඩියාව | 2600.00 |
| | 4/6/2022 | | | |
| 32 | M.D.I.P.සමරසේකර | 32 | යටදොල ක්‍රීඩාපිටිය වෙන් කිරීමේ ඇප තැන්පත් ආපසු ගෙවීම | 3000.00 |
| 33 | ලලිත් ජයසුන්දර | 33 | යටදොල ක්‍රීඩාපිටිය වෙන් කිරීමේ ඇප තැන්පත් ආපසු ගෙවීම | 4000.00 |
| 34 | මුදල් භාරකරු | 34 | 2022 මාතෘ දෛනික වැටුප් හොරවල උප කායර්ාලය | 80825.09 |
| 35 | මුදල් භාරකරු | 35 | 2022 පෙබරවාරි ව්‍යාපෘති වැටුප් හොරවල උප කායර්ාලය | 22151.88 |
| 36 | මුදල් භාරකරු | 36 | 2022 ජනවාරි ව්‍යාපෘති වැටුප් හොරවල උප කායර්ාලය | 8614.62 |
| 37 | මුදල් භාරකරු | 37 | 2022 මාතෘ ව්‍යාපෘති වැටුප් හොරවල උප කායර්ාලය | 206750.88 |

| | | | | |
|---|---|---|---|---|
| 38 | මුදල් භාරකරු | 38 | 2022 මාතර්ු ව්‍යාපෘති වැටුප් වැලිපැන්න උප කායර්ාලය | 65224.98 |
| 39 | මුදල් භාරකරු | 39 | 2022 මාතර්ු දෛනික වැටුප් වැලිපැන්න උප කායර්ාලය | 99899.41 |
| 40 | මුදල් භාරකරු | 40 | 2022 පෙබරවාරි ව්‍යාපෘති වැටුප් වැලිපැන්න උප කායර්ාලය | 20921.22 |
| 41 | මුදල් භාරකරු | 41 | 2022 මාතර්ු දෛනික වැටුප් මතුගම ප්‍රධාන කායර්ාලය | 242422.07 |
| 42 | මුදල් භාරකරු | 42 | 2022 මාතර්ු ව්‍යාපෘති වැටුප් මතුගම ප්‍රධාන කායර්ාලය | 439961.15 |
| 43 | මුදල් භාරකරු | 43 | 2022 මාතර්ු ආදාහනාගාර වැඩසටහන වැටුප් | 27074.52 |
| 44 | මුදල් භාරකරු | 44 | 2022 මාතර්ු ඩෙංගු මදර්න වැඩසටහන වැටුප් | 290435.96 |
| 45 | මුදල් භාරකරු | 45 | 2022 මාතර්ු විෂබීජහරණ වැඩසටහන වැටුප් | 169831.28 |
| 46 | අරුණ බුද්ධික ජිනදාස | 46 | ZA 6204 හා LL 7050 දරණ වාහන යෝග්‍යතා සහතික ලබා ගැනීම සඳහා අත්තිකාරම් | 14960.00 |
| 47 | C.P.මුණසිංහ | 47 | රාජකාරි ගමන් වියදම් | 700.00 |
| 48 | M.K.කළුතරගේ | 48 | රාජකාරි ගමන් වියදම් | 700.00 |
| 49 | T.D.අජිත් කුමාර | 49 | දෛනික කම්කරු 2022 ජනවාරි අතිකාල දීමනා | 1266.60 |
| 50 | T.D.අජිත් කුමාර | 50 | දෛනික කම්කරු 2022 පෙබරවාරි අතිකාල දීමනා | 3588.70 |
| 51 | J.K.සරත් | 51 | ක්ෂේත්‍ර කම්කරු 2022 පෙබරවාරි අතිකාල දීමනා | 794.39 |
| 52 | S.K.අතුකෝරළ | 52 | දෛනික රියදුරු 2022 ජනවාරි අතිකාල දීමනා | 1347.15 |
| 53 | S.K.අතුකෝරළ | 53 | දෛනික රියදුරු 2022 පෙබරවාරි අතිකාල දීමනා | 3233.16 |
| 54 | Y.K.දමිත් නිශාන්ත | 54 | දෛනික රියදුරු 2022 පෙබරවාරි අතිකාල දීමනා | 2065.63 |
| 55 | D.H.ජයන්ත | 55 | දෛනික කම්කරු 2022 ජනවාරි අතිකාල දීමනා | 1477.76 |
| 56 | D.H.ජයන්ත | 56 | දෛනික කම්කරු 2022 පෙබරවාරි අතිකාල දීමනා | 3694.25 |
| 57 | M.G.ප්‍රදීප් කුමාර | 57 | රියදුරු 2022 ජනවාරි,පෙබරවාරි අතිකාල දීමනා | 5606.82 |
| 58 | මුදල් භාරකරු | 58 | H.G.N.තනූජා ඇතුළු 05 ක් සඳහා රාජකාරි දීමනා | 650.00 |
| 59 | නන්දසේන ලියනගේ | 59 | 2022 මාතර්ු මහජන සම්බන්ධතා නිළධාරි දීමනා | 14000.00 |
| 60 | සභාපති මතුගම ප්‍රා.සභාව | 60 | විශ්‍රාම වැටුප් දෙපාතර්මේන්තුව විසින් උපුල් ශාන්ත මයාගේ පාරිශෝෂික මුදලින් අය කර එවන ලද ආපදා ණය ශේෂය සේවක ණය ගිණුමට බැර කිරීම | 177024.00 |
| 61 | සභාපති මතුගම ප්‍රා.සභාව | 61 | විශ්‍රාම වැටුප් දෙපාතර්මේන්තුව විසින් W.N.හේමවතී මියගේ පාරිශෝෂික මුදලින් අය කර එවන ලද ආපදා ණය ශේෂය සේවක ණය ගිණුමට බැර කිරීම | 89627.01 |
| 62 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 62 | විදුලි අංශයේ සේවකයන් රක්ෂණය කිරීම | 61145.39 |

| | | | | |
|---|---|---|---|---|
| 63 | ෆැමිලි එන්ටප්‍රයිසස් | 63 | ආදාහනාගාරය සඳහා 37 ½ ලාෆ් ගෑස් සිලින්ඩර් 14 ක් මිලදී ගැනීම 12308 x 14 | 172312.00 |
| 64 | G.D.මලිත් ඩිල්ෂාන් | 64 | පුවත්පත් බිල්පත් (2022 පෙබරවාරි) | 7930.00 |
| 65 | A.C.F.සහිරා | 65 | මීගම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල්පත් 2022 ජනවාරි,පෙබරවාරි | 9640.00 |
| 66 | H.D.K.B.D ද අල්විස් | 66 | ගල්මත්ත මහජන පුස්තකාලයේ පුවත්පත් බිල්පත් 2022 පෙබරවාරි | 9270.00 |
| 67 | ඇතුලත්මුදලිගම ප්‍රජා සහයෝගිතා සමිතිය | 67 | කොම්පෝසට් අංගනයට ජලය සැපයීම 2021.12.30 - 2022.01.30 දක්වා | 15500.00 |
| 68 | අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය | 68 | කොම්පෝසට් අංගනයේ පරිසර බල පත්‍ර ලබා ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු | 7080.00 |
| 69 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 69 | JG 4546 ට්‍රැක්ටරය අළුත්වැඩියාව | 28100.00 |
| 70 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 70 | RD 6657 ට්‍රැක්ටරය අළුත්වැඩියාව | 29200.00 |
| 71 | සතොස මෝටසර් p.L.C. | 71 | LM 5610 කම්පැක්ටරය පැති කණ්ණාඩිය මිලදී ගැනීම | 13030.00 |
| 72 | N.W.නානායක්කාර | 72 | වාහන සඳහා ඔයිල් ලීටර 20 ලබා ගැනීම | 14400.00 |
| 73 | ලංකා පිරවුම්හල - යටදොලවත්ත | 73 | ඉන්ධන බිල්පත් ගෙවීම ඇමුණුම 03 | 89680.00 |
| 74 | කායර්භාර නිළධාරි හොරවල උප කායර්ාලය | 74 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූණර්ය | 1824.00 |
| 75 | කායර්භාර නිළධාරි හොරවල උප කායර්ාලය | 75 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූණර්ය | 2970.00 |
| 76 | මුදල් භාරකරු | 76 | J.D.ප්‍රභාත් කුමාර ක්ෂේත්‍ර කම්කරු අනතුරු රක්ෂණ වන්දි මුදල ගෙවීම | 9006.50 |
| 77 | කායර්භාර නිළධාරි වැලිපැන්න උප කායර්ාලය | 77 | සංග්‍රහ වියදම් ප්‍රතිපූණර්ය | 1000.00 |
| 78 | W.D.සුනිල් ශාන්ත | 78 | ආදායම් පරීක්ෂක 2022 මාතර්ු නිවාඩු දින වැටුප් | 4523.33 |
| 79 | මුදල් භාරකරු | 82 | මෙරිල් මුණසිංහ ඇතුළු 34 ක් සඳහා 2022 අප්‍රේල් මස සභික දීමනා ගෙවීම | 525000.00 |
| 80 | මුදල් භාරකරු | 83 | මෙරිල් මුණසිංහ ඇතුළු 34 ක් සඳහා 2022 මාතර්ු මස සභික ගමන් වියදම් | 85000.00 |
| 81 | K.K.D.R.සංජීව (ප්‍රජා සංවධර්න නිළධාරි) | 84 | අවුරුදු විශේෂ පොල කසල ඉවත් කිරීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 60000.00 |
| 82 | N.S.T.N.විරාජිනි | 85 | සෞඛ්‍ය අංශය සඳහා විෂබීජනාශක ද්‍රව්‍ය මිලදී ගැනීම | 19100.00 |
| 83 | ෆැමිලි එන්ටප්‍රයිසස් | 86 | ආදාහනාගාරය සඳහා ලාෆ් ගෑස් සිලින්ඩර් 20 ක් මිලදී ගැනීම 13258 x 20 | 265160.00 |

| | | | | |
|---|---|---|---|---|
| 84 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 87 | ZA 6204 බොබ්කැට් යන්ත්‍රය රක්ෂණය කිරීම 2022.04.06 - 2023.04.06 | 3356.19 |
| 85 | නාමල් හාඩ්වෙයාර් | 88 | හෝරාස්ථම්භයේ බෞද්ධ කොඩි අළුත්වැඩියාව සඳහා කනෙක්ටර් බාර් 4ක් මිලදී ගැනීම ( 2022 මාතර්) | 1280.00 |
| 86 | N.S.T.N.විරාජිනි | 89 | 16W LED බල්බ් 400ක් මිලදී ගැනීම | 372000.00 |
| 87 | I.S.තරංග | 90 | 2018.01.02 සිට 2022.01.31 දක්වා වැටුප් වර්ධක හිඟ මුදල් ගෙවීම | 48804.55 |
| 88 | S.D.ගුණවර්ධන | 91 | තැන්පත් ආපසු ගෙවීම | 3000.00 |
| | 4/8/2022 | | | |
| 89 | P.මංගලිකා දමයන්ති | 92 | කළමණාකරණ සේවා නිළධාරි 2022 මාතර් අතිකාල දීමනා | 9585.41 |
| 90 | P.මංගලිකා දමයන්ති | 93 | කළමණාකරණ සේවා නිළධාරි 2022 පෙබරවාරි අතිකාල දීමනා | 8818.58 |
| 91 | M.A.P.S.K.කුලරත්න | 94 | කළමණාකරණ සේවා නිළධාරි 2022 මාතර් අතිකාල දීමනා | 6140.87 |
| 92 | H.W.D.නීල් ප්‍රසන්න | 95 | කළමණාකරණ සේවා නිළධාරි 2022 මාතර් අතිකාල දීමනා | 3970.47 |
| 93 | U.K.D.සුමිත් | 96 | කා.කා.ස. 2022 මාතර් අතිකාල දීමනා | 14437.21 |
| 94 | සමන් ජානක | 97 | රියදුරු 2022 මාතර් අතිකාල දීමනා | 13560.92 |
| 95 | R.M.සන්දනායක | 98 | කළමණාකරණ සේවා නිළධාරි 2022 මාතර් අතිකාල දීමනා | 14236.00 |
| 96 | K.A.සරත් | 99 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 4310.88 |
| 97 | M.A.සේනාරත්න | 100 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 7863.62 |
| 98 | A.K.කරුණාලාල් | 101 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 16269.93 |
| 99 | M.D.T.P.De අල්විස් | 102 | කළමණාකරණ සේවා නිළධාරි 2022 මාතර් අතිකාල දීමනා | 9447.91 |
| 100 | A.ජානක රුවන් | 103 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 6932.88 |
| 101 | M.A.දමිත් මලවරආරච්චි | 104 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 4291.65 |
| 102 | රංජිත් වීරසිරි | 105 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 7485.94 |
| 103 | රංජිත් වීරසිරි | 106 | ක්ෂේත්‍ර කම්කරු 2022 පෙබරවාරි අතිකාල දීමනා | 6355.14 |
| 104 | ප්‍රගීත් ඉන්දික | 107 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 1388.88 |
| 105 | N.Dඅජිත් | 108 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 2183.22 |
| 106 | P.A.D.V.C.ගුණතිලක | 109 | කළමණාකරණ සේවා නිළධාරි 2022 මාතර් අතිකාල දීමනා | 2169.44 |
| 107 | K.V.අරුණ ශාන්ත | 110 | මුරකරු 2022 මාතර් අතිකාල දීමනා | 7221.75 |
| 108 | H.S.ඩිලාන් | 111 | ශ්‍රවණාගාර පාලක 2022 මාතර් අතිකාල දීමනා | 5611.20 |
| 109 | G.චන්දන පුෂ්පකුමාර | 112 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 9537.00 |
| 110 | රන්දික නදීෂාන් | 113 | පො.වෙ.පො.භාරකරු 2022 මාතර් අතිකාල දීමනා | 8533.20 |
| 111 | C.P.මුණසිංහ | 114 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර් අතිකාල දීමනා | 2022.09 |

| | | | | |
|---|---|---|---|---|
| 112 | E.A.කසුන් | 115 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 11222.40 |
| 113 | S.A.D.රංගජීව | 116 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 9629.00 |
| 114 | බී.කේ. සුරාජ් | 117 | රියදුරු 2022 මාතර්ු අතිකාල දීමනා | 8177.16 |
| 115 | නුවන් චානක | 118 | යන්ත්‍ර ක්‍රියාකරු 2022 මාතර්ු අතිකාල දීමනා | 1421.64 |
| 116 | නුවන් චානක | 119 | යන්ත්‍ර ක්‍රියාකරු 2022 පෙබරවාරි අතිකාල දීමනා | 1928.69 |
| 117 | ඩී.එල්. ජයතුංග | 120 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 8940.36 |
| 118 | L.A ගාමිණී | 121 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 13771.08 |
| 119 | B.S.සුනේන්ද්‍ර | 122 | සෞඛ්‍ය කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 10985.86 |
| 120 | නිරංග පුෂ්පකුමාර | 123 | ආදාහනාගාර ක්‍රියාකරු සහයක 2022 මාතර්ු අතිකාල දීමනා | 4768.50 |
| 121 | D.S.ගුණරත්න | 124 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 9629.00 |
| 122 | යූ.ජී. බුද්ධදාස | 125 | ක්ෂේත්‍ර කම්කරු 2022 මාතර්ු අතිකාල දීමනා | 2214.67 |
| 123 | ජයන්ත ද සිල්වා | 126 | ආදාහනාගාර ක්‍රියාකරු 2022 මාතර්ු අතිකාල දීමනා | 8984.52 |
| 124 | S.M.අයෝනා | 127 | කා.කා.ස. 2022 මාතර්ු අතිකාල දීමනා | 6008.32 |
| 125 | චමිලා ගුණවර්ධන | 128 | කළමණාකරණ සේවා නිළධාරි 2022 මාතර්ු අතිකාල දීමනා | 1870.74 |
| 126 | E.M.N.C.සෙනෙවිරත්න | 129 | මුරකරු 2022 මාතර්ු අතිකාල දීමනා | 5949.72 |
| 127 | E.M.N.C.සෙනෙවිරත්න | 130 | මුරකරු 2022 පෙබරවාරි අතිකාල දීමනා | 7366.32 |
| 128 | සංජය එරික් ලසන්ත | 131 | මුරකරු 2022 මාතර්ු අතිකාල දීමනා | 10893.54 |
| 129 | H.W.D.ඉන්දිකා ප්‍රියදශර්නී | 132 | කා.කා.ස. 2022 මාතර්ු අතිකාල දීමනා | 4647.01 |
| 130 | W.A.M.I.S.තෙන්නකෝන් | 133 | 2022 මාතර්ු නිවාඩු දින වැටුප් | 10677.50 |
| 131 | R.P.වරුණ ඉෂාන්ත | 134 | සෞඛ්‍ය පරිපාලක 2022 මාතර්ු නිවාඩු දින වැටුප් | 4923.33 |
| 132 | W.D.සුනිල් ශාන්ත | 135 | ආදායම් පරීක්ෂක 2022 මාතර්ු නිවාඩු දින වැටුප් | 6131.65 |
| 133 | D.D.චරිත් බුද්ධික | 136 | ක්ෂේත්‍ර පරිපාලක 2022 මාතර්ු නිවාඩු දින වැටුප් | 1244.00 |
| | 4/19/2022 | | | |
| 134 | බෙන්කෙම් හෝල්ඩින්ස් | 137 | කමර්ාන්ත අංශය සඳහා 80/100 තාර බැරල් 10ක් මිලදී ගැනීම | 340000.00 |
| | 4/20/2022 | | | |
| 135 | I.B.සුසන්ත | 138 | ZA 2657 JCB යන්ත්‍රයේ හයිඩ්‍රොලික් හෝස් එක අළුත්වැඩියාව | 1800.00 |
| 136 | විතාන ඉන්ඩස්ට්‍රීස් | 139 | ZA 2657 JCB යන්ත්‍රයට අළුතින් බකට් එකට දත් ගැසීම | 20000.00 |
| 137 | සිංහ සොලූෂන්ස් | 140 | බෝපිටිය සොල්දොර කඩෙහි වේල්ල සඳහා 2 x 4 හියුම් පයිප්ප 2ක් ගැනීම | 9600.00 |
| 138 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 141 | දුරකථන ජාල බිල්පත් ගෙවීම (2022.02.01 - 2022.02.28 දක්වා) | 26834.66 |

| | | | | |
|---|---|---|---|---|
| 139 | මොබිටෙල් ලංකා පුද්ගලික සමාගම | 142 | ESMS සේවා ගාස්තු ( 2021.11.24 - 2022.02.24) | 183.90 |
| 140 | ඩයලොග් පුද්ගලික සමාගම | 143 | පුස්තකාලවලට සපයා ඇති ඩයලොග් ටී.වී බිල්පත් ගෙවීම | 4745.43 |
| 141 | ලක්වින් එන්ටප්‍රයිසස් | 144 | නවක සංවර්ධන නිළධාරීන්ගේ රාජකාරී හැඳුනුම්පත් සකස් කිරීමට අවශ්‍ය උපකරණ ලබා ගැනීම | 1800.00 |
| 142 | ඉන්ෆොබිට් ලංකා | 145 | ගිණුම් අංශයේ පරිගණක සඳහා උපාංග ලබා ගැනීම | 9800.00 |
| 143 | M .K. රුවන් කුමාර | 146 | 22 අප්‍රේල් මහ සභා වාතර්ාවේ මුල්පිට කවරය මුද්‍රණය කිරීම | 1750.00 |
| 144 | කල්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 147 | සභා වාතර්ාවට A x 3 පැකට් 5ක් මිලදී ගැනීම (GSM 70) | 12720.00 |
| 145 | කල්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 148 | ගබඩාවට ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම | 97095.00 |
| 146 | E.රසාදරි හංසිකා | 149 | අභ්‍යාසලාභී පුහුණු දීමනා ගෙවීම. 2022 පෙබරවාරි,මාතර්ු 500 x 26 | 13000.00 |
| 147 | R.P.වරුණ ඉෂාන්ත | 150 | සෞඛ්‍ය පරිපාලක පරිවතර්ීත ගමන් වියදම් 2022 මාතර්ු | 1500.00 |
| | 4/22/2022 | | | |
| 148 | A.B.ජිනදාස | 151 | වාහන බලපත්‍ර සඳහා ලබාගත් අත්තිකාරම් පියවීම | 14960.00 |
| 149 | A.I.කබීර් | 152 | 22 මාතර්ු මතුගම මහජන පුස්තකාලයට ලබාගත් දෙමළ පුවත්පත් සඳහා ගාස්තු | 1130.00 |
| 150 | D.C.සුරේස් ලක්මාල් | 153 | 23 මාතර්ු මතුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම | 13650.00 |
| 151 | N.ප්‍රේමරත්න | 154 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය 2022.02.25-2022.03.24 දක්වා | 492.88 |
| 152 | K.V.N.D.සිල්වා | 155 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය 2022.01.25-2022.02.24 දක්වා | 1777.70 |
| 153 | M.H.ගුණසිරි | 156 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය 2022.01.01-2022.02.28 දක්වා | 5000.00 |
| 154 | S.D.ජයසිංහ | 157 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය 2022.03.01-2022.03.31 දක්වා | 2379.36 |
| 155 | D.N.විජේසිංහ | 158 | සභික දුරකථන බිල්පත් ප්‍රතිපූණර්ය 2022.01.06-2022.02.05 දක්වා | 2500.00 |
| 156 | P.S.K.සවරීස් සෙන්ටර් | 159 | LM 5610 කම්පැක්ටරය සේවා කිරීම | 55295.00 |
| 157 | M.W.නානායක්කාර | 160 | හයිඩ්‍රොලික් ඔයිල් 20L ක් මිලදී ගැනීම | 17000.00 |
| 158 | ලංකා පිරවුම්හල - යටදොලවත්ත | 161 | ඉන්ධන බිල්පත් ඇමුණුම 04 | 67909.00 |

| | | | | |
|---|---|---|---|---|
| 159 | N.S.T.N.විරාජිනි | 162 | මතුගම පොළ භූමිය විදුලි සැපයුම සඳහා අකුණු සන්නායකයක් මිලදී ගැනීම | 6500.00 |
| | 4/25/2022 | | | |
| 160 | සඳසිරිගම ග්‍රාම සංවධර්න සමිතිය | 163 | සඳසිරිගම හරස් මාගර්ය කඳු බෑවුම සංවධර්නය කිරීම අවසන් ගෙවීම | 449108.77 |
| 161 | අජර්ුන කිරිඇල්ල | 164 | 2022 අප්‍රේල් මහ සභා සංග්‍රහ අත්තිකාරම් | 24700.00 |
| 162 | W.A.සුනිල් ප්‍රසන්න | 165 | ආදායම් පරීක්ෂක 2022 මාතර්ු පරිවතරීත ගමන් වියදම් | 1500.00 |
| 163 | W.A.සුනිල් ප්‍රසන්න | 166 | ආදායම් පරීක්ෂක 2022 පෙබරවාරි පරිවතරීත ගමන් වියදම් | 1455.00 |
| 164 | වි.සේ.ස සමිතිය මතුගම | 167 | ඉන්ධන බිල්පත් ගෙවීම ( ඇමුණුම 05 ) | 73585.36 |
| | 4/26/2022 | | | |
| 165 | D.R.ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම | 168 | නවක සංවධර්න නිළධාරීන් සඳහා මේස හා පුටු මිලදී ගැනීම ( මේස 05 ක් හා පුටු 05 ක්) | 218812.50 |
| | 4/29/2022 | | | |
| 166 | P.V.කපිල | 169 | ජල ටැංකිය අසල නාන කාමරයේ ජල සැපයුම අළුත්වැඩියාව සඳහා ද්‍රව්‍ය ලබා ගැනීම | 5180.00 |
| 167 | P.V.කපිල | 170 | මාගර් අංශයට විල්බැරෝ 1ක් හා සවල් 1ක් මිලදී ගැනීම | 9750.00 |
| 168 | P.V.කපිල | 171 | ආදාහනාගාරය දොර අළුත්වැඩියා කිරීම සඳහා ද්‍රව්‍ය ලබා ගැනීම | 1825.00 |
| 169 | ජලසම්පාදන මණ්ඩලය | 172 | ජල බිල්පත් පියවීම (2021.12.11 - 2022.02.15 දක්වා ) | 5259.43 |
| 170 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 173 | දූරකථන ජාල බිල්පත් පියවීම ( 2022.03.01 - 2022.03.31 දක්වා) | 27182.26 |
| 171 | ජෙනරල් ඇන්ඩ් මෝටර් ට්‍රේඩසර් | 174 | හෝරාස්ථම්භය සඳහා බැටරි 1ක් මිලදී ගැනීම | 8500.00 |
| 172 | K.K.D.R.සංජීව | 175 | 2022 සාහිත්‍ය උත්සවය සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 15000.00 |
| 173 | M.D.N.ශාන්ත | 176 | රියදුරු **2022** පෙබරවාරි අතිකාල දීමනා | 4407.93 |
| 174 | M.D.N.ශාන්ත | 177 | රියදුරු **2022** මාතර්ු අතිකාල දීමනා | 5945.58 |
| 175 | සුසන්ත හෙට්ටිආරච්චි | 178 | ක්ෂේත්‍ර කම්කරු **2022** මාතර්ු අතිකාල දීමනා | 7480.80 |
| 176 | මතුගම වි.සේ.ස සමිතිය | 179 | ඉන්ධන බිල්පත් ගෙවීම( සෞ.වෛද්‍ය නි. කායර්ාලයට පෙට්‍රල් ලීටර් 8 ක් ගැනීම) | 2704.00 |
| 177 | මතුගම වි.සේ.ස සමිතිය | 180 | ඉන්ධන බිල්පත් ගෙවීම ( LL 7571 කෘ කැබ් රථයට ඩීසල් ලීටර් 53 ක් හා ZA 0452 ජේ.සී.බී යන්ත්‍රයට ඩීසල් ලීටර් 89.960 ක් ගැනීම | 41315.44 |
| 178 | ජයලත් එන්ටප්‍රයිසස් | 181 | ඉන්ධන බිල්පත් ගෙවීම( JG 4546 L 38'47 | 6770.00 |

| | | | | |
|---|---|---|---|---|
| 179 | ලංකා පිරවුම්හල - යටදොලවත්ත | 182 | ඉන්ධන බිල්පත් ගෙවීම (ඇමුණුම 06 ) | 55360.00 |
| 180 | D.විශ්වජිත් | 183 | යටදොලවත්ත ක්‍රීඩාපිටිය වෙන්කිරීම් ඇපතැන්පත් ආපසු ගෙවීම | 4000.00 |
| 181 | සමන්කුමාර සෙන්දනායක | 184 | පොදුවෙළඳපළ භූමිය බෝ ගස් 2ක් කැපීම සඳහා කුලිය | 20000.00 |
| 182 | M.H.M.ඉන්ෆාස් | 185 | යටදොලවත්ත ක්‍රීඩාපිටිය වෙන් කිරීම ඇප තැන්පත් ආපසු ගෙවීම් | 4000.00 |
| | | | | |
| | සේවක ණය 2022/04/01 | | | |
| 01 | K.K.S.රත්නසිරි | 25 | 22 මාතර්ු වැටුපින් වැඩිපුර අය කරන ලද සේවක ණය මුදල ආපසු ගෙවීම | 4094.65 |
| 02 | මුදල් භාරකරු | 26 | W.A.M.I.S.තෙන්නකෝන් ඇතුළු 12 ක් සඳහා උත්සව අත්තිකාරම් | 120000.00 |
| 03 | W.D. අශේන් අංජුල | 27 | 2022 උත්සව අත්තිකාරම් | 10000.00 |
| 04 | මුදල් භාරකරු | 28 | සුජානි ශානිකා ඇතුළු 2 ක් සඳහා උත්සව අත්තිකාරම් | 20000.00 |
| | 4/6/2022 | | | |
| 05 | මුදල් භාරකරු | 29 | R.L.P.කුමාරි ඇතුළු 2 ක් සඳහා උත්සව අත්තිකාරම් | 20000.00 |
| 06 | G.A.අජිත් | 30 | ආපදා ණය | 195449.00 |
| 07 | මංජුල කුමාර කළුතරගේ | 31 | ආපදා ණය | 82789.00 |
| 08 | E.A.ඉන්දික සංජීව | 32 | ආපදා ණය | 120183.00 |
| 09 | S.I.M.N.D.M.සමරකෝන් | 33 | ආපදා ණය | 250000.00 |
| 10 | M.M.D.ප්‍රමෝදා ලක්මිණි | 34 | ආපදා ණය | 250000.00 |
| 11 | C.P.මුණසිංහ | 35 | ආපදා ණය | 48920.00 |
| 12 | W.A.සුනිල් ප්‍රසන්න | 36 | ආපදා ණය | 68387.00 |
| 13 | A.L.චම්පිකා දමයන්ති | 37 | ආපදා ණය | 134712.00 |
| 14 | G.ප්‍රදීප් කුමාර | 38 | පාපැදි ණය | 6000.00 |
| 15 | G.චන්දන පුෂ්පකුමාර | 39 | පාපැදි ණය | 6000.00 |
| 16 | U.L.T.A.ගුණසිංහ | 40 | පාපැදි ණය | 6000.00 |
| 17 | U.K.ලක්ෂ්මන් දේවප්‍රිය | 41 | පාපැදි ණය | 6000.00 |
| | 4/18/2022 | | | |
| 18 | K.K.R.රාජිනිකා | 42 | පාපැදි ණය | 6000.00 |
| 19 | W.W.G.L.ප්‍රනාන්දු | 43 | පාපැදි ණය | 6000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | කමර්ාන්ත | | | |
| | 4/25/2022 | | | |
| 01 | 805 මතුගම නැගෙනහිර එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය | 07 | සාමකන්ද හරහා පෙත්තකන්ද පාර සංවර්ධනය කිරීම අතරුදවුම් මුදල් ගෙවීම | 49165.27 |
| | 4/29/2022 | | | |
| 02 | ලෙව්වන්දුව එක්සත් ප්‍රජා මණ්ඩලය | 08 | මූණමල්වත්ත නාන තොටුපළ හා මූණමල්වත්ත විහාර පාර සංවර්ධනය කිරීම අවසන් ගෙවීම | 1304728.06 |
| 03 | ලෙව්වන්දුව එක්සත් ප්‍රජා මණ්ඩලය | 09 | දූවවත්ත පාර සංවර්ධනය කිරීම අවසන් ගෙවීම | 894280.09 |

**6.1.2** පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/21/PRO/P18/2020 හා 2021.03.09 දිනැති ලිපිය මගින් සභාවේ අළුතින් ආරම්භ කිරීමට නියමිත නාරවිල,කොස්ගහකන්ද හා දිප්පිට පෙර පාසැල් තුනට හා කෝපිවත්ත පෙර පාසැලට ව්‍යාපෘති පදනම මත පෙර පාසැල් ගුරුවරුන් තිදෙනෙකු හා පෙර පාසැල් ගුරු සහායකයින් 05 දෙනෙකු කොරෝනා වසංගතය අවසානයේ පෙර පාසැල් ආරම්භ වූවාට පසු බඳවා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2021 ඔක්තෝබර් මස නාරවිල පෙර පාසැලද, 2022 ජනවාරි මස කොස්ගහකන්ද පෙර පාසැලද, 2022 පෙබරවාරි මස දිප්පිට පෙර පාසැලද ආරම්භ කරන ලදී.එසේ ආරම්භ කරන ලද පෙර පාසැල් 03 ට හා කෝපිවත්ත පෙර පාසැලට බඳවා ගත් අයගේ ව්‍යාපෘති සේවා කාලය 2022.06.30 වන දිනෙන් අවසන්වීමට නියමිතය. ඉදිරියටත් ඔවුන්ගේ සේවය අඛණ්ඩව යොදවා ගැනීම අත්‍යාවශ්‍ය වන බැවින් 2022.07.01 වන දින සිට 2022.12.31 දින දක්වා මාස 06 ක කාලයකට සේවා කාලය දීඝර් කර ගැනීම හා ව්‍යාපෘති වාතර්ාව අනුමත කර ගැනීම සඳහා ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
සභාපතිතුමා මේකේ මට දැන ගන්න පුළුවන්ද පෙර පාසල් ගුරුවරු කිව්වම දැනට සේවයේ ඉන්න අයද අළුතෙන් බඳවා ගත්ත අයද කියලා?

ගරු සභාපති මෙරිල් මූණසිංහ මහතා
ව්‍යාපෘති පදනම මත අරන් තියෙන්නේ. මාස තුනෙන් තුනට සේවා ගිවිසුමක් අත්සන් කරනවා.අළුතෙන් හදපු යටදොලවත්ත,කොස්ගහකන්ද,දිප්පිට,කෝපිවත්ත යන ඒවට ගත්තේ.එතකොට නාරවිල පෙර පාසල අපි සභාවට ගත්තා.ඒ ගුරුවරු ගනන මන්ත්‍රීතුමියට ලිඛිතව දෙයි.

**6.1.3**_ඩෙංගු මදුරු මර්දන ව්‍යාපෘති සේවකයින් 14 දෙනාගේ මාස 06 ක ව්‍යාපෘති සේවා කාලය 2022.08.17 දින වන විට අවසන්වීමට නියමිත බැවින්, ඩෙංගු මර්දන කටයුතු සඳහා ඉදිරියටත් ඔවුන්ගේ සේවය අඛණ්ඩව යොදවා ගැනීම අත්‍යාවශ්‍ය බැවින් 2022.08.17 දින සිට ඉදිරියට මාස 06 කින් ඔවුන්ගේ සේවා කාලය දීඝර් කර ගැනීම හා ව්‍යාපෘති

වාතර්ාව අනුමත කර ගැනීම සඳහා ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.1.4** පළාත් පාලන කොමසාරිස්ගේ අංක **LGD/21/PRO/P08/2020** හා **2021.06.21** දින දරණ ලිපියෙන් මෙම සභාවට ව්‍යාපෘති පදනම මත කසල කළමනාකරණ හා විෂබීජහරණ ව්‍යපෘති සේවකයින් **10** දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබාදී ඇත. එකී අනුමැතිය මත බඳවා ගත් සේවකයින් ගේ ව්‍යාපෘති සේවා කාලය අවසන් වීමෙන් අනතුරුව,පළාත් පාලන කොමසාරිස් ගේ අංක **LGD/2-1/කසල/කළුතර/2022** හා **2022.02.08** දිනැති ලිපිය මගින් ඔවුන්ගේ සේවා කාලය මාස **06** කින් දීසර් කර ඇත.
දීසර් කරන ලද සේවා කාලය **2021.12.27** වන දින සිට මාස **06** ක් බැවින්, **2022.06.26** වන විට ව්‍යාපෘති සේවා කාලය අවසන්වීමට නියමිත බැවින්, කසළ කළමනාකරණ කටයුතු හා විෂබීජහරණ කටයුතු ඉදිරියටත් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඔවුන් සේවයේ යොදවා ගැනීම අවශ්‍යතාවය පවතින් බැවින් **2022.06.27** වන දින සිට ඉදිරියට මාස **06** කින් සේවා කාලය දීසර් කර ගැනීම හා <u>ව්‍යාපෘති වාතර්ාව</u> අනුමත කර ගැනීම සඳහා ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

***2022.04.26** දිනැති සභා වාතර්ාවේ තීරණ අංක **6.1.10** යටතේ ඉහත කරුණ සඳහා සභා තීරණයක් ලබාගෙන අදාළ ලිපිලේඛණ සහකාර කොමසාරිස් කායර්ාලයට ඉදිරිපත් කරන ලදී. එම ආයතනයේ දැණුම් දීම පරිදි <u>“ ව්‍යාපෘති වාතර්ාව ”</u> යන කොටසද ඇතුලත් කර සභා තීරණයක් ලබාගෙන ලිපිලේඛන නැවත ඉදිරිපත් කිරීමට සිදුව තිබේ.එබැවින් මෙම ලිපිය ඉදිරිපත් කර ඇති බව සළකන්න.

**6.1.5** පාන්තිය ඕකන්දවත්ත මැදින් වැටී ඇති මාගර්ය ඕකන්දවත්තේ සිට වැල්කන්දල-වැකඩවත්ත මාගර්ය දක්වා ඇති මාගර්ය මතුගම ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවධර්නය කිරීම සඳහා ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.1.6** මතුගම ක්‍රීඩාංගනයේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සකස් කිරීම (දෙවන අදියර) ව්‍යාපෘතියේ අවසාන ගෙවීම් මුදල වන රු.**1457146.67** ක් ඉසුරු ගොවි සංවිධානය වෙත ගෙවීම සඳහා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.1.7** මතුගම ක්‍රීඩාංගනයේ (නැබඩ පාරට මුහුණලා) නව ප්‍රවේශ මාගර්ය සඳහා කුට්ටිගල් අල්ලා පොලව සකස් කිරීම ව්‍යාපෘතියේ අවසන් ගෙවීම් මුදල වන රු.**614000** ක් ජයබෝධි වැඩිහිටි සමිතිය වෙත ගෙවීම සඳහා අනුමැතියට කරන ලද යෝජනාව ගරු

ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.1.8** හොරවල බල ප්‍රදේශයට අයත් සිරිසිලාවත්ත ඉඩමේ වතර්මාන අයිතිකරු වන එච්.පී ගුණවධර්න හා ඩී.ටී.ඩී.එස්.ජේ ගුණවධර්න යන අය හපු ආරච්චිගේ ආනන්ද ජයතිලක හපුආරච්චි යන අයට ඔප්පු අංක 222,2020.12.07 දින පවරා දී ඇති බැවින් අක්කර බදු ලේඛණය මින් ඉදිරියට හපු ආරච්චිගේ ආනන්ද ජයතිලක හපුආරච්චි යන නම යොදා සංශෝධනය කිරීමට ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.1.9** කළුතර දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ සමාංක ACLGK/DO8/2022/CD/02 හා 2022.05.26 දිනැති ලිපියට අනුව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ආහාර සුරක්ෂිතතා වැඩසටහන මහා සභාවේ අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
සෑම ගමකම තියෙන සභාවට අයිති ඉඩම්,ප්‍රාදේශීය ලේකම්ට අයිති ඉඩම් එකඟතාවයක් මත ශ්‍රම පදනමින් කරන්න පුළුවන්. ගමේ සමිති එකතු කරගෙන ගොවි සමිති,ප්‍රජා මණ්ඩල එකතු කරලා සාමාන්‍යයෙන් කටයුතු කරගෙන යනවා.හැමදාම එන කෙනාට වගේ බලලා අපි සුළු ගෙවීමක් කරනවා.අපි එළදා වැඩසටහනකුත් සකස් කරලා තියෙනවා.ඉතින් මන්ත්‍රීතුමන්ලා එක ගානේ පටන් ගන්න කියලා මම කියන්නේ.ජුනි 30 වෙනකොට තමයි පැල සිටුවීමට යෝග්‍යයයි කියලා කියන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
බෝපිටිය කොට්ඨාශයේ තියෙන සභාව සතු ඉඩම් මොනවද කියලා දැන ගන්න පුළුවන්ද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
බෝපිටියේ වැලිමානාන සුසාන භූමිය තියෙනවා.තව රජයේ ඉඩමක් තියෙනවා.දළුග්ගලකන්ද ළඟ.ඒකත් පුළුවන් ප්‍රාදේශීය ලේකම්තුමියට කතා කරලා ගන්න.තව වීවින් එක ළඟ ඉඩමක් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
බෝපිටිය වත්ත ගන්න පුළුවන් නේද?අපිට සභා සතු ඉඩම්වල විස්තර ගන්න පුවවන්ද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
බෝපිටිය වත්ත වතු සමාගමත් එක්ක කථා කරලා ගන්න ඕනා.ඉඩම් විස්තර අපේ ඉන්වෙන්ට්‍රියෙන් ගන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

**6.1.9** යෝජනාවට අදාලව කථා කරන්නේ.සභාවට අයිති පොදු ඉඩම් කිව්වම වෙන්දේසි ඉඩම් වල පොදු කොටස් සඳහා වෙන් කරලා තියෙනවා.ඒ වගේම තව සභාවට අයිති ඉඩම් තියෙනවා.මේ ඉඩම් වල වගා කරන්න අපි යම් පුද්ගලයකු හඳුන්වලා දුන්නොත් සභාව මඟින් කොහොමද උදව් කරන්නේ?සභාපතිතුමා කිව්වා පැළ, ආධාර සියලු දේ ලබා දෙනවා කියලා. ඒ වගේම මේක ඉක්මනින් කරන්න ඕනා රටේ තියෙන අවශ්‍යයතාවයත් එක්ක.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
යම් කිසි කාලයකට තමයි ලබා දෙන්නේ.මේ මාස තුන ඇතුලත දෙනවා.පුද්ගලයෙක්ට දෙන්න නෙවෙයි යෝජනා කරලා තියෙන්නේ.සමිතියක් හදා ගන්න.සමිතියේ පුද්ගලයන්වයි,සභාවයි,ප්‍රාදේශීය ලේකම් එකයි,ගොවිජන සේවා එකයි එකට එකතු කරලා කටයුතු කරමු.ඒ අයටත් ප්‍රතිපාදන එනවනේ.ලේසිම දේ තමයි මඤ්ෙඤාක්කා වගාව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

මඤ්ෙඤාක්කා හිටවනවානම් සභාවෙන් අපිට එක දවසක් ජේ.සී.බී එක දෙනවානම් ඒ වගා කටයුතු කරන්න පුළුවන්.ඒ වගේම මිරිස් වුනත් අපිට වගා කරන්න පුළුවන්.මිනිස්සුන්ගේ උනන්දුව නැති එකයි ප්‍රශ්නේ.මුලින් අපි මේ දේවල් වලට යොමු වුනාම මිනිස්සු ඒ ආභාෂය අරන් හරි ඒ සඳහා යොමු වෙයි.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
සියලු මන්ත්‍රීවරු එහෙනම් ලිඛිතව අවශ්‍ය දේවල් ඉල්ලන්න.හෙට දවසේ ශ්‍රමදානය පටන් ගන්නවා. ඒ වගේම අපේ නිලධාරීන් දෙන්නයි,සේවකයෝ හතර දෙනයි පුහුනුවට ගිහින් තියෙනවා.ගෙවතු වගා හා වගා වැඩ සටහන් කරන්න.අපි ඒ අයවත් දෙන්නම් දැනුම ගන්න.නැත්නම් කෘෂිකමර් උපදේශක සම්බන්ධ කර ගන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක විමලසූරිය මහතා

සභාපතිතුමා අපි ගිය සභාවේදී ඇහුවා හොරවල ගරාජ් එක සම්බන්ධව.ඒ ගැන ගත්ත තීරණය මොකක්ද කියලා දැන ගන්න කැමතියි.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ලේකම්තුමිය ඒ සම්බන්ධව දැනුවත් කරයි.එතකොට අපි වගා වැඩ සටහන ගැන කථා කරන්නේ.වගාවට සම්බන්ධ මන්ත්‍රීවරු ගැනත් මම කිව්වා.ඔබතුමන්ලා අදහස් දක්වනවා නම් අවස්ථාව තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා

පවතින ආර්ථික හා දේශපාලන තත්වය තුල මේ කරගෙන යාමට සූදානම් වන වැඩපිළිවෙළ සම්බන්ධව ස්තුතිය පුද කරනවා.මම දැන ගන්න කැමතියි සෑම මන්ත්‍රී කෙනෙක්ටම තමන්ගේ කොට්ඨාශයේ තියෙන සභාව සතු භූමි ප්‍රදේශ සම්බන්ධව අවබෝධයක් ලබා ගන්න පුළුවන්ද කියන එක ගැන.ඒ වගේම මගේ බල ප්‍රදේශයේ තියෙන සොහොන් භූමිය මේ වගා කටයුතු වලට යොදා ගැනීම පිළිබඳ ස්තුතිය පුද

කරනවා.මේ සම්බන්ධයෙන් මතුගම ප්‍රාදේශීය සභාව යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනවා කියලා මිනිස්සුන්ව ප්‍රචාරණ මාධ්‍යයක් හරහා දැනුවත් කරලා විනිවිදභාවයෙන් කිරීම ඉතා වටිනවා.එතකොට සභාව හා මන්ත්‍රීවරු මේ ක්‍රියාවලිය විනිවිදභාවයකින් කරා කියන දේ මිනිස්සුන්ට හැඟී යනවා. එතකොට පෙරලා එන අභියෝග වලට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ වගේම මම ගරු සභාපතිතුමාගෙන් දැන ගන්න කැමතියි එක කොට්ඨාශයකට සේවකයින් කී දෙනෙක් ලබා දෙනවද?කොහොමද ලබා දෙන්නේ? කොම්පෝස්ට් කොපමණ ප්‍රමාණය බැගින් ලබා දෙනවද කියන එක සම්බන්ධව.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අදාළ කොට්ඨාශයේ තියෙන පොදු ඉඩම් ගැන දන්න සේවකයන්ව තමයි එවන්නේ.මම ලේකම් තුමියට කිව්වේ ක්ෂේත්‍ර කම්කරු ඉන්න සියලු සේවකයින් සහ කැමැත්තෙන් එන සියලු නිලධාරීන් මේකට සම්බන්ධ කර ගන්න කියලා.මේකේදී විශාල වශයෙන් තියෙන පොදු ඉඩම් සභාව මඟින් කරනවා.අවශ්‍ය කරන මෙවලම් අපි ලබා දෙනවා.ගම් වල අයව අපි නිවේදනයක් යවලා දැනුවත් කරලා මේ කටයුතු කරන්නේ.එතකොට ඒ අය එක්ක සුහදව මේ කටයුත්ත කරන්න පුළුවන්.නැත්නම් වැට මායිම් නිරවුල් කරන්න ගියොත් මේ වැඩේ කල් යනවා.එහෙම අල්ල ගත්ත ඉඩම් කීපයක් තියෙනවා.සෑහෙන කාලයක් තිස්සේ සොයා බැලීම් නොකරපු නිසා ඒ තත්වය  ඇති වෙලා තියෙනවා.පොදු ඉඩම් සමහර නිලධාරීන්වත් දන්නේ නෑ.ඒක නිසා මන්ත්‍රීතුමන්ලා කියන දේ හරි.මේ ඉඩම් වල මොනවාහරි වවන්න වැඩ පිළිවෙලක් යොදන්න ඕනා.ඒකට මන්ත්‍රීතුමාලා මැදිහත් වෙන්න.අපි සේවකයෝ දෙන්නම්.සොහොන් භූමි ගැන කියන කොට අක්කර 4,5 තියෙන ඒවයේ සොහොන් තියෙන ප්‍රදේශය හැර අනෙක් භූමි කොටස තමයි වගා කටයුතු වලට ගන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
සභාවේ ගෑස් අබර්ුදය නිසා ආදාහනාගාරය භාවිතා කරන්න බැරි වුණ අවස්ථාවේ මේ ොකාට්ඨාශයේ මිනිස්සු ගොඩක් අසරණ වුණා.මිනිස්සුන්ට වලක් කපා ගන්න තැනක් නෑ.මම ලේකම්තුමියට කථා කරලත් කිව්වා.විශේෂයෙන් කැටගොඩ සුසාන භූමිය,බෝපිටිය පොදු සුසාන භූමිය,කඩවක සුසාන භූමිය යන මේවායේ දැනට තියෙන වැට මායිම් නිරවුල් කරලා දෙන්න කියලා.මේවායේ ගෙවල් හදලා තියෙනවා.එක් සොහොනකට වගේ ප්‍රමාණයක් තමයි ඉඩ තියෙන්නේ. ඒක නිසා මම යෝජනා කරනවා බෝපිටිය කොට්ඨාශයේ තියෙන සියලු සුසාන භූමිවල දැනට තියෙන ප්‍රමාණය නිරවුල් කරලා දෙන්න කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මේ ආදහන ප්‍රශ්නෙට මම යෝජනා කරා දර සෑය සෙහොනවල් හදන්න.ඒකට ආකෘතිය හදලා අඩු මිලට දර සපයන කෙනෙක්ට භාර දෙනවා.මේ සඳහා අඩුම මිලක් රු.5000ක් රු.6000ක් වගේ මුදලක් නියම කරලා කර ගන්න පුළුවන්.ඉදිරියට ගෑස් නැතිම වුනොත් මේ ක්‍රමයට යන්න වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය

සභාපතිතුමා මට දැන ගන්න පුළුවන්ද කඩවක පැපිලියාගහලන්ද පොදු සුසාන භූමියේ ප්‍රමාණය කොපමණද?කාගේ අවසරයටද වටේ ගෙවල් හදලා තියෙන්නේ කියලා?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
හංගලා කියන්න දෙයක් නෑ.සභාපතිවරු දෙන්නෙක් තමයි මේකේ පදිංචි කෙරෙව්වේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
සභාපතිතුමා එහෙම කෙහොමද කරන්නේ?සභාවේ ඉඩමක්නේ ඒක.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
අපේ සභාවේ වුනාට ප්‍රාදේශීය ලේකම් විසින් බැහැර කරලා නෑ ඉඩම.ප්‍රමාණය නම් මට මතක නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
දැන් එතකොට සභාපතිතුමා සභාව සතු දේපළක් කවුරු හරි අල්ල ගත්තොත් නිතිමය කටයුතු කරන්න බැරිද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
පුළුවන්.නමුත් තාම ඒ ඉඩම තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් භාරයේ.ඊළඟට අතිරේක න්‍යාය පත්‍රයේ කාරණා වලට යොමු වෙනවා.දැන් අපිට මෙහෙම ගැටළුවක් තියෙනවා.අපේ තියෙන අරමුදල් වියදම් කරන්න එපා කියලා චක්‍රලේඛයක් ඇවිත් තියෙනවා.ඒක නිසා අත්‍යවශ්‍යයෙන් කළ යුතු ඒවා සභාගත කරලා කරනවා.

**6.1.10** මතුගම නගරයේ සහ බල ප්‍රදේශයේ ප්‍රධාන අතුරු මාගර්වල වලවල් සෑදී ගමනාගමන කටයුතු වලදී දැඩි අපහසුතාවයන්ට ලක් වන බැවින් එම මාගර් හදුනාගෙන අළුත්වැඩියා කටයුතු කිරීමට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.1.11** මතුගම සතිපොළේ වහල හා කාණුව සැකසීම සඳහා ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.1.12** මතුගම නෑබඩ පාරට මුහුණ ලා ඉදි කරන ලද කඩ කාමර සඳහා දැනට විවෘත කරන දිනට පමණක් රු.100.00 බැගින් වන මුදලක් දෛනිකව අය කරයි.නමුත් මේවා ස්ථිර කඩ කාමර බැවින් තක්සේරු දෙපාතර්මේන්තුව මඟින් තක්සේරු කිරීමෙන් පසු මේ කඩ කාමර සඳහා මාසික කුලියක් අය කිරීම හා ගිවිසුම්ගත වීම සිදු කල යුතු බැවින් තක්සේරු දෙපාතර්මේන්තුව මඟින් තක්සේරුව ලැබෙන තෙක් ,ආදායම් පරීක්ෂකගේ තාවකාලික තක්සේරුවක් ලෙස මාසික කුලිය රු.6500.00 ක මුදලක් අය කිරීම සුදුසු බවට ගරු

සභාවට  කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම අදහස් දැක්වීමෙන් පසු සභා සම්මත විය.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
කඩ වහලා තියෙන අයගෙනුත් ගන්න.ඒ වගේම ඒකට සංශෝධනයක් දාන්න හිඟ මුදල් තියෙන අයගෙන් රු.5000 ක හෝ මුදලක් අය කරලා පියවගන්න කියලා.

ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා
හිඟ මුදල් නොගෙව්වොත් අපි ගිවිසුම දෙන්නේ නෑ.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
ඒ වුණාට ඒකේ මාසිකව රු.6500ක් අය කරනවා නම් හිඟ තියෙන අයගෙනුත් රු.5000 ක් අය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාවේ දේපළ මිනිස්සු මංකොල්ල කෑවට නීතිමය කටයුත්තක් කරන්න බෑ.දැන් වෙන්දේසි ඉඩම් වල සභාව සතු ඉඩම් තියෙනවා.ඒවා අල්ල ගත්තොත් නීතිමය පියවර ගන්න බැරිද?

ලේකම් ඩබ්.ඒ.එම් අයි.එස් තෙන්නකෝන් මිය
පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
බැහැයි කියලා කිව්වානේ.ඒකයි මම නැවත ඇහුවේ

ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒ කිව්වේ සුසාන භූමිය ගැන ඒක අපිට පවරලා නැති නිසා බැහැ කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය  මහතා
වෙන්දේසි ඉඩම් වල තියෙනවා පොදු කටයුතු සඳහා වෙන් කරපු ඉඩම්. හැමෝම හිතන් ඉන්නේ මේවා සුසාන භූමි සඳහා වෙන් කරපු ඉඩම් කියලා.එතකොට වෙන්දේසි ඉඩම් වල අය ඒ අයගේ ආදාහන කටයුතු සඳහා මේ ඉඩම් කොටස් භාවිතා කරනවා. ඉතින් මේ සම්බන්ධව මම සභාව දැනුවත් කරලා තියෙනවා.බොන්දුපිටිය පාසල පිටිපස්සේ තියෙනවා සඳුන් උයනට වෙන් කරපු පොදු කොටස.ඒකට මම සභාවට කථා කරලා තහනම් නියෝගයක් ගෙනාවා.

ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒකේ සොහොන් බැඳලද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය  මහතා
ඒකේ සොහොන් දහයකට වඩා බැඳලා තියෙනවා සභාපතිතුමා.

ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා
සොහොන් බඳින්න අවසර දීලා නෑ ඒකේ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය  මහතා

මේ එකකටවත් අවසර දීලා නෑ.නමුත් මිනිස්සු භූමදාන කටයුතු කරනවා.ඒ විතරක් නෙවෙයි වලවල් බඳිනවා.සිහිලැල්තැන්නේ පලවෙනි අදියරේ ඇතුල්වෙන තැනම මග ෙපන්වන සිතියමක් ගහලා තියෙනවා. ඒකේ සුසාන භූමිය කියලා නම් කරලාත් තියෙනවා.එතකොට ඒක සභාව දන්නෙත් නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මෙන්න මෙහෙමයි තියෙන්නේ.වෙන්දේසියක් කරාම ඒකේ පොදු කොටස තියෙන්නේ ඒ වෙන්දේසි ඉඩමේ අයගේ පොදු කටයුතු වලට.පොදු කටයුතු කිව්වම සභාවට පුළුවන් මේක නියම කරන්න සොහොනට ,ළමා උයනට,සායනයට කියලා වෙන් කරන්න.සිහිලැල්තැන්නේ කරේ එහෙම දෙයක්.ඒ සොහොනේ සුසානයක් කරන්න මේ සභාව අවසර දුන්නා.එහෙම දුන්නාට පස්සේ පදිංචි වෙලා ඉන්න අය කියනවා මේක අප්‍රසන්නයි.අයින් කරලා දෙන්න කියලා.වෛද්‍යවරයෙක් සභාවට ඉදිරිපත් කරලා තිබුණා ඒ සම්බන්ධ ලිපියක්.සභාවේ ඒක සම්මත වුණා.ඊට අදාල ගොනුවක් තියෙනවා.මම කිව්වා මේ සම්බන්ධව කොට්ඨාශයේ මන්ත්‍රීවරු දෙන්නාව දැනුවත් කරන්න කියලා.මේකේ ගොනුවේ සඳහන් කරලා තියෙනවා මෙම සුසාන භූමියේ අනවසර භූමදාන නැවැත්වීමට බැනර් එකක් ගහන්න කියලා. මේක ගමේ අය එක්ක සාකච්ඡා කරලා කරන්න ඕනා.මේ සභාවට දාලා කරේ.අනවසරයෙන් කරා නෙවෙයි.මේ ඉඩම අපි සුසානයක් අවශ්‍යනම් තාප්පයක් ගහලා වෙන් කරලා හරි කරමු.නැත්නම් නවත්තමු.බොන්දුපිටියේ එකත් ඒ වගේම තමයි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
එහෙම පිළිවෙලකට වැඩක් කරනවානනම් හොඳයි.මිනිස්සු වලක් බඳිනකොට අවසර අරන් කරනවානම් හොඳයි නැත්නම් අපරාධයක් වෙනවා.මිනිස්සු සභාවට අයිති ඉඩම්වල හිතුමතේට වැඩ කරනවා.මම කියන්නේ මේක අපි නවත්තන්න ඕනා.ඒක නිසා සභාපතිතුමා කරන දෙයක් පැහැදිලිව විනිවිදභාවයකින් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
සුසාන කොන්ක්‍රීට් වලින් කරන්න තහනම්.මීගමත් ඔය ගැටළුව තියෙනවා.දුෂ්කරම තැන්වලට අපි කොටසක් වෙන් කර දෙන එක හොඳයි භූමදානය සඳහා පමණක්.නැත්නම් මේකට කොහේ හෝ සුසානයක් පවරා ගන්න ඕනා.මේක අපි සාකච්ඡා කරලා කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ප්‍රියංකා ගුණවර්ධන මිය.

ගරු සභාපතිතුමා ඒ අය මුදල් ගෙවලා තියෙන්නේ පොදු කටයුතු වලටත් එක්ක තමයි.පොදු කොටස එයාලගේ අවශ්‍යතා මත දෙනවා කියලා කියලා තියෙන්නේ.ජනතාවත් එක්ක කථා කරලා කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**6.1.13** කොරෝනා අවධානම සහිත කාල වකවානුව තුල කොරෝනා අවධානම යටතේ සේවයේ යෙදුණ සේවකයින් **70** දෙනෙකු සඳහා රු.**3000.00** බැගින් දිරි දීමනාවක් ලබා දීමට **2021.09.21** වන දින පැවැත්වූ මහා සභා රැස්වීමේ තීරණ අංක **6.1.16** මගින් තීරණයක් ගෙන එයට අවශ්‍ය මුදල් වියදම් කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට **2021.12.17** දිනැතිව ලිපි ලේඛණ ඉදිරිපත් කරන ලදී.

ඒ සඳහා 2021 වෂර්යේ මුදල් වියදම් කිරීමට අපේක්ෂිත අනුමැතිය සඳහා නිදෙර්ශ කිරීමේ හැකියාවක් නොමැති බවත්,එය 2022 වෂර්ය තුල සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම්,ඊට අනුකූලව තොරතුරු ඉදිරිපත් විය යුතු බවත්,2022 අයවැය ප්‍රතිපාදන තුල අදාළ වියදම් සිදු කරන ආකාරය පිළිබඳව නැවත ඉදිරිපත් කරන ලෙසට පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/05/08/පොදු හා 2022.05.26 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

- 01-පොදු පරිපාලනය -1003-V11
- 03-සෞඛ්‍ය සේවා -1003-V1
- 04-භෞතික සැලසුම් -1003-V1
- 08- කොම්පෝස්ට් -1003- V

වැය ශීෂර්යන්හි වෙනත් දීමනා සඳහා වෙන් කර ඇති මුදලින් යෝජිත සේවකයින් 70 දෙනා සඳහා රු.3000.00 බැගින් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන නැවත ඉදිරිපත් කිරීම සඳහා ගරු සභා අනුමැතියට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා
6.1.12 යටතේ දාලා තියෙන මාසික කුලිය රු.6500 ක මුදලක් ප්‍රමාණවත් නෑ කියන එකයි මම කියන්නේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒක දැන් අපි කථා කරා.දැනට අය කරන්නේ රු.100 යි.කඩ 20න් වහන කඩවල අය කරන්නේ නෑ.දෛනික කුලිය අය කරන එක සභාවට පාඩුයි.ඒ නිසා මමයි කිව්වේ මාසික කුලියක් ගන්න කියලා.තක්සේරුවෙන් එනකන් ඉදියොත් මේකවත් නොලැබෙන නිසා තක්සේරුව එනකන් 6500ක් අය කරනවා.ආදායම් පරිපාලකතුමාගෙන් මේ තක්සේරුව ගත්තේ.නැත්නම් තක්සේරුව කරාම ආපස්සට අය කරන්න බෑ.වගර් අඩි ගානට අය කරන නිසා බොහෝ විට වැඩි වෙන්න පුළුවන්.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හින්ටන් මද්දගේ මහතා
කොච්චර කාලයක් යයිද මේ තක්සේරුව එන්න?
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
රටේ තියෙන තත්වයත් එක්ක තක්සේරු නිලධාරීන් දෙපාතර්මේන්තුවේ අඩුයි.අපි මාසයක් වගේ ඇතුලත කර ගන්න තමයි බලන්නේ.එහෙනම් ගානක් යෝජනා කරලා කියන්න.

එහෙනම් අපි මාසයක් ඇතුලත තක්සේරු නිලධාරීන්ට වැඩිපුර ගෙවලා හරි මේක ඉක්මන් කරලා කර ගන්න බලන්නම්.තක්සේරුව කරලා අපි අය කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා ඔය කඩකාමර පේලියට ඉස්සරහ තියෙන කඩවලින් දවසට 3000ක් අය කරනවා.
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

අපිට පුළුවන් සභාවේ කතා කරලා වැඩි කරන්න.නමුත් නීතියක් තියෙනවානේ.පොදු වෙළඳපලේ කඩවලින් රු.3000ක් තමයි අය කරන්නේ.ගන්න පුළුවන්නම් අපිත් කැමතියි 15000ක් වුනත් අය කරන්න.නැත්නම් අපි පොදු වෙළඳපලේ කඩ ටෙන්ඩර් කරමුද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි සීතා ඩයස් මිය
මම පෞද්ගලිකව දන්නවා පොදු වෙළඳපලේ එකම පුද්ගලයාට කඩ කීපයක් තියෙනවා.ඒ අය කුලියට දෙනවා.සභාවට ආදායම ලැබෙන්නේ නෑ.මම නම් කියන්නේ මේ වෙළඳ ප්‍රජාව ගෙන්නලා ගාස්තුව සම්බන්ධව ඒ වගේම ඔවුන්ගේ අවශ්‍යතා සම්බන්ධව කථා කරමු. ඒ වගේම සභාවට නොලැබෙන ආදායම සම්බන්ධවත් තීන්දුවක් ගමු.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මන්ත්‍රීතුමිය කඩයක් කවුරු හරි වෙන කාට හරි දෙනවානම් මුලින්ම කරන්න ඕනා සභාවට කඩය භාර දෙන එක.නමුත් මේවා ඉස්සර ඉඳලා කරගෙන ඇවිත් තියෙන විදිය තමයි මේ.
මේ කාලය තුල අපි අතුරු බදු නීත්‍යානුකූල කරා.අවුරුදු 5ක කුලිය අරගෙන තමයි දුන්නේ.දැනුත් අවිධිමත් වැඩ කීපයක් වෙන නිසා මම කියලා මාළු කඩය කැඩුවා.ඒ කැඩුවේ වතුර කාණුව ගන්න බෑ.බෝ ගසේ මුල් ගිහිල්ලා.ඒකත් වියදම් කරලා කැපුවා.මැද මිදුලට වාහනයක් ගන්න පුළුවන් වෙන්න සහ පිරිසිදු කටයුතු කරන්න පුළුවන් වෙන්න තමයි එහෙම කරේ.මේවා හදලා සභාවට ආදායමක් එන්න ගේන්න කටයුතු කරමු.අපේ මස් කඩ දෙකක් තියෙනවා.ඒක කඩ තුනක් විදියට අපිට ටෙන්ඩර් කරන්න පුළුවන්.ටෙන්ඩර් තීරණය අද ගන්නවා.ඊලඟ මාසේ ටෙන්ඩර් කරනවා මේ කඩ ටික.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
සභාවේ මස් කඩය වහපු වෙලාවේ ලොකු ආන්දෝලනයක් ඇති වුණා ස්ථිරව ලැබුණු ආදායමක් අහිමි වුණා කියලා.නමුත් අද මේ මස් කඩය නැති වුනත් සභාවට ආදායම් එන මාගර් විශාල ප්‍රමාණයක් මේ නිලධාරීන්ගේ අක්‍රමිකතා මත ඇහිරිලා තියෙනවා.2019 ඉඳන් උපකාරක පන්ති ගුරුවරුන්ගෙන් ලැබෙන ආදායම සභාවට අරගෙන නෑ.එතකොට මේක ගිය සභාවේ මම කථා කරා කියලා මට මේ සභාවේ සේවකයෙක් වන ඒ.කේ.පී වසන්ත මැයි 25 අසභ්‍ය වචනවලින් බනිනවා.මරණීය තර්ජනය කරනවා.එතකොට මන්ත්‍රීවරු මාසෙට දවසක් ඇවිල්ලා ,ජනතාවගේ ඡන්දෙන් මෙතනට ආවේ මේකේ ඉන්න නිලධාරීන් රකින්න නෙවෙයි.ඒක නිසා මේ වැරුද්ද නිවැරදි කරන්න බැරිනම් මේ සභාවේ නිලධාරීන් ඉඳලා මොකටද?ඒ නිසා කරුණාකරලා මේක නිවැරදි කරන්න.දිගින් දිගටම මේක කරා.2018 ඉඳන් මම මේ උපකාරක පන්ති ගුරුවරුන්ගේ මාෆියාවට කතා කරේ.කමිල් මන්ත්‍රීතුමා යෝජනාවක් දැම්මා,කසුන් මන්ත්‍රීතුමා යෝජනාවක් දැම්මා.කරවිට මන්ත්‍රීතුමා යෝජනාවක් දැම්මා.ඒ එකක්වත් මේ සභාවේ ක්‍රියාත්මක වුණේ නෑ.නමුත් ගිය සභාවේ මම කරපු ප්‍රකාශයට සේවකයෙක් මට බනිනවා මගේ පාඩුවේ ඉන්න කියලා.මම පාඩුවේ ඉන්න නෙවෙයි මෙතෙන්ට ආවේ.මම උපකාරක පන්ති ගුරුවරියක්.අපේ ගුරුවරුන් වෙනුවෙන් කථා කරන එකකට එහෙම චෝදනා කරන්න පුළුවන්නම්, තර්ජනය කරන්න පුළුවන්නම් වහාම ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න කියලා ඉල්ලා සිටිනවා.ඒ වගේම මේ සුජීව මන්ත්‍රීතුමා කථා කරා මේ නිලධාරීන් ගැන.මේවා නිවැරදි වෙන්න ඕනා.කොතනකදීවත් නිලධාරීන්ව රකින්න එපා.

ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඔයගොල්ලෝ මගෙන් ඉල්ලීමක් කරන්න කොමසාරිස් කායර්ාලයෙන් නිලධාරියෙක් දාලා මේ දූෂණ ගැන හොයන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
අනිවායර්යෙන්ම.මම ලිඛිතව ඉල්ලලා ඇති ඒ සේවකයාගේ තනතුර සහ මේ සභාවේ ඉටු කරන රාජකාරිය අපිට පෙන්වන්න.
ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා
මන්ත්‍රීතුමිය මට පැමිණිලි කරා.මම කිව්වා පොලිසියේ පැමිණිල්ලක් දාන්න කියලා. එතුමිය දැම්මේ නෑ.ඔබතුමිය දැන් ගිහින් පැමිණිල්ලක් දාලා එන්න.මම එතන ඉඳලා ක්‍රියාත්මක වෙන්නම්.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
මට කියන්න ඒ සේවකයාගේ තනතුර මොකක්ද කියන එක සහ දැනට කරන රාජකාරිය මොකක්ද කියලා?අවුරුදු හතරක් නිලධාරීන් ආරක්ෂා කරා.තවත් ආරක්ෂා කරන්න හදනවා.
ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා
වැඩ ක්ෂේත්‍ර කම්කරු.ආදායම් අංශයට දාලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා අපි සභාවට ආපු දවසේ ඉඳලා දිගින් දිගටම මේ නිලධාරීන්ගේ තියෙන ප්‍රශ්න පිළිබඳව ඔබතුමා එක්ක කථා කරා.හැබැයි මේ දක්වා මේ කාල සීමාව තුල සභාපතිතුමා ඔබතුමාගේ රාජකාරිය පැහැර හැරලා තියෙනවා.අදටත් නිලධාරීන් ආරක්ෂා කරන තැන විතරයි ඔබතුමා ඉන්නේ.නිලධාරීන් ආරක්ෂා කරන්න ගිහින් ඔබතුමා හැල්ලුවට ලක් කරන්නේ කොට්ඨාශයේ ඉන්න මන්ත්‍රීවරයාව.කොට්ඨාශවල තියෙන ප්‍රශ්න ගැන අපි කතා කරා.නිලධාරීන්ගේ ගැටළු ගැන කථා කරා.සභාපතිතුමා ඒවට ක්‍රියාමාගර්යක් ගත්තේ නෑ.මේ ප්‍රශ්නේ ලොකු ප්‍රශ්නයක්.පෞද්ගලික සම්බන්ධකම් අදාල නෑ.අපි මේකට එන්නේ ජනතාව නියෝජනය කරන්න.අපිට තව ටික කාලයයි තියෙන්නේ.මේ නිලධාරීන් කරන ඒවායේ සියලු අපවාද එන්නේ අපිට.අදටත් සභාපතිතුමා කථා කරන්නේ නිලධාරීන්ව පරිස්සම් කරන්න.අපිට නිලධාරීන් පරිස්සම් කරන්න අවශ්‍ය නෑ.ඒ නිසා දැඩිව තීරණයක් ගන්න.දැනට අපිට ලැබිලා තියෙන තොරතුරු අනුව 2019 ඉඳන් බෝඩ් වලට මුදල් අය කරලා නෑ.ඒකට හේතුව මොකක්ද? මිනිස්සු කියනවා සභාපතිතුමාට,ලේකම් මිස්ට,තාක්ෂණ නිලධාරීන්ට මුදල් දෙනවා කියලා.ඇයි මේවාට විරුද්ධව කථා කරේ නැත්තේ?

ගරු ප්‍රාදේශීය සභා සභාපති මෙරිල් මුණසිංහ මහතා
ලේකම්තුමිය කියන්නේ සභාවේ ඒ වෙලාවේ බෝඩ් ගලවන්න තීරණයක් ගත්තා කියලා.මම ඒකට එකඟ නෑ.මම ඔබතුමා කියන මතයේ ඉන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය

2019 ඉඳන් ගන්නේ නෑ කියලා තීරණයක් තිබුණානම් ඇයි උපකාරක පන්ති ගුරුවරුන්ගෙන් ගත්තේ?

ගරු ප්‍රාදේශීය සභා සභාපති මෙරිල් මුණසිංහ මහතා

මන්ත්‍රීතුමිය මටත් ඕනා මේකට ක්‍රියාමාගර්යක් ගන්න.ඔයා පොලිසියට පැමිණිල්ලක් කරන්න.මරණ තජර්න කරානම් වෙන මොකක්ද තියෙන්නේ?ඊළඟට 2018 ඉඳලා අය කරලා නැත්නම් ඒක ආදායම් නිලධාරීන්ගෙන් ගන්න ඕනා. ඒ වගේම හිඟ ආදායම් අය කරලා නැත්නම් අදාල වගකිව යුතු නිලධාරීන්ගේ වැටුපෙන් කපන්න කියලා මම ලේකම් මිස්ට කියලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය

සභාපතිතුමා මට පැමිණිල්ලක් දාන්න පුළුවන්.නමුත් ඒකට මගේ ගෙදරින් විරුද්ධ වුණා.පැමිණිල්ල දාලා එළියේ යනකොට මට ආරක්ෂාව දෙන්න සභාපතිතුමාවත්,ලේකම්තුමියවත් නෑ.මේක සභාවේ ප්‍රශ්නයක්.මේක කථා කලේ සභාව ඇතුලේ.මේකේ නිලධාරීන්ට විරුද්ධව සභාවෙන් ක්‍රියාමාගර්යක් ගන්න ඕෙන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ලබන සභා වාරේට කලින් බෝඩ් සම්බන්ධව 2019 ඉඳලා සියලු අය නොකල මුදල් නිලධාරීන්ගෙන් අය කරන්න ඕනා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මේ සම්බන්ධව 6.15 දිනට ස්ථිර දැන්වීම් පුවරු සඳහා අය කරලා තියෙනවා රු.248250ක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා

මේ බෝඩ් සම්බන්ධව දිගින් දිගටම කථා කරා.අවුරුදු එකහාමාරකට කලින් යෝජනාවක් ගෙනාවා.නමුත් ඒවා ක්‍රියාත්මක වුනේ නෑ.මේවයේ මුදල් අය කරලා නැත්නම් මේ බෝඩ් ගහපු ගුරුවරු,ව්‍යාපාරික ප්‍රජාව ගෙන්වන්න.ගෙන්වලා ඒ විස්තර දැන ගන්න.මේක පොදු ප්‍රශ්නයක්.මතුගම නගරය අවලස්සන වීම හා සභාවට ආදායම අහිමි වීම සම්බන්ධව.අනෙත් කාරණය තමයි මන්ත්‍රීතුමියගේ ප්‍රශ්නෙට සාධාරණ පිළිතුරක් දෙන්න.මේක හෙට දිනයේ වෙන කෙනෙක්ට හෝ ඔබතුමාට වෙන්න පුළුවන්.අපි සභාවේ කිසිම කෙනෙක්ට එහෙම කතා කරන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ජයවධර්න මහතා

මීට පෙර කසුන් මන්ත්‍රීතුමාට පොලිස් නිලධාරීයෙක්ගෙන් ප්‍රශ්නයක් වුණ වෙලාවේ අපි සභාවේ ක්ෂණිකව ක්‍රියාමාගර්යක් ගත්තා.ඒක නිසා මන්ත්‍රීවරුන්ගේ අත්සන් ලේඛණයක් සහිතව කොමසාරිස්තුමාට හෝ ඊට ඉහළට පැමිණිලි කරන්න මේ සේවකයා පිලිබඳ නීතිය ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල මද්දුමාගේ මහතා

මෙතන ගැටළුවක් තියෙනවා.මේ මන්ත්‍රීතුමියට වුණ දේ හෙට අපිට වෙන්න පුළුවන්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම කියන්නම් මන්ත්‍රීතුමා, පහල තියෙන යෝජනා ටික අත්හිටවලා මේ යෝජනාව ඉවර කරන්න.මම කියපු දේ තේරුම් ගත්තේ නෑ.මම කිව්වේ න්‍යාය පත්‍රයේ යෝජනා ඉවර කරලා මේක යෝජනාවක් හැටියට ගමු කියලා.මේක ක්‍රමවේදය නෙවෙයිනේ.

ගරු සභාපතිතුමා විසින් න්‍යාය පත්‍රය තාවකාලිකව අත්හිටවන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා
ගරු සභාපතිතුමා ඔබතුමාව මම දන්නේ පාසල් යන කාලයේ ඉඳලා.පුද්ගලිකව කිසි කෙනෙක් එක්ක අමනාපයක් නෑ.ඇත්තටම අපිට වැඩිය දක්ෂ මන්ත්‍රීවරු මෙතන ඉන්නවා.ඔබතුමා ඒ කාටවත් වගකීමක් දුන්නේ නෑ.ඔබතුමා හිතන් හිටියේ ප්‍රාදේශීය සභාව කියන්නේ ඔබතුමා විතරයි කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
එහෙම කියන්න එපා.මේ සභාවෙන් තමයි ඔක්කොම තීරණ ගත්තේ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා
තීරණ ගත්තට ක්‍රියාත්මක වුනේ නෑ.වාහන ,තෙල් ඒවා එක එක අයට බෙදලා දෙන්න.අපි දකිනවානේ.වාහන හතර පහ එකට යනවා.යටදොල උප කායර්‍ාලයට හෙට අවශ්‍ය ඒවා අද දෙන්න කියන්න.ඒකට එක වාහනයක් යවන්න.ඒවගේ වැඩ පිළිවෙළක් හදන්න.ඒ වගේම රියදුරු මහත්වරු ඉන්නවා අති කාල ගන්න අය.වාහනයට අවුරුද්දකින්වත් නැගලාවත් නෑ.

ගරු ප්‍රාදේශීය සභා සභාපති මෙරිල් මුණසිංහ මහතා
එහෙම නාස්තිකාර විදියට යන්නේ නෑ.ත්‍රි රෝද රථ යන්නේ ස්ථානීය පරීක්ෂණ වලට.ඒවායේ ධාවන සටහන් අරගෙන පෙන්නන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා
මම මුලින්ම යෝජනා කරනවා න්‍යාය පත්‍රය අත්හිටුවලා මන්ත්‍රීතුමියට වුණ අසාධාරණයට ක්‍රියාමාගර්‍යක් ගන්න කටයුතු කරන්න කියලා.

මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
මම ඒ යෝජනාව කරලානේ තියෙන්නේ.අහගෙන ඉන්නේ නැනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා
අත්හිටවන්න යෝජනා කරන්න කියලා කිව්වානේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
යෝජනා කරන්න කිව්වේ ගන්න ක්‍රියාමාගර්‍ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ජයවධර්‍න මහතා
ගරු සභාපතිතුමනි,රුවන්දි මන්ත්‍රීතුමියට සභාවේ සේවකයෙක් දුරකථනයෙන් මරණ තජර්‍නයක් කළානම් ඒ සම්බන්ධයෙන් වහාම නීතිය ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා
එම යෝජනාව ස්ථිර කරනවා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි සීතා ඩයස් මිය
පලාත් පාලන සංසදයේ සාමාජිකාවක් විදියට මමත් ඉල්ලා සිටිනවා ඒ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කියලා.

මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
කවුරුත් විරුද්ධ නෑ.සියලු දෙනා එකඟයි. මමත් සම්පූණර්යෙන් එකඟයි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
ඔය කියන සේවකයාට මීට පෙරත් සිද්ධියකට චෝදනාවක් තියෙනවා.සභාවෙන් කිසිම පියවරක් අරගෙන නෑ.ඒ වගේම සභාපතිතුමා මිනිස්සු අපිට චෝදනා කරනවා මේක හොර ගුහාවක් කියලා.මොනවද සභාපතිතුමා අපි හොරකම් කරලා තියෙන්නේ?
මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
මන්ත්‍රීවරුන්ට ඒ චෝදනාව නෑ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
මේ නිලධාරීන් මේකේ තියෙන ඉඩම්,ගස් කොළන් බෙදාගෙන තියෙනවා.සභාව සතු ටෙන්ඩර් වලින් දීලා තියෙන ඉඩම් බෙදා ගෙන තියෙනවා. අපි වාහනයක්වත් අවභාවිතා කරලා නෑ.මිනිස්සු සමස්ථ මන්ත්‍රීවරු හොරු කියලා කියන්නේ.

මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
පසුගිය කාලේ සියලු දේපළ වෙන්දේසි කළේ ප්‍රසිද්ධ කරලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ජයවධර්න මහතා
දැන් සභාපතිතුමා පිලිගන්නවනේ මෙතන ඉන්න අය හොරකම් කරන්නේ නෑ කියන එක. එහෙනම් 2019 ඉඳන් මේ වෙනකම් බෝඩ් වලින් ආදායමක් ලැබුණේ නැත්නම්,ඊට අදාල නිළධාරීන් මේ මුදල් ගෙව්වානම් ඒ මුදල ගිය තැනක් නැත්නම් හොරු වෙන්නේ අපි.මේ බදු ගෙවපු අය ඉන්නවා.ඒක නිසා ඒ නිලධාරීන් ගැන විනය ක්‍රියාමාගර් ගන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා
සභාපතිතුමා මේ බෝඩ් ගහලා තියෙන අයව කැඳවන්න.ඒ අයගෙන් අහන්න කීයක් ගෙවලා තියෙනවද කියලා.මේකේ අවසාන ප්‍රතිඵලය භයානකයි.අවසානයේ මේක එන්නේ ඔබතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට. ඊළඟට අපේ ගෙවල් වලට ගහයි මිනිස්සු. ඒක නිසා මේකට වහාම පියවරක් ගන්න.

මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
සතියක් ඇතුලත බෝඩ් ගලවන්න.බෝඩ් ගලවලා මිසක් කැඳවලා වැඩක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා මේ අවුරුද්දට තියෙනවා කියන රු.249200ක මුදලයි,2018 ඉඳලා අවුරුදු වල අය නොකරපුවයි අදාල නිලධාරීන්ගෙන් අය කරන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
ඒක තමයි කරන්න තියෙන්නේ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවධර්න මහතා
මේවට 90%ක් වගකියන්න ඕනා රාජ්‍ය නිලධාරීන්.දැන් ඉන්න අය සහ කලින් ඉඳපු අය.අපි කරපු දෙයක් නෑ.ඒ වුනාට මේකේ නිලධාරීන් සමාජ ජාලාවල දාන්නේ මන්ත්‍රීවරු හොරකම් කරා කියලා.ඔයාලා ඒ සම්බන්ධව ගත්ත පියවර මොකක්ද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ජයවධර්න මහතා

අනෙත් කාරණය සභාපතිතුමා ඔය බෝඩ් වලින් මුදල් ගන්න කෙනා ඔබතුමාව,ලේකම්තුමියව සහ අනෙක් නිලධාරීන්ව පාවලා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ප්‍රියංකා ගුණවධර්න මිය
ගරු සභාපතිතුමා ජනතාව දැන් දන්නවා මේ රාජ්‍ය නිලධාරීන්ගේ දූෂිත ක්‍රියා නිසා සමාජය මහත් ව්‍යාසනකාරී තත්වයට පත්වෙලා තියෙනවා කියලා.මේ මන්ත්‍රීතුමිය 2018 ඉඳන් මේ ගැන කථා කරනවා.නමුත් පුද්ගලයෙක් ඉලක්ක කරලා නෙවෙයි කතා කරේ.ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් කථා කරේ.ඒ සම්බන්ධව මේතාක් ක්‍රියාමාගර්යක් නොගැනීම සම්බන්ධව බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
මේ කියන සේවකයා වැඩ ක්ෂේත්‍ර කම්කරුනේ.මට කියන්න ගිය සිකුරාදා කරපු රාජකාරිය මොකක්ද කියලා.අත්සන් කරනවා. යනවා.මේකට සභාපතිතුමායි,ලේකම් මිසුයි දෙන්නම අහු වෙලා ඉවරයි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා
සභාපතිතුමා මේ ගැන ප්‍රකාශයක් කරලා අවශ්‍ය පියවර ගන්න.අනෙත් එක තව අසාධාරණයක් වෙනවා.මෙතන අවංකව වැඩ කරන නිලධාරීන් ඉන්නවා.සමස්ථ නිලධාරී මණ්ඩලයට අසාධාරණයක් වෙනවා මේ එක්කෙනෙක් දෙන්නෙක් කරන ජරා වැඩ නිසා.
සභාපතිතුමා ඔබතුමාට තමයි ප්‍රධාන වැරුද්ද එන්නේ.
මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
දැන් මෙතන යෝජනා කර ගත්තානේ කරන ක්‍රමවේදය.මම කියන්නේ දින තුනක් ඇතුලත මේ බෝඩ් ඔක්කොම ගලවලා දානවා.ඒ වගේම මේකත් අහගන්න.මට දීලා තියෙනවා මේ බෝඩ් වලට වගර් මීටරයකට 1000ක් අය කරනවා.ඒ පදනමට පවතින බෝඩ් ටිකට ආදායම ගනනය කරලා ලබා දෙන්න.නැත්නම් මේ අයගේ සේවය නවත්තන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
ඔය මුදල වැඩි කරන්න බැරිද?

මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
අතුරු ව්‍යාවස්ථාවකින් තමයි පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රුවන්දි තිරිමාන්න මිය
මම ගිය සභාවේ මේ ගැන කථා කරාම තමයි ඔය මුදල හෝ අය කරේ.ගුරුවරු කැමතියි සභාවට ගෙවන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා
මට දැන ගන්න ඕනේ ඔය ලක්ෂ දෙකයි ගාන ලැබුනේ උපකාරක පන්තිවල බෝඩ් වලින්ද වෙළඳ ආයතන වල ඒවායින්ද කියලා?
ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් මිය
දෙකෙන්ම තමයි.තව අය කර ගන්න තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා

සභාපතිතුමා ඇත්තටම මේකට අතුරු ව්‍යාවස්ථාවක් සෑදිය යුතුයි.අපෙත් තව යෝජනා තියෙනවා.මම දැක්කා උපකාරක පන්ති බෝඩ් එකක්.එකේ ගුරුවරු තුන්දෙනා වාහන ඉස්සරහා ඉන්නවා නළුවෝ වගේ.මේ විදියේ සංස්කෘතියක් ඇති කරන්න එපා.ඒක නිසා බෝඩ් නිමර්ාණය කරන කොට ගුණාත්මකභාවය ගැනත් හිතන්න ඕනා.ඒ අතුරු ව්‍යාවස්ථාවට ඒකත් ඇතුලත් කරන්න.අධ්‍යාපනය සම්බන්ධ තොරතුරු තිබුණාම ඇති.පින්තූර අවශ්‍ය නෑ.අනිත් කාරණය තමයි ඔය ලැබුණු ලක්ෂ දෙකයි වැඩිපුර තියෙන්නේ ව්‍යාපාරික ප්‍රජාවගේ බෝඩ් වලින් ලැබුණු මුදල්. ඒක නිසා අපිට ආදායම වෙන වෙනම දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික විජේසිංහ මහතා

මේ සාකච්ඡාවේ අපි නොහිතපු,හොඳම පැතිකඩකට සුරේශ් මන්ත්‍රීතුමා යොමු කලා.ඒක බොහොම හොඳ අදහසක්.මේ දැන් තියෙන ටියුෂන් සංස්කෘතිය තුල අපේ දරු පරපුර ගෙනියන්නේ කොතනටද? ඒක නිසා මේකට යම් ප්‍රමිතිගත කිරීමක් කරන්න අවශ්‍යයි.ඒ වගේම බෝඩ් සඳහා අය කර ගන්න මුදල සභාවට ගන්න පුළුවන් වෙන විදියට උපකාරක පන්ති ගුරුවරු හා සභාව අතර අන්තර් සබඳතාවයක් තියෙන්න ඕනා.ඒ වගේම ඒ කමර්ාන්තයේ ඉන්න අයගේ කමර්ාන්තයත් රැකෙන්න ඕනා.ඒ නිසා මේ සම්බන්ධයෙන් හොඳ සම්බන්ධීකරණයක් කලොත් සභාවට උපරිම ආදායමක් උපයා ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් රම්සාන් මහතා

බෝඩ් සම්බන්ධයෙන් කථා කරන කොට අපිට සභාව විදියට ඒකට නිණර්ායක දාන්න පුළුවන්.අධ්‍යාපනය සම්බන්ධ බෝඩ්වලට පින්තූර අවශ්‍ය වෙන්නේ නෑ.ෙවළඳ පුවරු සම්බන්ධයෙන් ගැටළුවක් නෑ.ඒ විදියට යම් වැඩපිලිවෙලක් කරමු කියලා ඉල්ලීමක් කරනවා.

මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා

දැනට අතුරු ව්‍යාවස්ථාවක් තියෙනවා.ඒක අනුව අය කරන්න ඕනා.දැනට අය කරන්නේ නැති අය කරන අයගේ දුවර්ලකම.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

මේ සභාවේ දෙයක් කථා කරන වෙලාවට ඇහුම්කන් දෙන්නේ නෑ.පස්සේ කෑ ගහනවා.මේ අහන්න.අතුරු ව්‍යාවස්ථාවක් තියෙනවා.ඒක අනුව අය කරලා නෑ.දැන් මුදල් ගෙවන්න කියලා 60කට ලියුම් යවලා තියෙනවානේ.ඒ අයගේ මුදල් ගන්නවද නැත්නම් නැවත පරීක්ෂණයක් කරන තෙක් නවත්තනවද කියලා මන්ත්‍රීතුමන්ලා කියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සල්ලි ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා

කලින් බෝඩ් ගහන්න ගත්ත කාලේ අදාල අය සභාවට ගෙවීම් කරලා තමයි ඒ කායර්යන් කරලා තියෙන්නේ කියලා දැන ගන්න ලැබුණා.නමුත් 2019 වගේ ඉඳලා මුදල් අය නොකර දීලා තියෙනවා.නැවත කෙටි කාලයක් තමයි මුදල් අය කරලා තියෙන්නේ.එතකොට එහෙම තීන්දුවක් ගත්තේ මන්ත්‍රීවරුන්ගේ අනුමැතියකින්ද? අතුරු ව්‍යාවස්ථාව හදලාත් මුදල් අය කර නොගත්තේ කියන එක දැනගන්න කැමතියි.

මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා

නෑ.බෝඩ් ගලවන්න තීරණයක් ගත්ත නිසා අය කරේ නෑ කියලා ලේකම්තුමිය කියනවා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා
ඒ වුනාට බෝඩ් ගහන එක නැවැත්තුවේ නෑනේ.ඒ සම්බන්ධයෙන් ගත්ත තීරණය මොකක්ද කියන්න.බෝඩ් ගැලෙව්වෙත් නෑ.මුදල් අය කර ගත්තෙත් නෑ.මොකක්ද මේ සභාවෙන් කරන්නේ?
මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
වගකීම තියෙන අය මුදල් අය කරලා නෑ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා යවන්න ඕනා කොමසාරිස්ට හෝ ඊට ඉහලට. අවුරුදු ගානක් නිලධාරීන් මුදල් අය කරලා නෑ.අක්‍රමිකතාවයක් වෙලා තියෙනවා පරීක්ෂණයක් කරන්න කියලා.අහිංසක මිනිස්සුන්ගෙන් මුදල් අය කරාට මේ වෙන මාෆියාව නැවැත්තුවේ නෑ.මේ සභාවට ඇවිත් දෙවන වාරයෙදී සභාපතිතුමාට කිව්වා බෝඩ් ගලවමු කියලා.ඒක කරේ නෑ.
මේ සභාවට අය වෙන්න ඕනා මුදලක් නේද මේ සභාවට අහිමි වෙලා තියෙන්නේ.මේකට ඔයාලට තේරෙන්නැත්තම් අපි ක්‍රමවේදය හදලා දෙන්නම්.අපිට කමිටුවක් පත් කරලා දෙන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා
සභාපතිතුමා ඇත්තටම මෙතනට මන්ත්‍රීවරු ඇවිත් ඇහුවාම තමයි ඒ දේ මතක් වෙන්නේ.නිලධාරීනුත් ඉන්නවා 200ක් විතර.මොකක්ද මෙතන වෙන්නේ?කිසිම සාධාරණයක් නෑ.අපි මහජනතාවගේ ඡන්දෙන් ඇවිත් තියෙන්නේ.ඔබතුමා අපිට වඩා ඡන්ද අරන් ඇවිත් තියෙන්නේ.කීප දෙනෙක් රකින්න නෙවෙයි ඇවිත් ඉන්නේ.මේ සභාව දියුණු වෙන්න ඕනා.අපි හැමදාම ආදායම වැඩි කරන්න කතා කරනවා.මේ වෙන හොරකම් ගැන කතා කරනවා.මේ න්‍යාය පත්‍රයට වියදම විතරයි දාලා තියෙන්නේ.ආදායමත් දාන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා
දැන් සභාපතිතුමා මේ අවුරුද්දට උපකාරක පන්තිවල බෝඩ් වලට අය කරලා තියෙනවානේ.ඒ අය කරලා තියෙන බෝඩ් ඇරෙන්න ඉතුරු ඔක්කොම ගලවන්න.
මෙරිල් ගරු සභාපති මුණසිංහ මහතා
ආදායම් වාතර්‍ාව මේ තියෙන්නේ.හැම මාසේම ආදායම් වියදම් වාතර්‍ා දාලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
මේ අවුරුද්දට උපකාරක පන්තිවල බෝඩ් වලින් මුදල් අය කර ගෙන නැත්නම් මුදල් අය කර ගන්න එපා.
ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මමනම් කියන්නේ සේරම බෝඩ් ගලවන්න.අවශ්‍යනම් සභාව හරහා එන්න කියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ජයවධර්න මහතා
ගරු සභාපතිතුමනි,අපි නැවත එන්නේ ලබන මාසේ.ඒක නිසා මන්ත්‍රීවරුන්ගේ අත්සන් ලේඛනයක් සහිතව මේ පිලිබදව අදම විමශර්නයක් කරන්න කියලා කොමසාරිස්තුමාට හෝ ඊට ඉහලට ඉල්ලීමක් යැවිය යුතුයි.187 වගන්තිය යටතේ රාජ්‍ය නිලධාරීන් හිතාමතා

රාජකාරිය පැහැර හැරීම සම්බන්ධව විනය ක්‍රියාමාගර් ගන්න කියලා කාරුණිකව ඉල්ලනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සීතා ඩයස් මිය
අපේ දුරකථන දීමනාව දීලා තියෙන්නේ මේවාට නෙමෙයි.ඒක නිසා දුරකථන දීමනාව නැවත ලබා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා
මම ලේකම්තුමියගෙන් විස්තර ඉල්ල ගත්තා.කොම්පෝස්ට් එකේ මැයි වෙනකම් ආදායම රු.27000යි.බෑග් 300ක් අරන් තිබුණා රුපියල් 12000ක.ඉතින් මේ ආදායම් කොහෙද යන්නේ?අපි අහන්නේ ඒකයි.මේ වාතර්ාවේ කොම්පෝස්ට් ආදායම නෑ.ඒකයි අපි වාතර්ා ඉල්ලන්නේ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවධර්න මහතා
ජනවාරි ඉඳලා මේ වෙනකම් කොම්පෝස්ට් එකේ ආදායම රු.27000 යි.පොහොර හැලුවේ නෑ කියලා කියනවානම් ඒ කුණු තොගය තියෙන්න ඕනානේ. ඒ වගේම විදුලිය නෑ වැඩකෙරුණේ නෑ කියනවා.ඒ වුනාට අතිකාල ගෙවලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා
කොම්පෝස්ට් අංගනයේ වෙන දේවල්,ක්‍රියාත්මක වන ආකාරය පිලිබඳ අපිටත් ආරංචි වෙනවා.ඒක නිසා ඒ සම්බන්ධවත් පරීක්ෂණයක් ඉල්ලනවා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රුවන්දි ත්‍රිමාන්න මිය
න්‍යාය පත්‍රයේ 06 වෙනි පිටුවේ අංක 102 හා103 යටතේ මාතෘ අතිකාල දීමනා කියලා දෙකක් දාලා තියෙනවා.
ලේකම් ඩබ්.ඒ.එම් අයි.එස් තෙන්නකෝන් මිය
ඒක බලලා කියන්නම්.

ගරු උප සභාපති ලලත් රණසිංහ මහතා
මම යෝජනා කරනවා ඒ විස්තර ඉදිරිපත් කරනකම් ඉතුරු යෝජනාවලට යන්න කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා
මතභේද වෙලා තියෙන යෝජනා ඔක්කොම මහසභාව ගෙවීම් ප්‍රතික්ෂේප කරන්න.විමශර්ණයක් කරලා ඒවා නීත්‍යානුකූල කරලා ගෙවන්න.

**6.2** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-

**6.2.1** මෙම සභාවේ ඉන්ධන භාවිතය 10%කින් වත් අඩු කිරීමට සැලසුම් සකස් කරන ලෙසත් ඊට ආදශර්යක් ලෙස සභාපතිතුමාගේ අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය ඉවත් කර අනුමත රු.60000/= ක සීමාවට සීමා කල යුතු බවට ගරු සභාවට කරන ලද යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ජයවධර්න මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.2.2** මෙම සභාව රටට ආදශර්යක් ලෙස සවර්පාක්ෂික සභාවක් බවට පත් කල යුතු බවට ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ජයවධර්න මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාවට අදහස් දැක්වීමෙන් පසු සභා සම්මත විය.

ගරු උප සභාපති ලලත් රණසිංහ මහතා
දැනටමත් සවර්පාක්ෂික සභාවක් වෙලා තියෙන්නේ.ඒක නිසා ඒක සංශෝධනය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

ඇත්තටම මම සතුටු වෙනවා.අද මේ කථා කරපු කාරණා සම්බන්ධව සියලු දෙනා එකඟ වුණා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම මේ සම්න්ධව අදහසක් කියන්නම්.මොකද මේක මම පාවිච්චි කරන වාහනය නිසා.මේ වාහනේට හතරවෙනි මාසේ වැය කරලා තියෙනවා ඩීසල් ලීටර් 260ක්. ජුනි මාසේ මේ වෙනකොට ලීටර් 190ක දුවලා තියෙනවා.ඩීසල් වාහනේ තියෙනවා.දැන් සති 2ක ඉඳලා මේ වාහනය දුවන්නේ නෑ.මේ කැබ් රථ දෙකම නවත්තන්න තීරණයක් ගන්න.අපි ත්‍රීවිලර් වලින් යන්නම්.මේ ලලිත් මහත්තයා තමයි සභාවේ යෝජනාවෙදී ලීටර් 600ක් දුන්නේ.බස්නාහිර පලාත් සභවේ ප්‍රධාන ඇමතිතුමා ගැසට් කරලා සියලු පලාත් පාලන ආයතනවලට දීපු එකක්. මම අද සභාවට ආවේ රු.25000 දීමනාව නවත්තන්න හිතාගෙන.නමුත් මම මන්ත්‍රීවරු ගැන හිතලා එහෙම කරන්නේ නෑ.ආථර්ික අබර්ුදයත් එක්ක ගැටළු තියෙනවා.මම මේ දීමනාව ලබන මාසේ ඉඳලා ගන්නේ නෑ.අපිට වියදම් අඩු කරන්න කියලා තියෙනවා.මම මගේ මහජන සම්බන්ධීකරණ නිලධාරී දීමනාව අයින් කරනවා.අනවශ්‍ය කම්කරුවන් පත් කරලා තියෙන ඒවා අයින් කරනවා.සමහර මන්ත්‍රීවරු දන්නවා මම නාස්තිකාර වියදම් කරපු කෙනෙක් නෙවෙයි.ඒක නිසා මම කියන්නේ මේ කැබ් දෙකම නවත්තන්න.එතකොට අළුත්වැඩියා,සවර්ස් වියදම් නවතිනවනේ.මේවා ඕනේ නෑ.අපිට ත්‍රීවිලර් එකේ යන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හින්ටන් මද්දගේ මහතා

ඒක රටට ආදශර්යක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

ඇත්තටම අපිට ඉන්ධන ලීටරයක් හෝ පිරිමහන්න පුළුවන්නම් ලොකු දෙයක් .අපේ රටට ඩොලර් නැතුව ඉන්නේ.ඒක නිසා දවසට එක වාහනයක් යටදොලට,ගල්මත්තට යවනකොට යවන්න. සභාපතිතුමා කියනවානම් මම මේ යෝජනාව ඉල්ලා අස් කර

ගන්නම්. අපි හැම තිස්සෙම කථා කරන්නේ ආදායම වැඩි කරන්න මේ සභාවේ.ඒ වගේම වියදම් අඩු කරන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

නෑ.දැන් සම්මත වෙලානේ තියෙන්නේ.ඉල්ලා අස්කර ගන්න ඕනේ නෑ.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

සභාපතිතුමා ඒකට ආදශර්යක් දෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

එහෙනම් මම යෝජනාව ඉල්ලා අස් කරගන්නම්.ඒක මට ගැටළුවක් නෑ.ඒ වගේම අපිට දෙන්න එපා ඔබතුමාගේ පැත්තේ දක්ෂ මන්ත්‍රීවරු ඉන්නවා.ඒ අයට වගකීම බෙදලා දෙන්න.ජේ.සී.බී,ත්‍රීවිලර් ඒවායේ වගකීම බෙදලා දෙන්න.විදුලි බල්බ සවි කිරීමත් කාලෙකින් වුණේ නෑ.ඒක නිසා මේවයේ විධිමත් පාලනයක් ඇතිවෙන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ජයවධර්න මහතා

සුජීව මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඉල්ලා අස් කර ගත්තා.ඒ පිලිබදව සතුටු වෙනවා.මෙතන ඉන්න මන්ත්‍රීවරු චෝදනා කරන්නේ ඔබතුමා හොරකම් කරනවා කියලා නෙවෙයි.අපි සියලු යෝජනා ගේන්නේ මේ සභාව නිවැරදිව හදන්න.

**6.3** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-

**6.3.1** ඉදිරියේදී මුහුණ පෑමට නියමිත ආහාර හිඟයට මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම හා ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීම අවශ්‍ය උපදෙස් හා බීජ පැල කාබනික පොහොර හා අප සභාව මගින් ලබා දිය හැකි සහයෝගය ලබා දී ඉදිරියේදී ඇති විය හැකි ආහාර හිඟයට කඩිනම් විසදුමක් ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

මේ සම්බන්ධව කථා කරන කොට සභාවෙන් ක්‍රියාත්මක වුණ සංවධර්න ව්‍යාපෘති ගැන අපිට ලොකු ගැටළුවක් තියෙනවා.පසුගිය අවුරුදු 04 තුල මේ මන්ත්‍රීවරු යෝජනා කරා ගෙවතු වැඩ සටහන් කරමු,කසළ කළමණාකරණය කරමු කියලා .නමුත් ඒ එක ව්‍යාපෘතියක්වත් මේ සභාවේ කෙරුණේ නෑ.ඒක මේ ආහාර අබර්ුදයට හේතුවක් වෙලා තියෙනවා.මම යෝජනා කලා කසල කළමණාකරණය ගෙවත්තේම කරලා ඒ හරහා ගෙවතු වගාවක් කරමු කියලා.අද වෙනතුරු ඒක සාකච්ඡා වුණේ නෑ.මේ සම්බන්ධ දැනුම තියෙන නිලධාරීන් මේ සභාවේ ඇති,ගොවිජන සේවා එකේ නිලධාරීන් ඉන්නවා.ප්‍රාදේශීය ලේකම් එකේ ඉන්නවා.ඒ අය වගේම මන්ත්‍රීවරුත් සම්බන්ධ කරගෙන දීසර්කාලීන වැඩ පිළිවෙලකට යමු අපි.අපිට කාබනික වගාවට යන්න පුළුවන්නම් ඒක තමයි හොඳම සංකල්පය.රටේ තිබුණ මුදල් සංචිත අනවශ්‍ය භාවිතයන්ට යාම තමයි මේ අබර්ුදවලට හේතුව.මේ ආහාර අබර්ුදය සියලු දෙනාට

බලපානවා.ඒක නිසා සියලු දෙනාට යමක් වෙන විදියේ වැඩ පිලිවෙලක් හදමු.නැතුව ඔබතුමා කිව්වා වගේ ඔබතුමාගේ තියෙන ප්‍රජා මණ්ඩල වල ඉන්න අය කැඳවලා ඒ අයට විතරක් දෙන එක නෙවෙයි වෙන්න ඕනේ සභාපතිතුමා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ප්‍රජා මණ්ඩල පිහිටුවන්න ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දුන්නා.ඒක කරගෙන ගිය කොට්ඨාශවල ඒ ආයතන සමීප නිසා ඒවා ගත්තා.නැත්නම් ගමක වගා සමිතියක් තියෙනවානම් ඒක ගන්න පුළුවන්.මගේ ප්‍රජා මණ්ඩල කියලා වැරදි අදහසක් දෙන්න එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා

මම කියන්නේ ඒක සාකච්ඡා කරන්න කමිටුවක් හදන්න මන්ත්‍රීවරුන්ව දාලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඉතින් කමිටුවක් යෝජනා කරන්න.කමිටු හදන්න කියලා ගිහින් වැඩක් නෑ.අපි ඒවාට විරුද්ධ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

මමනම් කියන්නේ වැඩක් නැති කමිටු පිහිටුවනවට වඩා හොඳයි කොට්ඨාශයට වගකියන මන්ත්‍රීවරයෙක් ඉන්නවනේ.ඉතින් ඒ මන්ත්‍රීවරයා ඉන්නකොට තව කමිටු මොකටද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

වැඩි කැමැත්ත ඒකට නම් ඒ විදියට ක්‍රියාත්මක වෙන්න.මන්ත්‍රීතුමාගේ අදහස් කියන්න.ඒක හොඳ යෝජනාවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා

මම කියන්නේ ඔබතුමාලා හෙට දවසේ ක්‍රියාත්මක කරන්න නියමිත වැඩසටහන පක්ෂපාට භේදයකින් තොරව සියලු දෙනා,නිලධාරීන්, ගමේ මිනිස්සුත් එක්ක එකතු වෙලා යන වැඩපිලිවෙලක් මම යෝජනා කරේ.ඒක නිසා අනිත් මන්ත්‍රීවරුන්ගෙත් අදහසුත් අරගෙන සියලු ග්‍රාමසේවා වසම්වල ඔබතුමා මැදිහත් වෙලා මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න කියන යෝජනාව මම කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා

මන්ත්‍රීතුමාගේ යෝජනාවට පලමුව ස්තුතිවන්ත වෙනවා මේ වෙලාවේ මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව.ඒ වගේම සෑම කොට්ඨාශයකම කෘෂි පයෙර්ෂණ නිලධාරීන් ඉන්නවා. රජයත් ගැසට් කරා වගා ෙනාකරන භූමි ප්‍රදේශ රජයට පවර ගන්නවා කියන එක.මම හිතන්නේ මිනිස්සුන්ගේ අදහසක් කැමැත්තක් ඇතිවෙලා තියෙනවා මේ ප්‍රශ්නය ජය ගන්නනම් වගා කරන්න ඕනේ කියන එක ගැන. අද අපේ සභාවේ මන්ත්‍රීවරුත් පක්ෂ පාට භේදයකින් තොරව එක මතයකට ඇවිත් ඉන්නවා.මේක

තමා විය යුත්තේ.මේ වෙලාවේ අපි සියලු දෙනාගේම පොදු සතුරා ආර්ථික සතුරා.ආර්ථිකය නගා සිටුවන්න කෘෂි කමර්ාන්තය දියුණු කරන්න පුළුවන්,සංචාරක ව්‍යාපාරය පැත්තෙනුත් දියුණු කරන්න පුළුවන් ප්‍රදේශයක් තමයි අපේ ප්‍රදේශය. කෘෂි පයෙර්ෂණ නිලධාරීන් ගෙන්වලා මේ සඳහා සක්‍රීයව හා විධිමත්ව දායකත්වය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.සුරේශ් මන්ත්‍රීතුමා කිව්වා වගේ දමිළ ජනතාව තමයි මේ වෙලාවේ විශාල වශයෙන් අසරණ වෙලා ඉන්නේ.ඒක නිසා පක්ෂ පාට භේදයකින් තොරව මේ මානුෂීය කටයුත්තට දායක වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා

සුරේශ් මන්ත්‍රීතුමාගේ යෝජනාව පිලිබඳ කතා කරන්නේ. මේ වකවානුවේ බලපාලා තියෙන ව්‍යාසනයක් හමුවේ තමයි අද අපි හැමෝම ඉන්නේ.ගෑස්,කිරිපිටි,ඒ වගේම සතොස පෝලිම් වල මිනිස්සු ඉන්න වෙලාවක කාලෝචිත යෝජනාවක් තමයි මෙතුමා කරලා තියෙන්නේ.ඉස්සර කාලේ අක්කර ගනන් වගා කරපු අපි අද පිටරටින් හාල් ගෙන්වන තත්වයට පත්වෙලා.අපි ඔබතුමාලා සම්බන්ධ වෙලා මීට පෙර මිනිස්සුන්ට හවභෝග බෙදලා දුන්නා.නමුත් ඒවයින් සෑහීමකට පත් වෙන්න බෑ.අද මිනිස්සු වගා කරන්න බලාගෙන ඉන්නවා.රජයේ නිලධාරීන් ඉන්නවා.විශේෂයෙන් සංවධර්න නිලධාරීන් ඉන්නවා.මේ අය මොකටද ඉන්නේ කියන එකයි ප්‍රශ්නේ. ඒ වගේම මේ කෘෂිකමර් නිලධාරීන් ඉන්නවා.අපේ ගම් පලාත් වල මේ අය කරපු එක ව්‍යාපෘතියක් නෑ.මිනිස්සුන්ට කතා කරලා අවශ්‍ය උපදෙස් ටික දුන්නේ නෑ.ප්‍රාදේශීය සභාව තියෙනවා,ප්‍රාදේශීය ලේකම් එක තියෙනවා.නමුත් කොම්පෝස්ට් ටිකක් ,පොහොර ටිකක් දුන්නේ නෑ. දැන් අපි දැක්කා පොහොර වලට වෙලා තියෙන දේ.නමුත් හැම කෙනාම බනින්නේ දේශපාලඥයන්ට.75%ක් රාජ්‍ය සේවකයෝ මේවට වගකියන්න ඕනා.ඒ වගේම පසුගිය දවසක පෙර පාසල් සිඟිති පොලක් තිබිලා ඒක විවෘත කරේ පරාද වුණ මන්ත්‍රීවරයෙක්.මම ලේකම්තුමියගෙන් ඇහුවම උප කායර්ාලයෙන් අහන්න ඕනේ කිව්වා.එතකොට ලේකම්තුමිය වැඩ කරන්නේ උප කායර්ාල කියන විදියටද?අපි මහජන ඡන්දෙන් ආවේ.අද මම ස්වාධීන වෙන්න හේතුව සභාපතිතුමා දැන ගන්න ඕනා.ගම්වල ඉන්න මන්ත්‍රීවරුන්ට වැඩ කරගෙන යන්න අවශ්‍ය කරන සැලසුම ක්‍රියාත්මක කරලා දුන්නේ නෑ.ඒ නිසා අපි අද අසරණ වෙලා.මහජනතාව අපෙන් අහනවා මොනවද කරේ කියලා.එතකොට ලේකම්තුමිය උපදෙස් ගන්නේ උප සභා කායර්ාලවලින්ද?ඒක මහ සභාව දැන ගන්න ඕනා.සභාපතිතුමාට අපිට මහජන නියෝජිතයෝ විදියට ආරාධනා නොදෙනවානම් මේ ලේකම්තුමිය ඇතුළු රාජ්‍ය නිලධාරීන් ඒවා ක්‍රියාත්මක කරන්න ඕනා. මේ විදියට මිනිස්සු අතරට අපිට යන්න අවකාශයක් ලැබෙයි කියලා මම හිතන්නේ නෑ.ඒ වගේම සෞභාග්‍යයේ දැක්ම යටතේ හැටනව ලක්ෂයක් ඡන්දේ දුන්නා.ඉතිහාසගත ජයක්.තරුණ පිරිස වෙනසක් ඇති කරන්න කියලා ඒ අයගේ සිතුවිලි සිතුවම් කරා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් කතා කරලා ඉවර කරලා ඊට පස්සේ ඔය සම්බන්ධව කතා කරමුද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා

මේ සම්බන්ධව තමයි කථා කරන්නේ.ඒක අපේ අයිතිවාසිකම.ඔබතුමාලා කතා කරන්න එපා කියනවානම් මම නිහඬ වෙන්නම්.එදත් කරේ අපිව නිහඬ කරපු එක. මම කිව්වේ මේ ආහාර සංස්කෘතිය ගැන. එදා කුඹුරට බැහැලා ගොවිතැනට යොමු වුණු තරුණයෝ අද අරගල කරන තත්වයට පත්වෙලා.ඒ නිසා සුරේශ් මන්ත්‍රීතුමාගේ යෝජනා යටතේ ගෙයින් ගෙට ගිහින් හරි ගමේ මිනිස්සු රැස් කරලා,මන්ත්‍රීවරු සම්බන්ධ කරලා සභාවෙන් මේ දේ කරන්න. අපි ජනතාව වෙනුවෙන් ආවනම් මේ මොහොතේ තමයි ජනතාව වෙනුවෙන් උදව් කරන්න ඕනා.අනිත් කාරණය තමයි ලේකම්තුමියට කියන්න ඕනා මේ මොහොතේ,"ලේකම් මිස් අපි බොහෝ කාලයක ඉඳන් දේශපාලනය කරන්නේ.හැබැයි මම ඉල්ලා සිටිනවා මේ විෂය හරියට දන්නේ නැතිනම් මම වගේ කෙනෙක්නම් ලේකම්තුමිය,ඉල්ලා අස් වෙනවා. "

ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා

ලේකම්තුමිය අස් වෙන්න දැනුම් දුන්නා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා

අයින් වෙන්න ඕනා.සභාපතිතුමාට බැරිනම් ඔබතුමාත් අයින් වෙන්න කියලා ඉල්ලනවා.කොට්ඨාශ 57 මේ වෙනකොට කිසිම වැඩපිළිවෙලක් ඔබතුමාගේ නෑ.ඒ නිසා තමයි මන්ත්‍රීවරු වශයෙන් අපි ස්වාධීන වෙන්නේ.මේ මන්ත්‍රීවරුන්ගේ එක යෝජනාවක් මේ වෙනකොට ක්‍රියාත්මක වෙලා නෑ.ඒ නිසා අපි මේ විදියට කියන්න ලැබීම ගැන කණගාටු වෙනවා. අපි වගේනම් ඉල්ලා අස්වෙලා.මේ මන්ත්‍රීවරු සියලු දෙනා කියන්නේ ඒක.මේ සභාවේ කිසිම නිලධාරියෙක් ඔබතුමාට යටහත්පහත්ව ඉන්නවද කියන එක අපිට කුතුහලයක්. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ආහාර අබර්දය සම්බන්ධයෙන් මේ මිනිස්සුන්ට යම් සහනයක් ලබා දෙන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිමර්ාල් විජේසිංහ මහතා

අපේ සුරේශ් මන්ත්‍රීතුමා කාලෝචිත හොඳ යෝජනාවක් කරේ.මෙතනදි අපේ සෑම කොට්ඨාශයකටම මන්ත්‍රීවරු ඉන්නවා.මේ මන්ත්‍රීවරු සියලු දෙනා මේ කායර්යේදී තමන් ආදශර්මත් වෙන්න.තමන් වගා කරලා තමන්ගේ ආහාර නිෂ්පාදනය කරගෙන ඒ ආදශර්ය ගමට දෙන්න.මමත් වගා කරලා තියෙනවා.ඉතා සුළු ප්‍රමාණයක් තමයි වෙළඳපොලෙන් ගන්නේ.ඒ වගේම අපි ජනතාව දැනුවත් කරන්න ඕනේ සැබවින්ම පෝෂණය තියෙන්නේ මොන වගේ දේවල් වලද කියන එක.එළවළු,ඒ වගේම වැඩිපුරම විටමින් හා ඛනිජ ලවන තියෙන පලා වගර් වගේ දේවල් වලින් ජනතාවගේ පෝෂණය වැඩි කරන්නයි අපි කටයුතු කරන්න ඕනා.ඒ වගේම කියන්න ඕනා මම වේල් දෙකයි ආහාර ගන්නේ.රාත්‍රියට නිරාහාරව ඉන්නවා.ඒක සිල් පදයක් ආරක්ෂා කිරීමක් වගේම ඒකෙන් ලැබෙන ආනිසංස ගැනත්  බුදු හාමුදුරුවෝ කියලා තියෙනවා.එමගින් අපේ ශරීරය ලෙඩ රෝගවලින්

ආරක්ෂා කරනවා.මම මේ වෙලාවේ විශේෂ ස්තුතියක් කරනවා. කෝරළේයාගම සරණතිස්ස හාමුදුරුවන්ගේ බණක් අහලා තමයි මම මේ ක්‍රමවේදය අනුගමනය කරේ.එතකොට බෙහෙත් වලට යන වියදමත් අඩු වෙනවා.රටේ ආහාර පෝෂණයත් ශක්තිමත් වෙනවා.ඒක නිසා මේ පිලිබඳ සියලු දෙනා දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පුෂ්පා නන්දනී මිය

මම මීට වසර දෙකකට පමණ පෙර ඔබතුමාට යෝජනාවක් කරා රජයේ පවතින හිස් ඉඩම් වල වගා කිරීමේ කටයුතු ආරම්භ කිරීම යටතේ හා දැනට පවතින ආහාර හිඟය හේතුවෙන් වැල්කන්දල වල් බිහි වී තියෙන අක්කර 04ක පරණ පාසල් භූමිය ඔසු උයනක් සඳහා ගන්න කටයුතු කරන්න කියලා.ඒක මේ වෙනකම් කෙරුණේ නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒක මෙහෙන් යවලාද කියලා බැලුවද ඔබතුමිය?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පුෂ්පා නන්දනී මිය

මට කිසිම දැනුම් දීමක් කරලා නෑ.මේ වෙන කොට අපේ ප්‍රදේශයේ පවතින රණවිරු ගම්මානය, ගමේ ඉඩම් අහිමි පුද්ගලයන් 34 දෙනෙක් පමණ ඒ කැලේ ශුද්ධ කරලා බෝග වගා කරනවා. මමත් ඒකේ කොටසක් අරගෙන තියෙනවා.මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්තුමිය ආපු වෙලාවේ මම ඔබතුමා සම්බන්ධ කර ගන්න උත්සාහ කරා.උපදෙසක් ගන්න.නමුත් බැරි වුණා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ප්‍රාදේශීය ලේකම්තුමිය එහෙම දෙයක් කරනවානම් අපිව දැනුවත් කරන්න ඕනා.මේ ආයතන තනි තනිව යන්නේ.ඒකයි මේ ගැටළුව වෙලා තියෙන්නේ.පස්සේ අපිට චෝදනා කරනවා.ඒ වගේ තමයි සමහර ආයතන වලට ලියුම් ඇරියත් කිසි ප්‍රතිචාරයක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි පුෂ්පා නන්දනී මිය

මම ඒ වෙලාවේ ඔබතුමාව සම්බන්ධ කර ගන්න හැදුවේ අපි මොකක්ද ගන්න ක්‍රියාමාගර්ය කියන එක ගැන උපදෙසක් ගන්න.නමුත් අපිට මේ වෙනකොට අනුප පැසුකුවල් මහතා ලිඛිතව අවසර දීලා තියෙනවා වගා කටයුතු සඳහා පමනක් ඒ ප්‍රදේශය භාවිතා කරන්න කියලා.මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා අපිට අවශ්‍ය කරන කොම්පෝස්ට් ටික හෝ ලබා දෙන්න කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මෙහෙමයි. මේකේ පරිමාණයක් තියෙන්න ඕනානේ.සාමාන්‍යයෙන් කොට්ඨාශයකට 50කට වගේ ප්‍රමාණයකට වගා කරන්න කොම්පෝස්ට් දෙන්නම්. නැත්නම් පොරොන්දු වෙලා දෙන්න බැරි වුනොත් ගැටළුවක් වෙනවනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි පුෂ්පා නන්දනී මිය

මෙතන භූමියේ අක්කර 14ක් තියෙනවා.ඔක්කොම අපිට ලැබිලා නෑ.පවර්ස් 20,30 වගේ තමයි වගා කරන්නේ.ගරු සභාපතිතුමනි ඒ වගේම මේ පාසල් වත්ත ගැන ආයිත් මම කතා කරන්නේ.පාසලේ ඉඳපු ළමයි වෙනත් පාසලකට දාලා තියෙනවා.දැන් ඒ දමිළ විද්‍යාලය හිස් ඉඩමක් වෙලා තියෙනවා.අපිට මේ වෙලාවේ ඒක ප්‍රාදේශීය ලේකම් එකෙන් පවර ගන්න ලේසියි.ඒක නිසා මේක වගා කටයුතු සඳහා යොදා ගන්න කියලා යෝජනා කරනවා.නැතිනම් නැති බැරි අයට මේ ඉඩම ලබා ගන්න කියලා ඉල්ලීමක් කරනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මන්ත්‍රීතුමිය ඔය සම්බන්ධයෙන් පසු විපරමක් කරන්න.ඔබතුමිය ඇවිල්ලා සම්බන්ධ වෙලා කරන්න. ඔබතුමිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට දාන්න යෝජනාවක්.ගමේ ඉන්න ග්‍රාම නිලධාරීතුමාවත් සම්බන්ධ කරගෙන කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා

මේ වගා සංග්‍රාමයට සමගාමීව අපේ ප්‍රදේශයෙත් අක්කර 10,15 කුඹුරු කරන්නේ නෑ.ඒකට ප්‍රධාන හේතුව සංවධර්න යෝජනා නවත්තලා තියෙනවා.කොහොම වුනත් අපි දැනුවත් කිරීමක් කරන්න ඕනා කෘෂි කමර් අමාත්‍යාංශයට මේ ඇලවේළි ශුද්ධ කරලා දෙන්න කියලා.මොකද අපේ ප්‍රදේශ වල ගොඩක් කුඹුරු එරෙනවා.ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.ඒ වගේම මේ වගා කටයුතු වලදී පලමුව අපි ආදශර්මත් වෙන්න ඕනා.අපි වගා කරලා තියෙනවා.ඒ වගේම අළුත්ගම්ගොඩ සේවා පියස,මාතෘ සායන භූමිය,තව LRC ඉඩම තියෙනවා.මේවා යම් කිසි සමිතියකට දීලා මේ වැඩ පිළිවෙල කරගෙන යමු කියලා ඉල්ලා සිටිනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

අපිට සභාවෙන් ඒක කරන්න බෑ.අපි ගොවිජන සේවා ,ප්‍රාදේශීය ලේකම් ඒකට කිව්වා.ඒ අය ඒවා කරේ නෑ.සල්ලි වෙන් කරලා තියෙන ව්‍යාපෘති පවා චක්‍රලේඛණය නිසා කරේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ගරු සභාපතිතුමනි,ඇත්තටම හොඳ,කාලෝචිත යෝජනාවක්.අපි මේ සඳහා සැරසෙනකොට මීට අවුරුදු ගානකට පෙර මේ දේවල් දැකලා තේරුම් ගත්ත පිරිසකුත් අපේ රටේ ඉන්නවා කියන ඒක අපි දැක්කා.මමයි කාන්ත මන්ත්‍රීතුමායි මාතලේ නකල්ස් කියන ප්‍රදේශයට ගියා.එහේ තියෙනවා හුදකලා ගම්මානයක්.අපි ඒ මිනිස්සු එක්ක කථා කරා.ඒ අය නගරයට යන්නේ පෙට්‍රල්,ඩීසල්,සහ බෙහෙත් ගන්න විතරයි කිව්වා.එතන නිවාස 50ක් පමණ තිබුණා.ඒ අයට පරිභෝජනයට අවශ්‍ය සියලු දේ ඒ අය වගා කරගෙන තියෙන්නේ.ඉතින් මේවා බලලා අපි ආදශර්යක් ගන්න ඕනේ. ඇත්තටම අපිට වගා කරන්න රසායනික පොහොර අවශ්‍ය නෑ.මම අක්කර එකහාමාරක් වගා කරලා තියෙනවා

මේ වෙන කොට.අක්කර 15 ක් මගේ කොට්ඨාශයේ සෞභාග්‍යයේ දැක්ම යටතේ වගා කරනවා.ඉතින් අපි මේ වගාවට යොමු වෙනවානම් මේ රට ස්වයංපෝෂිත කරන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාමල් ප්‍රදීප් මහතා

රටේ තත්වය අනුව බලන කොට ඉතා කාලීන යෝජනාවක්.මේ යෝජනාව මාතර්‍ු මාසේ අපිත් ඉදිරිපත් කරා.ඒ වෙලාවේ අපි කිව්වා ගොවිජන සේවා එක සම්බන්ධ කරගෙන මූලික දැනුම අරගෙන සභාව මැදිහත් වෙලා මේ දේ කරමු කියලා.අපේ මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා තමන් සතු දැනුමින් දැනට වගා කටයුතු කරගෙන යනවා.ඒක හොඳ දෙයක්. 2022 අයවැයෙන් ලක්ෂ 10ක මුදලක් ගෙවතු වගාවට වෙන් කරලා තියෙනවා මම දැක්කා.අපිට මේ වෙනකොට මේ කොට්ඨාශවලට වෙන් කරපු මුදල් යොදවලා සාර්ථක වගාවක් කරන්න බැරි වෙලා තියෙනවා.මේ සඳහා අවශ්‍ය බීජ ,පැළ,දැනුම නැතුව ඉන්නවා.මේ නිලධාරීන් මේ සම්බන්ධව කටයුතු කරන්නේ නෑ.අපි නිලධාරීන්ට දිගින් දිගටම චෝදනා කරනවා නෙවෙයි.ඒ වුණාට මේ කොම්පෝස්ට් ටික එක එක අය අවභාවිතා කරනවා.ඒ නිසා ඔබතුමා මැදිහත් වෙලා මේ ලක්ෂ 10 ඉදිරි සතිය තුල ඵලදායීව යොදා ගෙන අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.නැත්නම් මිනිස්සු දොස් කියන්නේ අපිට.අවසාන වශයෙන් යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව සුරේශ් මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි තුසිතා ප්‍රියංගනී මිය

සුරේශ් මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතා හොඳ කාලෝචිත යෝජනාවක්.ඒ වගේම පසු ගිය දවසක අපේ ප්‍රදේශයේ අනූප පස්කුවල් මහතාගේ ප්‍රධානත්වයෙන් ව්‍යාපෘතියක් කරලා තියෙනවා.අපි සම්බන්ධ කර ගත්තේ නැති වුනත් කමක් නෑ.ඒ වැඩ පිළිවෙල දුෂ්කරතා මැද්දේ කරගෙන යනවා.මෙහෙ කොම්පෝස්ට් හදන නිසා ඒ පොහොර වලින් ප්‍රමාණයක් අපේ කොට්ඨාශවල යම් තැනකට ගෙනල්ලා දෙනවානම් ගෙවතු වගා කරන අයට ඒක ලොකු සහනයක්.අවශ්‍යතාවය තියෙන කෙනාට ගන්න පුළුවන්.ඒකෙන් සභාවට ආදායමකුත් ලබා ගන්න පුළුවන් නිසා ඒ සඳහා අවශ්‍ය කටයුතු කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

සුරේශ් මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමේදී එතුමා කියපු විදියට කමිටුවක් පත් කරන්න අවශ්‍ය වෙන්නේ නෑ මම හිතන විදියට.ඒ සඳහා මේ සභාවේ උනන්දුවක් විතරයි අවශ්‍ය වෙන්නේ.කොට්ඨාශවලට වගකියන්න මන්ත්‍රීවරු 34 දෙනෙක් ඉන්නවා.මෙතන තියෙන්නේ එකතු වෙලා වැඩ කරන්න බැරිකම.දේශපාලන අරමුණින් වැඩ කරන එක තමයි ලොකුම ප්‍රශ්නේ.ඒක නිසා ගමේ ඉන්න මන්ත්‍රීවරු එකතු කරලා මිනිස්සු සම්බන්ධ කරලා මේකට යොදවන්න.එහෙමත් බැරිනම් සභාවේ පක්ෂ හෝ විපක්ෂ මන්ත්‍රීවරයෙක් වැඩ සටහනක් හදලා ඒකට අවසරය අරගෙන කරන්න අවශ්‍ය

කටයුතු කරලා දෙන්න. ඒ වගේම අපේ ධම්මික මන්ත්‍රීතුමා ආහාර පරිභෝජන රටාව සම්බන්ධ හොඳ කතාවක් කළා.දැනුවත් වුනත් අද මේවා මිනිස්සු පරිභෝජනය කරන්නේ නෑ.මේ දේශපාලඥයෝ විතරක් නෙවෙයි මේ සමාජයේ ඉන්න මිනිස්සුත් මේවට වගකියන්න ඕනා.ඒක නිසා මම හිතනවා මුලින්ම අපි දේශපාලඥයෝ විදියට ගමේ යම් වැඩක් පටන් අරගෙන මිනිස්සු සම්බන්ධ කරගෙන සභාවෙන් දෙන්න පුළුවන් දායකත්වය ලබා දෙමු කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා

ඇත්තෙන්ම සභාපතිතුමා ගම්බද බැලුවොත් රජයේ නිලධාරීන් ක්‍රියාත්මක වෙනවා අඩුයි.අපේ ගමේ යෞවන සමාජයක් නෑ,ක්‍රීඩා සමාජයක් නෑ.ගොවි සමිතියක් තියෙනවා.යල කන්නය,මහ කන්නය දන්නේ නෑ.ඒ අය දැනුවත් කරන්න ඕනා.ගුණාත්මක දේවල් ගැන දැනුවත් කරන්න ඕනා.ඒ නිසා මිනිස්සු දැනුවත් කරන්න වැඩපිළිවෙලකුත් ඒ සමඟම ආරම්භ කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය

ගරුසභාපතිතුමනි,බෝපිටිය ප්‍රජා මණ්ඩලයට වගා කිරීම සඳහා පොහොර හා බීජ සහනාධාරයක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

අපි මෙහෙම කරමු.ග්‍රාම සේවා වසමකට පනස්දෙනෙකුට පෙහොර දෙමු.නැත්නම් ලොකු ඉඩම් වලට විතරක් දෙන්න ගියොත් ඒක හරියන්නේ නෑ.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

සුරේශ් මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් අදහසක් ඉදිරිපත් නොකලොත් ඒක හොඳ නෑ කියලා හිතුනා.ඒකයි මම මේ කතා කරන්නේ.මම එක්සත් ජාතික පක්ෂ කාලේ සභාපති වෙලා ඉන්නකොට ඉන්දියාවේ යන්න අවස්ථාවක් ලැබුණා.ඒ ගියේ කෘෂි කමර්ය පිලිබඳ අධීක්ෂණ වැඩසටහනකට.කොම්පෝස්ට් හදන එකක් ගැන තමයි තිබුණේ වැඩසටහන.එයාලා ඒකට අශූචි භාවිතා කරනවා.මේ රටේ අශූචි වලින් පොහොර හදලා ආවම ඒකට බනිනවා.ඒ වගේම දැන් යූරියා ටික ගේන්න හදනවා.ඊට ඉස්සෙල්ලා මෙහෙ තත්ව පරීක්ෂණ තියලා ඉවරයි.වැව් දහසක් හදන්න පෝස්ටර් ගැහුවේ. පෝස්ටර් ගැහුවේ කවුරුවත්.ගුටි කෑවේ අපි.හදපු වැවකුත් නෑ යන්න ගියා.අදත් භාර ගන්නේ නෑ. මම කියන්නේ අපි ආදශර්මත් වෙන්න ඕනා.ඉතින් මේ යෝජනාව බොහෝම හොඳ යෝජනාවක්.ඒ වගේම ධම්මික මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය ගැනත් ස්තුතිය පුද කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා

ඇත්තටම කමිටුවක් පිහිටුවීමේ අවශ්‍යතාවය පැහැදිලි කරේ අපි ගෙවල් වල වගා කරගන්න ඕනා වගේම මේක මීට එහා යන්න ඕන වැඩපිලවෙලක් නිසා.අපි ගෙවල් වල වගා කළොත් අනවශ්‍ය විදියට මුදල් වියදම් කිරීමක් කරන්නේ නෑ.රසායනික පොහොර වලට මුදල් වියදම් කිරීම අඩු වෙනවා.වානිජ වශයෙන් වගා කරන කෙනෙක්ට පුළුවන් ඒ

අස්වැන්න විදේශයන්ට යවන්න. අන්න ඒ මට්ටමට දියුණු වැඩ සටහනක් හදන්න පුළුවන්නම් අපිට ඩොලර් ගෙන්න ගන්න පුළුවන්.ඒ සඳහා මිනිස්සු දැනුවත් කරන්න ඕනා.අපි කමිටුවක් හදා ගත්තම ගම්වල කුඩා කණ්ඩායම් හදලා බීජ වගර් හුවමාරු කර ගන්න පුළුවන් වැඩ පිළිවෙලකට යා යුතුයි.හැමෝටම බීජ ගන්න,පොහොර ගන්න සල්ලි නෑ.මිනිස්සු ආර්ථික අපහසුතාවයෙන් ඉන්නේ.කමිටුවක වැදගත්කම ඒකයි.ඒක නිසා ඒකට වැඩ පිලිවෙලක් හදන්න. ඒ වගේම නිශාන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ අපේ ප්‍රදේශයේ කුඹුරු එරෙනවා.ඒකට හේතුව තමයි තාක්ෂණ දියුණුවත් එක්ක මහා පරිමාණ යන්ත්‍ර භාවිතා කිරීම තුල පොළව හැරීමට ලක් වීම.ඒ නිසා අපිට පුළුවන්නම් කුඩා යන්ත්‍ර මේ සඳහා භාවිතා කරන්න ලබා ගන්න පුළුවන් අස්වැන්නත් වැඩියි.ගම්වල රජයේ නිලධාරීන් හිටියට ඒ අයගෙන් මේ දේ වෙන්නේ නෑ.මම මේ යෝජනාව කරේ අපි හොඳ වැඩපිලිවෙලක් සභාව සම්බන්ධ වෙලා හදලා ගමට අරගෙන යමු.අරගෙන ගිහින් සියලු ගෙවල් වලට  වගා කරන්න පුළුවන් වැඩසටහනක් සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක කරමු කියලා ඉල්ලීමක් කරනවා.ඒ වගේම අපි සරල සමාජ ක්‍රමයෙන් ඈත් වීම තුල තමයි මේ ගැටළුවලට අපිට මුහුණ පාන්න වෙලා තියෙන්නේ.රට ස්ථාවර තත්වයට පත් වෙනකම් අපි මේ රටාවට හුරු වෙන්න ඕනා.ඒ සඳහා අපි කමිටුවක් පත් කරලා,අවශ්‍ය උපදේශකවරු ගෙනල්ලා,ග්‍රාමීය වශයෙන් මිනිස්සු දැනුවත් කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු  සභාපති මෙරිල් මුණසිංහ මහතා

දැන් මේ යෝජනාවට සියලු දෙනා අදහස් ලබා දුන්නා.ඒ වගේම සියලුම දෙනා හෙට ඉඳලම ඇවිත් අපේ නිලධාරීන් ඉන්නවා.ප්‍රජා සංවධර්න නිලධාරී,උපාධිධාරීන්,සේවකයෝ ඉන්නවා.ඒ අය සම්බන්ධ කර ගෙන යෝජනා ඉදිරිපත් කරලා ශ්‍රමදාන දාලා ඒ අවශ්‍ය කටයුතු කරගෙන යන්න.නැත්නම් පස්සේ චෝදනා කරන්න එපා මේවා කරේ නෑ කියලා.

ඒ වගේම පලාත් පාලන දෙපාතර්මේන්තුවෙන් උපදෙස් දීලා තියෙනවා සභාවේ අයවැයට දාලා තියෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න එපා.වියදම් සීමා කරන්න කියලා.ඒ අය කියන්නේ නැවත එම මුදල් මහජනයාට හෝ බැංකුවල සැරිසරන ආකාරයට කටයුතු කරන්න කියලා.ඒක නිසා අපේ තියෙන වැය ශීෂර් සංශෝධනය කරලා මේ ආර්ථික අබර්ුදයට උපයෝගී වෙන විදියට ගෙවතු වගාවන්,අනෙක් වගාවන් හා සමූහ ගොවිපලවල් සඳහා මේ මුදල් වැය කරන්න අපි අද තීරණයක් ගන්නවා.අපි තවත් වැය ශීෂර් වලින් දාලා තියෙන මුදල් මම කලින් කියලා තිබුණ පංචකමර් වැඩසටහන වගේ දේවල් අපි සභාවේ මුදල් වියදම් නොකර කරනවා.අදත් ඒ සඳහා ස්වාමින් වහන්සේ නමක් පරිත්‍යාග ලබා දෙනවා.ඒ ලක්ෂ 15 ත් මේකට යොදන්න පුළුවන්.මම ලේකම්තුමියට කියනවා මේ මුදල් වැය මාරු කරලා දෙන්න.ග්‍රාම සේවා වසමකට රුපියල් ලක්ෂයක් බැගින් වෙන් වෙන විදියට හදලා දෙන්න.මේකට පසුව විවේචන කරන්නේ නැතුව සක්‍රියව සියලු දෙනා දායක වෙන්න.සේවකයෝ,යන්ත්‍ර සූත්‍ර තියෙනවා.ජේ.සී.බී එකත් අපි හදනවා.මේ වෙලාවේ අළුත්වැඩියා කරන්න අමාරුයි.කම්පැනි වල වියදම් විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තියෙනවා.කෙහොම හරි අපි මේ වගා කටයුතු කරන්න සූදානම් වෙමු.වැය ශීෂර් යෝජනාව ඒ විදියටම ක්‍රියාත්මක වෙනවා.ඇත්තටම සභාවක්

විදියට බදු ගෙවන මිනිස්සුන්ට අපි මේවා නොකර ඉන්නවානම් වැරදියි. අපේ මන්ත්‍රීතුමන්ලාගේ වැදගත් ප්‍රයෝජනවත් අදහස් තියෙනවා. ඒ වගේම ප්‍රායෝගිකව මේ වගා කටයුතු කරන අය ඉන්නවා.මේවා කියලා ගොඩක් දවස්.ප්‍රජා මණ්ඩල පිහිටුවන්න කිව්වට කීප දෙනායි ඒක කරේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ප්‍රජා මණ්ඩලයට දෙන්න කියලා එකක් නෑ.ගොවි සමිති තියෙනවානේ. අනෙත් කාරණය තමයි ලක්ෂ 10ක් වෙන් කරලාත් දැන් මාස කීපයක් ගිහින් දැන්නේ මේකට සූදානම් වෙන්නේ.මේකෙන් පේන්නේ සභාපතිතුමා සහ නිලධාරීන්ගේ නොහැකියාව.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ප්‍රජා මණ්ඩල නැති තැන්වල ගොවි සමිතිය ගන්න.අපි කියන්නේ නෑ ප්‍රජා මණ්ඩලයම ගන්න කියලා.බණ්ඩක්කා ඇට මම ගෙනාවේ.ඒවාට සභාවේ සල්ලි වියදම් කරේ නෑ.ඒ වගේම පස්සේ ඇවිල්ලා චෝදනා කරන්න ඉඩ තියන්නේ නැතිව මේක ඵලදායීව කරන්න සම්බන්ධ වෙන්න. මේවට කාතර්‍ය වශයෙන් වියදම් කරන්න තමයි දැනුම් දීලා තියෙන්නේ.

අපි වැඩ කරේ නැතුව නෙමෙයි.අපි මේ සභාවේ තීරණ අරගෙන වැඩ කරේ.වීදි ලාම්පු දැම්මේ එහෙමයි.ඒකයි මේකත් සියලු දෙනාගෙන් අහන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

වීදි ලාම්පු දැම්මා මෙහෙ ඉඳන් ගල්මත්තටයි.ඒ පැත්තේ අනිත් ඒවටයි.අපේ කොට්ඨාශවලට දුන්නේ නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

නෑ හැමතැනටම දැම්මා.ඇයි නගරයට දැම්මේ නැද්ද?ලක්ෂ 05 ගානේ මුදල් දුන්නේ නැද්ද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

ලක්ෂ 05 දුන්නා.වීදි ලාම්පු දුන්නේ නෑ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

වාෂරීකව ලක්ෂ 05ක මුදලක් දුන්නම ඒක අතාරින්න බෑනේ.ඒක සාධාරණයක් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්‍ාණ මහතා

සභාපතිතුමා ජේ.සී.බී එක කම්පැනි දානවා කිව්වා.මේ මන්ත්‍රීවරු කියනවා වාහන කම්පැනි දාන්න එපා කියලා.අපිට ආරංචි වෙලා තියෙනවා සභාවේ වාහනයක් මාස 03කින් ආගිය අතක් නෑ කියලා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

තොරතුරු දෙන කෙනා වැරදි තොරතුරු දීලා තියෙන්නේ.මේ කියන්නේ කම්පැක්ටර් දෙක.සතොස ආයතනයට දීලා තියෙන්නේ.වියදම් වැඩි නිසා නතර කරලා තියෙන්නේ.හොයලා බලන්න.සේවකයෝ දෙන තොරතුරු සියල්ල නිවැරදියි කියලා හිතන්න එපා.මෙහෙන් කරන කොට හොරකම් කරා කියනවා.කම්පැනියට දැම්මාම ගාන වැඩියි කියනවා.කම්පැනියේ වියදම වැඩියි තමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

දැන් මෙතන ගැටළුවක් තියෙනවානේ.ගිය සැරේ ලක්ෂ පහයි ගානක් කැබ් එකට වියදම් කරා.මේ අවට ගැරේජ් වැඩ කරන අය ඕනතරම් ඉන්නවා.ඒවායෙන් මීට වඩා අඩුවට හදන්න තිබුණා.මේවායේ ගැටළු තියෙනවා.මේ වාහන හදන්න ගියාම කම්පැනි දාලා හදන්න කියලා එකක් නෑ.නැත්නම් මේවා ටෙන්ඩර් දාලා කරන්න ඕනා .යෝජනාව ගේනකම් අපි දන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා

යටදොලවත්ෙත් ඇගිලි සලකුණු යන්ත්‍රය හදන්න රු.32000ක් ගිහිල්ලා තියෙනවා.ඒ වගේම තණකොළ මැෂින් හැමදාම හදනවා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

ඒකට වෙන කම්පැනි නෑ.වියදම යනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

යටදොල තියෙන තණකොළ කපන මැෂින් හැමදාම කැඩිලා.අපි ළඟ තියෙන්නෙත් ඒ මැෂින් තමයි.ඒවා ඔය විදියට කැඩෙන්නේ නෑ.මේවායෙනුත් වෙන්නේ හොරකම්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම මන්ත්‍රීතුමාලට කියන්න ඕනා පුස්සලමුල්ල ප්‍රදේශයේ තිලක වලව්වේ ඉන්න ස්වාමීන් වහන්සේ නමක් අපේ සායන හතරට යම් උපකරණ කට්ටලයක් දුන්නා.ඒක භාර දෙන්න දැන් එනවා මම ඒකට ගිහින් එන්නම්.මම උප සභාපතිතුමාට කියනවා ඉදිරි කටයුතු කරගෙන යන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාපතිතුමා අපිට මේ පොහොර එකේ ගැටළුව විසඳගන්න ඔබතුමා ඉන්න ඕනා.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මන්ත්‍රීතුමන්ලා එක්කෙනා එක්කෙනා නැගිටලා කථා කරන්න එහෙනම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා

2021.12.21ට ගෙනත් තියෙනවා පොහොර බෑග් 300ක්.ආපහු මේ මාසේ 300 ක් ගෙනල්ලා තියෙනවා.එතකොට මාස 05කට පෙහොර බෑග් 300ක් පුරවලා එලියට දාලා තියෙනවා.ඒක නිසානේ ආයිත් පොහොර බෑග් ගෙනාවේ.පොහාර බෑග් 54යි විකුනලා තියෙන්නේ.මට ආපු තොරතුරු අනුව කොම්පෝස්ට් අංගනයේ සතියට දවස් තුනක් පොහොර හැලුවොත් ,දවසට කොට්ට 15 ක් හැලුවොත් මාසෙකට පොහොර කොට්ට 180ක් හැදෙන්න ඕනා. පොහොර කොට්ට 200ක් හදනවා කියන්නේ සාමාන්‍ය දෙයක්. ඔය ගෙනාපු ගාන විතරයි.සාමාන්‍යයෙන් මාසෙටම පොහොර ගෝනි 60යි හලලා තියෙන්නේ.මොනවද එතකොට මේකේ ඉන්න අය කරන්නේ.කුණු ටික කොහෙටද ගියේ?දැන් ඉතුරු වෙලා තියෙන්නේ බෑග් 54 යි.රු.500 ගානේ බැලුවත් රු.27000යි.එතකොට ඉතුරු ඒවට මොකද වුණේ?

ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් මිය

ඒවා කොම්පෝස්ට් එකෙන් විස්තර ගන්න ඕනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා

හෙටම ක්‍රියාත්මක වෙලා වැඩ තහනම් කරන්න මේ අයගේ.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

හෙට ඉඳලා වෙන කෙනෙක්ව දාලා තමන්ගේ භාරයට ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා

සභාපතිතුමා පෙරේදා ප්ලාස්ටික් විකුණලා තියෙනවා.ඒවායේ මුදල් මෙහෙට ලැබුණද?

ලේකම් ඩබ්.ඒ.එම්.අයි.එස් තෙන්නකෝන් මිය

මට හිතෙන විදියට මම කියන්නේ.මේ ටික නිවාඩු දවස් නිසා,අදත් නාමල් වැඩමුළුවක ඉන්නේ.හෙට තමයි මුදල් බඳින්න ඕනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා

එහෙම එයාට ඕනේ විදියට රජයේ මුදල් ළඟ තියාගන්න බෑ.අනික ලේකම්තුමියගේ අවසරයක් නැතිව කෙහොමද එයා විකුණන්නේ?හෙටම මේවට පියවර ගන්න ඕනා.ඒ වගේම මම ගිය සතියේ පොහොර ගන්න පුද්ගලයෙක් එව්වා.එතන පොහොර තිබුණේ නෑ.නමුත් සේවකයෙක් නිකන් ඉන්නවා.පොහොර නිෂ්පාදනය කරන තැනත් නෑ.විකුණන තැනත් නෑ.එතකොට මේ පොහොර වලට මොකද වුණේ?ඒ වගේම මාස

**6ටම විකුණලා තියෙන්නෙ පොහොර කොට්ට 54යි.ඒ සේවකයාට වැටුප කීයක් දෙනවද කියන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා

**ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව පුළුල් පරීක්ෂණයක් කල යුතුයි කියලා අපි හිතනවා.අපි පොහොර විකුණන තැනට ගියා.එතන වහලා.සේවකයෙක් නෑ.පොහොර අංගනයට ගියා.එතන කවුරුත් වැඩ නෑ.අපි ඇහුවා දිනකට පොහොර හලන ප්‍රමාණය කෙහොමද කියලා?එතකොට කිව්වා හලන දවසට කොට්ට 30ක් 35ක් පුරවනවා කිව්වා.දවස් තුනකට හෝ පහකට සැරයක් පොහොර හලනවා කිව්වා.අපි 5 ගානේ බැලුවොත් මාසෙට 90ක් තියෙන්න ඕනානේ.ඇත්තටම මෙතන මාෆියාවක් තියෙන්නේ.අපිට සමාජයෙන් ආරංචි ලැබෙනවා ලේකම් මිස්ගේ පුතා මේකට සම්බන්ධයි කියලා.අපි දන්නේ නෑ මේක.ඒ වගේම සභාපතිතුමා මේකට වගකියන්න ඕනා.ඔබතුමාගේ අකාර්යක්ෂම පාලනය මේකට වගකියන්න ඕනා.ගිය සභාවේ කතා කරපු ඉඩම් එක එක අයට දීලා. ඔබතුමා දන්නේ නෑ.මේ සභාවේ මුදල්,සම්පත් වලට වෙන දේවල් වලට ඔබතුමා වගකියන්නේ නැතුව අපිද වගකියන්න ඕනා?මේ සම්බන්ධව සභාපතිතුමාටයි,ලේකම් මිස්ටයි දෙන්නටම විරුද්ධව පරීක්ෂණයක් කරන්න ඕනා.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**මේ සම්බන්ධව පරීක්ෂණයක් ඉල්ලන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් රම්සාන් මහතා

**ඇත්තටම මෙතන අපිට තේරෙනවනේ සභාවට එන ආදායම හොරකම් කරලා කියලා.ඒ වුණාට කියන්නේ මන්ත්‍රීවරු හොරකම් කරනවා කියලා.දැන් මෙතන මන්ත්‍රීවරු හොරකම් කරලා නැනේ.ඒ වගේම සමහර දේවල් සුජීව මන්ත්‍රීතුමා පෙන්වලා දුන්නා.ඒවා සොයා බැලුවේ නෑ.දැන් ඒවා තමයි මේ ඇවිත් තියෙන්නේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා

**සභාපතිතුමා,දැන් බීජ ගේනවා කිව්වනේ.ලක්ෂ 10ක් තියෙනවානේ.තවත් මුදල් දානවා කිව්වනේ.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**මෙහෙමයි. මුලින්ම ලක්ෂ 10න් ඔක්කොම ක්‍රියාත්මක කරලා ඉමු.අනෙත් ටික දාන්නේ දෙවනුවනේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා

**සභාපතිතුමා මේක මගේ අදහසක්.ඔය පවුල් 50කට දෙනවා කියන එක ගැන නම් මම සෑහීමකට පත්වෙන්නේ නෑ.මිනිස්සු තරහා වෙන එකයි වෙන්නේ.ලංකාවේ බීජ අඩුම මිලට දෙන්නේ දඹුල්ලේ සාර ලංකා කියන ආයතනය විතරයි.උපරිම බීජයකට රුපියලක්**

තමයි වැය වෙන්නේ.එහෙම බැලුවොත් අපිට බීජ ලක්ෂ 10ක් ගන්න පුළුවන්.අපේ ආසනේ පවුල් කොච්චර තියෙනවද?

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

පවුල් 24600යි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවධර්න මහතා

24600යි.එහෙමනම් උපරිට බීජ 4ක් හෝ 5ක් වගර් දෙක තුනකින් දෙන්න කටයුතු කරන්න පුළුවන්.එතකොට සමසේ සියළු පවුල්වලට බෙදලා දෙන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

බීජ දෙන එක ගැන ඔබතුමන්ලා කථා කරලා තීරණයක් දෙන්න.අපි ගිය සැරේ කහ වගාවටත් ලක්ෂ 3ක් දාලා කරේ වෂර්යේ මැද.අපි අයවැයෙන් දාලා කරාම මුල් කාතර්වේ අපිට මුදල් ලැබෙන්නේ නෑ.දෙවෙනි කාතර්වේ තමයි මුදල් එන්නේ.ඒක නිසා මේ කාලෙට තමයි ක්‍රියාත්මක කරන්න වෙන්නේ.ගිය සැරේ කහ වගාවත්,ඊට පෙර ගෙවතු වගාවත් කරේ එහෙමයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

මම මේ වෙලාවේ යෝජනාවක් කරනවා සභාපතිතුමා.කොම්පෝස්ට් එක සම්බන්ධව කමිටුවක් පත් කරන්න.අපි සෘජුවම මැදිහත් වෙලා මේකේ වෙලා තියෙන හොරකම් ටික හොයලා දෙන්නම්.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම සම්පූණර්යෙන්ම එකඟයි.මොකද මේ කසළ එකතු කරන තැනක් 2007 සෙන්ට්‍රල් එක ළඟ ඉඩමේ හදලා තිබුණා.මේ ඉඩම අපි භාර ගන්න කොට මාසෙට රු 10000ට කුලියට දීලා තිබුණා.ඔය පොහොර අංගනයේ ගොඩනැගිල්ලට ලැබුණු ශ්‍රවණාගාරේ පලාත් සභාවේ සල්ලි.මේක වහලා තිබුණේ.මේක ඇරලා සේවකයෝ දැම්මේ දවසේ පඩියට.මම මේ සම්බන්ධව ලැබෙන ප්‍රමාණය, විකුණන ප්‍රමාණය ගැන ලේඛණ තියා ගත්තා.මම නිලධාරීන්ට නිතරම කිව්වා.මේකට බඩු එවන්න.මේක කරන්න කියලා.ඊට පස්සේ පොහොර අංගනයේ වෙන වැරදි ගැන.ප්‍රශ්න තියෙනවා ඇත්තටම. පොහොර විකුණනවා, ,වීදුරු විකුණනවා,කාඩ්බෝඩ් විකුණනවා.මෙහෙට මුදල් බඳිනවා.ඒ වුනාට මම දන්නේ නෑ.මම නිතරම ගියා.පසුගිය කාලේ මගෙන් මේ පොහොර අංගනයේ කටයුතු ඇත්වුණ එක ඇත්ත.නමුත් මම නිලධාරීන්ට නිතරම උපදෙස් දුන්නා මේක කරන්න කියලා.පරීක්ෂණයක් තියලා මම වැරදිනම් මම ඒක භාර ගන්න ලෑස්තියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාපතිතුමා නිතරම කිව්වානම් මෙගොල්ලන්ට ගිහිල්ලා බලන්න කියලා ඇයි නොකරේ? සභාපතිතුමා කියන දේ මේ නිලධාරීන් අහන්නේ නැත්නම් සභාපතිතුමාට පුළුවන්නේ ක්‍රියාත්මක වෙන්න.සභාපතිතුමාට ලේකම්ව මාරු කරලා වෙන ලේකම්

කෙනෙක් ගේන්න පුළුවන්නම් ඇයි නිලධාරියෙක් මාරු කරන්න බැරි?අපි මේ වෙලාවේ ඇත්තටම අසරණ වෙලා ඉන්නේ.අපිට මේ ඇවිල්ලා තියෙන ප්‍රශ්නෙත් එක්ක මේ සභාවේ ඉන්න සේවකයෝ අපිට සමාජ මාධ්‍ය තුලින් සැහෙන්න අපහාස කරා.අපි හොරු කියලා.අපේ වත්කම් බැරකම් බලන්න ඕනේ කිව්වා.එතකොට මේ හොරකම් කරන අයගේ බලන්න ඕනේ නැද්ද?අපි මොනවද හොරකම් කරලා තියෙන්නේ?ඔබතුමා දැඩිව මේකට මූලික වෙන්න ඕනේ.මන්ත්‍රීවරු නෙවෙයි මේ හොරකම් වල ඉන්නේ නිලධාරීන් කියන එක පෙන්වන්න.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

මම කැමතියි.වැරදි කරලා තියෙන අයට දඬුවම් දෙන්න ඕනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

කැමති වුණාට වැඩක් නෑ.ක්‍රියාත්මක කරන්නේ නැනේ.ඊළග සභා වාරය වෙනකොට මුකුත් වුනේ නෑ වගේ ඉන්නවා.උප සභාපතිතුමාගේ කාමරය තෙමෙනවා.මේවාට මුදල් ගෙවන්න එපා කියලා මම යෝජනාවක් දුන්නා.අදාල අයට සල්ලි දුන්නේ නැද්ද?ඒ සියල්ල කරා.අපි ඒ වෙලාවේත් පෙන්වලා දුන්නා.ඒක නිසා සභාපතිතුමා හොරකම් කරන නිලධාරීන්ට විරුද්ධව මේ වෙලාවේදිවත් ක්‍රියාත්මක වෙන්න.අපිට අවශ්‍ය කරන කමිටු පිහිටුව ගන්න ඔබතුමා සහය දක්වන්න.අපි හොරකම් හොයලා දෙන්නම්.එතකොට බලා ගන්න පුළුවන් හොරකම් කරලා තියෙන්නේ අපිද ?නිලධාරීන්ද කියලා?

**6.4** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී මිත්‍රානන්ද මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-

**6.4.1** නුගගහලන්ද ප්‍රධාන මාගර්ය නුගගහලන්ද හන්දිය සිට හතරමන් හන්දිය දක්වාත් තුන්වන මාවත අසල සිට බ්‍රිජ් වත්ත දක්වාත් දෙපස වල් බිහි වී මාගර්ය වලවල් සෑදී ඇති බැවින් සභාව සතු ඩෝසර් යන්ත්‍රය යොදා සංවධර්නය කරන ලෙස ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ප්‍රියංකා ගුණවධර්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6.4.2** ඉදිගස්තුඩුව ගම ප්‍රධාන මාගර්ය කාපට් අතුරා සංවධර්නය කිරීමට යෝජනා වී තිබුණත් ,ආසියානු සංවධර්න බැංකු යෝජනා,අයිරෝඩ් ව්‍යාපෘති,කිලෝ මීටර් 100000,සභාපති කිලෝමීටර් 10 ආදී කිසිදු ව්‍යාපෘති යෝජනාවකින් ඉටු නොවුනු බැවින් ,ප්‍රාදේශීය සභා අරමුදලින් හෝ මීටර් 500ක් සංවධර්නය කර දෙන ලෙස ගරු සභාවට කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ප්‍රියංකා ගුණවධර්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

6.4.1 යෝජනාව සංශෝධනය කරන්න ඩෝසර් යන්ත්‍රය යොදා දෙපස කාණු කපන්න කියලා.කාණු කපන්නේ නැතුව වැඩක් නෑ.කාණු කපලා පාරේ කඩතොළු වුණ තැන් හදමු.අනෙත් කාරණය තමයි 6.4.2 කිලෝ මීටර් ලක්ෂයේ සභාපති යෝජනා යටතේ

කියලා තියෙනවා කෙරුණේ නෑ කියලා.මීටර් 500ක් අපිට මේ මොහොතේ සංවධර්නය කරන්න බෑ.ඇත්ත කියන්න ඕනා.නැත්නම් මේ විදියට යෝජනා සම්මත වුණාම පස්සේ කියනවා මේව කෙරුණේ නෑ කියලා.ඒ නිසා සභාපතිගේ කොට්ඨාශයේවත් ක්‍රියාත්මක කරන්න වුණේ නෑ.අපි කීප දෙනෙක්ගේ ඒවා කෙරුණේ නෑ.අනෙක් ඒවා කෙරුණා කියලා ලොකු ප්‍රසාදයකුත් නෑ.මම තමයි සභාවට ලැබුණ කිලෝමීටර් දහය බෙදලා දුන්නේ මීටර් 500 ගානේ.ඒකේ එක හොඳක් දකිනවා.සමහර කොට්ඨාශ වල මීටර් 500ට වඩා කෙරිලා තියෙනවා.නමුත් මගේ දේවත් මට ලැබුණේ නෑ.මගේ වරදක් නෙවෙයි.රජයේ වැඩ කටයුතු අඩපණ වෙලා තියෙන්නේ.ඒක නිසා මේක ක්‍රියාත්මක කරන්න වෙන විකල්පයක් යෝජනා කරන්න.පලාත්බද මාගර් සංවධර්න අධිකාරිය හරහා.පලාත් සභාව ක්‍රියාත්මක නිසා පලාත් සභාවට ඉදිරිපත් කරන්න මේක.මම මේ කිව්වේ කෙරෙන විදිය මන්ත්‍රීතුමා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී මිත්‍රානන්ද මහතා

මම මේ වෙනකොට අවුරුදු 19 ක් ප්‍රාදේශීය සභා මන්ත්‍රී.නමුත් මට මේ වෙනකම් ගමේ පාර හදා ගන්න බැරි වෙලා තියෙනවා.මට ඇත්තටම කණගාටුයි.අපේ මන්ත්‍රී ධූරය අවසන් වෙන්න තව ටික කාලයයි තියෙන්නේ.මට ගමට යන්න බැරි වෙලා තියෙනවා.මේ පාර සංවධර්නය කරන්න ඇස්තමේන්තු කරා.මට අසනීප වුණ නිසා මේක ඉදිරියට කරගෙන යන්න කෙනෙක් හිටියේ නෑ.මේකේදී කාගෙන් හෝ අතපසුවීමක් වෙලා මේ වැඩේ අතරමඟ නතර වුණා.පසුව අනුප පස්කුවල් මහතා මේක භාර ගත්තා.නමුත් මේ කටයුතු කෙරෙන්නේ මන්ත්‍රීවරයෙක්ගේ හෝ ඇමතිවරයෙක් හරහා.ඒ අයට වෙන් වුණ කොටසක් තියෙනවා.ඒ අය ඒක ඉදිරපත් නොකරොත් ඒක කෙරෙන්නේ නෑ.මමත් සභාපතිතුමාත් දෙන්නම ගිහින් මේ පාරවල් මැන්නා.මැනලා තාක්ෂණ නිළධාරීන් එක්ක ඒ කටයුතු කරා. නමුත් ඒ වෙලාවෙත් ඇස්තමේන්තු වෙලාවට ඉදිරිපත් වුණේ නෑ.එහෙම වුණා නම් අද එක පාරක් හරි ක්‍රියාත්මක වෙනවා.ඒක නිසා මේ පාර සංවධර්නය කරලා දෙන්න කියලා මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු උපසභාපති ලලිත් රණසිංහ මහතා

සභාපතිතුමා,අපි මේක සභාවෙන් කරමු.

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

සභාවෙන් එක පාරක් මන්ත්‍රීතුමාගේ ගේ ළඟ වංගුවට වෙනකන් පලවෙනි පාර තාර දැම්මා.දැන් සෙකන් කෝඩ් එක තියෙන්නේ.මන්ත්‍රීතුමාගේ නුගගහලන්ද පාර මේ තියෙන්නේ.මේ පාරට සම්බන්ධ නොවුණ කෙනෙක් නෑ.සමහර මන්ත්‍රීවරු සභාව නොදැනුවත්ව ගිහින් බෝඩ් පවා ගැහුවා.ඒවායේ ප්‍රතිවිපාක තමයි මේ.මිනිස්සු අපිට දොස් කියනවා.මම ලොකු උත්සාහයක් ගන්නවා සභාව හරහා නඩත්තු කරගෙන යන්න.කසුන් මන්ත්‍රීතුමා කියන කථාව ඇත්ත.පාරවල් වල වලවල් යන්න බෑ.නමුත් අපි ෙමේවා කරන්න ගියාම චක්‍රලේඛ හරස් වෙනවා.ජල සම්පාදනයේ කරපු ඉදි කිරීම් හරහා නගරයේ පාරවල් විනාශ වෙලා තියෙනවා.අදටත් ඒවට විසඳුමක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා

**මගේ ලක්ෂ 05 මම දෙන්නම්.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**මගේ ලක්ෂ 05ත් ගන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා

**සභාපතිතුමාත් දෙනවා කිව්වා.එතකොට ඔබතුමාගේ 05යි.ලක්ෂ 15 ක් තියෙනවානේ.ඒ මුදල දාලා ඒක කරලා දෙන්න.**

ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා

**මම ඉල්ලීමක් කරනවා.මම කලින් කිව්ව පරිත්‍යාග ටික දෙන්න ස්වාමින් වහන්සේ වැඩම කරලා තියෙනවා.ඒ නිසා උපසභාපතිතුමාට සභාවේ කටයුතු කරගෙන යන්න ආරාධනා කරනවා.ඒ වගේම පානදුර නගර සභාවේ හිටපු මන්ත්‍රීතුමෙක් එතුමාගේ නිෂ්පාදනයක් ගැන අපිව දැනුවත් කරා.ඒකට හොරවල පාසල් භූමියේ තියෙන ඉඩම ගැන අහලා තියෙනවා.ඒ ඉඩම අපිට අයිති නෑ.ඒ නිසා නාමල් මන්ත්‍රීතුමා ඒක ප්‍රාදේශීය ලේකම්තුමියට යොමු කරන්න කියන්න.හොඳ ව්‍යාපෘතියක්.අපේ එකඟතාවය අපි දෙන්නම්.**

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

**නාමල් මන්ත්‍රීතුමා කියපු ඒ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපි සභාවේ එකඟතාවය දෙන්න ඕනා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමාගේ දොන් අතුල මහතා

**ඒකට අපි කැමතියි.**

**ඒ වගේම විශේෂයෙන් දැනුම් දෙන්න ඕනා.කොම්පෝස්ට් එකේ මේ ප්‍රශ්න සියල්ල ඇතිවෙලා තියෙන්නේ මම මේ සභාවේ සතියට දවස් දෙකක් අපේ තාක්ෂණික නිලධාරීන් ගිහිල්ලා මේ පිළිබඳ අධීක්ෂණ වාතර්ාවක් සතියක් ඇතුලත දෙන්න කියලා මම යෝජනා කරා.මේ පිළිබඳ මනා දැනුමක් මට තියෙනවා මොකද මේ කොම්පෝස්ට් එක තියෙන්නේ මගේ වසමේ නිසා.දැන් මේකේ මටත් චෝදනාවක් ඇවිත් තියෙනවා.මම නිතර මේ ගැන බැලුවා.ඒ වගේම ඔබතුමාලටත් බලන්න තිබුණා මේ ගැන.මම කරන්න ඕන දේවල් කිව්වා.ඒ වෙලාවේ සමහර අය මට හිනා වුණා.ඇළේ නාන්න බෑ කිව්වා.ජරා වතුර යනවා කිව්වා.ඒවා නවත්තන්න මේ සභාව ක්‍රියාත්මක වුනේ නෑ.මම මේකේ කම්කරුවෙක් නෙවෙයි.මම මන්ත්‍රීවරයෙක්.මම එදා ඉඳලා ඒ ගරුත්වය තියලා වැඩ කරලා තියෙනවා.ඒවා මේ සභාවේ නිලධාරීන් කරන්න ඕනා. නමුත් මේ වෙනකොට මට චෝදනා කරනවා.මේ කොම්පෝස්ට් එකේ වෙන අසාධාරණකම් මම දන්නවා.ඒකෙන් මටත් කොටසක් එනවා කියලා.මම ඒවගේ දේවල් කරලා නෑ.ඒක නිසා මම ඒවට බයත් නෑ.අද පාලරීමේන්තු මන්ත්‍රීගෙන්,නිලධාරීන්ගෙන් වෙලා තියෙන සියලු දේවල් වලට වන්දි ගෙවන්න වෙලා තියෙන්නේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට.මම එදා සභාවට**

යෝජනාවක් ගෙනාවා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට පෙට්‍රල් ටිකක් ගන්න ක්‍රමවේදයක් බලන්න කියලා.පාලරීමේන්තු මන්ත්‍රීවරුන්ට,පොලීසියට තෙල් දෙනවා.අපිට ගමේ දේකට යන්න තෙල් ටික නෑ.ඒ වගේ තත්වයකට අපි පත්වෙලා ඉන්නවා.මම කිව්වා ප්‍රාදේශීය ලේකම් කායර්ාලවල නිලධාරීන් ඉන්නවා,ප්‍රාදේශීය සභාවේ ඉන්නවා උපාධිධාරී නිලධාරීන්.ඒ අයව යවලා පෝලිම් වල ඉන්න අයගේ විස්තර අරගෙන මාසෙට අවශ්‍ය කරන තෙල් ප්‍රමාණය බලලා යම් කිසි කාඩ් එකක් දීලා තෙල් ලබා ගන්න ක්‍රමවේදයක් හදන්න කියලා.එහෙම කරානම් මේ පෝලිම් දවස් දෙකෙන් ඉවරයි.මේ පිළිබඳ මධ්‍යම රජය දැනුවත් කරන්න.ඒක මේ පුංචි මන්ත්‍රීවරයෙක් කල ප්‍රකාශයක් නිසා දැනුම් දුන්නේ නෑ.ඒක නිසා මම යෝජනා කරනවා දැන්ම දැනුවත් කරන්න අපිට සමුපකාර ෂෙඩ් එකෙන් තෙල් ලබා දෙන්න කියලා.නැතුව අපි කාටවත් දොස් කියලා වැඩක් නෑ.මේ මන්ත්‍රිතුමා හොඳ යෝජනාවක් ගෙනාවා.අපි මොකක්ද කරන්න ඕනා.මුලින්ම කුණු ලොරිය නවත්තන්න ඕනා.මේ මතුගම හැමෝටම කුණු වලක් කපා ගන්න පුළුවන්.එහෙම කරානම් අපි පොලිතීන් විතරයි ගේන්න ඕනා.මුලින් ඒක කරන්න.ඒ වගේම මම විශේෂයෙන් මතක් කරන්න ඕන කාරණාවක් තියෙනවා.මතුගම වැත්තැව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා වංචනික ලෙස බඳු ඔප්පුවක් හදලා ළමයෙක් පාසලට දාලා තියෙනවා.මේ පිලිබඳ ඒ නිවෙස් හිමියාවත් දන්නේ නෑ.ඒ නිසා මේ පිලිබඳ ප්‍රාදේශීය ලේකම්තුමියව දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

සභාපතිතුමා කියලා ගිය හොරවල ඉඩම සම්බන්ධව කථා කරලා ඉමු.ඒක අවසන් කරලා අනිත් ප්‍රශ්නවලට යමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

සභාපතිතුමා මෙතනින් නැගිටලා යනකොට කිව්වා.ඒ ඉඩම අපිට අයිති එකක් නෙවෙයි.ප්‍රාදේශීය ලේකම් එකට අයිති.ඒක නිසා ප්‍රාදේශීය ලේකම් එකට යොමු කරලා ලබ ා දෙන්නම් කිව්වා.ඒකට සභාවේ මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා

අපිට අවසරයක් දෙන්න බැරි එකකට මෙතන කථා කරලා වැඩක් නැනේ.දැන් මම කථා කරන්නේ කොම්පෝස්ට් එක සම්බන්ධයෙන්.මෙච්චර කාලෙකට මේකේ ගණනය කිරීමක් කරන්නේ නැද්ද මාසිකව නිෂ්පාදනය කරන ප්‍රමාණය,විකුණන ප්‍රමාණය,සහ නොමිලේ දෙන ප්‍රමාණය සම්බන්ධව.ඇයි ඒ ගැන හොයලා බැලුවේ නැත්තේ? අපි හැමදාම කථා කරනවා විතරයි.එදා හොරවල ගොඩනැගිල්ල ගැන කථා කරා.ඒවට අවශ්‍ය නීතිමය ක්‍රියාමාගර් ගන්න බැරිනම් වැඩක් නෑ.සභාපතිතුමාට තනි තීරණයක් ගන්න බැරිනම් මේ මන්ත්‍රීවරුන්ට කිව්වානම් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනා උදව් කරනවනේ. ඒක නිසා හොරවල ගොඩනැගිල්ල සම්බන්ධව මේ සභාවේ උත්තරයක් දෙන්න ඕනේ.ඒ වගේම කොම්පෝස්ට් අංගනය සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් අවශ්‍යයි.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

ප්‍රජා සංවධර්න නිලධාරී මහත්තයා ෙහට එනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
සභාපතිතුමා, අපිට දැන ගන්න ඕනා මේ විධිමත් පරීක්ෂණය කරන්නේ කවුද?මේ හොරකමට සම්බන්ධ අයමද මේ පරීක්ෂණය කරන්නේ?සභාපතිතුමා,ලේකම්තුමිය සහ අනෙක් නිලධාරීන්ද මේක කරන්නේ?
ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
ඒ අය නැතුව කරන්නේ. මන්ත්‍රීවරු තුන් දෙනෙක් පත් කරනවා.එහෙනම් ඔබතුමන්ලා නම් කරන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කාන්ත සිරිවර්ධන මහතා විසින් පහත සඳහන් මන්ත්‍රීවරුන්ගේ නම් කමිටුව සඳහා යෝජනා කළ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදී.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේශ් ජයසේකර මහතා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිමර්ාණ මහතා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
මේ පරීක්ෂණයෙදි මෙහෙම දෙයක් වෙන්න ඕනේ.මේ පරීක්ෂණ කරාට පස්සේ මේ නිලධාරීන් මේ සේවකයන්ගේ වැඩ නවත්වන්න,වැටුප් කපන්න වගේ දේවල් කරන්න බෑ.අපි ලබන සභා වාරය වෙනකොට මේ කොම්පෝස්ට් එකේ ආදායම අරන් පෙන්වන්නම්.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
මෙහෙම දෙයක් තියෙනවා.මේ විදියට සභාවේ බලතල අනුව මන්ත්‍රී කණ්ඩායමක් යොදවලා විධිමත් පරීක්ෂණයක් කරන්න පුළුවන්.ඒකට රජයේ නිලධාරීනුත් සම්බන්ධ කර ගන්න ඕනේ.නැත්නම් නීත්‍යානුකූල වෙන්නේ නෑ. ඒක නිසා ප්‍රජා සංවර්ධන නිලධාරී සංජීව මහත්තයාවත් මේ කමිටුවට පත් කරනවා.ඒ වගේම සහතිකයක් දෙනවා තොරතුරු දෙන සේවකයන්ට කිසිදු බලපෑමක් වෙන්නේ නෑ කියලා.ඒ වගේම මේ කමිටුව පත් කරන්නේ මේ පරීක්ෂණයට විතරක් නෙවෙයි.මේ සභාවේ ඉදිරි දියුණුවට සහ ආදායම් උපයන මාගර්යක් බවට පත් කරන්න කියන දෙකටම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
දැන් කොම්පෝස්ට් එකේ අපි ලබන මාසේ වෙනකොට ආදායම පෙන්නනවා.එතකොට ඒකේ වුණ හොරකම් සම්බන්ධව මොකද කරන්නේ?

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
ඒ සම්බන්ධයෙන් පරීක්ෂණය කරලා පෙන්නලා දුන්නට පස්සේ ඔබතුමාලට පුළුවන් කොමසාරිස්තුමාගෙන් පරීක්ෂණයක් ඉල්ලන්න.ඒක අපිට කරන්න බැහැ.ඒ වගේම මේ

සභාව ඉවර වුණාම ඔබතුමන්ලා ගිහින් බලන්න හිස් බෑග් කොච්චර තියෙනවද සහ පොහොර කොට්ට කොපමණ තියෙනවද කියලා.නැත්නම් පිරෙව්වා කියයිනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා
මම ඉල්ලීමක් කරනවා අපිට අවශ්‍ය මූලික තොරතුරු ටික ජනවාරි මාසේ ඉඳලා ලබා දෙන්න කියලා.ඒ වගේම මේක කල් දාන්න අවශ්‍ය නෑ.අපි සියලු දෙනා හෙට ඉඳලා සූදානම් මේ කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
ඒ වගේම සභාපතිතුමා මේ මන්ත්‍රීතුමියට වුණ අසාධාරණය සම්බන්ධයෙන් ගන්න ක්‍රියාමාගර්ය මොකක්ද?එහෙම නැත්නම් අපිට මීට එහාට ගිහින් අවශ්‍ය කටයුතු කරනවා.ඒක නිසා ඒ සම්බන්ධව ගන්න ක්‍රියාමාගර්ය පිළිබඳව පැහැදිලි පිලිතුරක් ලබා දෙන්න.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

එහෙම සභාවේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙක්ට හෝ මන්ත්‍රීවරියකට මරණ තජර්න කරන්න කිසි කෙනෙක්ට අයිතියක් නෑ. අපි වරදක් කරලා තියෙනවානම් ලේකම්තුමියට හෝ සභාපතිතුමාට දැනුම් දෙන්න ඕනා.රුවන්දි මන්ත්‍රීතුමියට වුණ දේ සභාපතිතුමාට හා ලේකම්තුමියට දැනුම් දීලා තියෙනවා.ඊට පසු නිවාඩු දින යෙදුණ නිසා හෙට මේක භාර දෙනවා කළුතර කොමසාරිස්තුමියට පරීක්ෂණයක් කරන්න කියලා.පරීක්ෂණයේදි එතුමියට පුළුවන් ඒ විස්තර දීලා අවශ්‍ය කටයුතු කරන්න.ඒ වගේම ලේකම්තුමිය දැන ගන්න ඕනා සභාවේ සියලු දෙනා මේ සම්බන්ධව විරෝධය පෑවා කියන කාරණය දැනුම් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
අද වෙනකොට මේ සභාවේ වංචා දූෂණ නිසා ඉතාම පහත් තැනක තියෙන්නේ.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
ඔබතුමිය සභාවේ ඉන්න ගමන් එහෙම කියන්න එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
අපි නෙවෙයි ඒ තත්වයට සභාව ගෙනාවේ.මේ සභාවේ සේවකයෝ.පසු ගිය දවස්වල අපිට ගමේ මිනිස්සු ගහන්න එන්න හේතුව තමයි මේ සභාවේ සේවකයෝ අපි ෙහාරකම් කලා කියලා සමාජ මාධ්‍යවල දාපු එක.එතකොට හොරකම් කරලා තියෙන්නේ අපිද?

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
ඒ කවුද කියලා දැනුම් දුන්නද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි රුවන්දි තිරිමාන්න මිය
ඒ කවුද කියලා මම මෙහෙට දැනුම් දීලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා

අපි මොනවද හොරකම් කරලා තියෙන්නේ?කොම්පෝස්ට් එකෙන්,ලයිට් එකෙන්,ජේ.සී.බී එක,කැබ් එක හදන එකෙන් හොරකම් කරනවානම් අපිට කියන්න ඔය කොයි එකෙන්ද මන්ත්‍රීවරු හොරකම් කරලා තියෙන්නේ කියලා?

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
මම මේ සභාපතිතුමාව හොඳ කරන්න කියනවා නෙවෙයි.ඕනෑම සභාපති කෙනෙක් කැමති නෑ විගණනයකට ගිහින් නරක නාමයක් ගාගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා
එහෙම කියලා නිලධාරීන් හොරකම් කරන ඒවා මන්ත්‍රීවරු කරේ කියලා අපේ පිට දාලා හරියනවද? ඇන් ලයිට් දැම්මා.ලක්ෂ 12ක යෝජනාවකට අපි එකඟ වුණා.ඒ කෙන් අපේ කොට්ඨාශවලට දාපු එක ලයිට් එකක් නෑ.අපි මේ යෝජනාවට එකඟ වුනේ අළුතින් ලයිට් ගේන්න.වගකීමක් ඇතුව ගත්තානම් මේවාට ලක්ෂ 12ක් වියදම් කරන්න වෙන්නේ නෑ.ඊට පස්සේ අපේ ගෙවල් වලට ගහන්න එවනවා.මේවා හදන්න තමයි මුල ඉඳන් කථා කරේ.නමුත් සභාපතිතුමාවත් ලේකම්තුමියවත් ඒ ගැන තැකීමක් කරේ නෑ. දැන් අපිට තේරෙනවා මේවාට සෘජුවම ලේකම්තුමියත්,හිටපු ලේකම්තුමත්,සභාපතිතුමත් සම්බන්ධයි කියලා.නැත්නම් මේවට උත්තර දෙන්න ඕනානේ.අන්තිමට කතා කරන අපිට බැනලා නිකන් ඉන්නවා.ඔය දේ තමයි වුණේ.දැන් අපිට දීලා තියෙනවා වත්කම් බැරකම් දෙන්න කියලා.මේ නිලධාරීන්ගේ,සේවකයන්ගේ වත්කම් බැරකම් ගන්න.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා

මේ වැරදි වලට ප්‍රධාන හේතුව තමයි මේ කමිටු ක්‍රියාත්මක නොවීම.මම පරිසර කමිටුව සම්පූර්ණයෙන් ඉවත් කරනවා.නැත්නම් ඔබතුමන්ලාට බලය ලැබෙන්නේ නෑ.ඒක නිසා මන්ත්‍රීතුමන්ලා පස්දෙනාව පරිසර කමිටුවට පත් කරනවා. ඔබතුමන්ලා මේ පරීක්ෂණ කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් රම්සාන් මහතා
එදා ඉඳලා සුජීව මන්ත්‍රීතුමා මේ වෙන හොරකම් සම්බන්ධව පෙන්වලා දුන්නා.නමුත් ඒවට නිසි ක්‍රියාමාගර් අරගෙන දඬුවම් දුන්නේ නෑ.එහෙම වුණානම් මේ දේවල් වෙන්නේ නෑ.අපි ලයිට් එකක් දාන්න කිව්වම සල්ලි නෑ කියනවා.ඒ වුනාට සභාවට එන ආදායම් ඔක්කොම අහිමි කරලා තියෙනවා.අනිත් කාරණය තමයි මස් කඩ වහලා කිව්වා ඒවෙනුවට ආදායම් එන මාගර්යක් හොයලා දෙනවා කියලා.ඒක කරාද කියන එක දන්නේ නෑ.මස් කඩේ ආදායම එපා නම් අර පෝලිම්වල ඉන්න ජනතාවට දෙන්නකෝ.ඒක හොඳ දෙයක්නේ.ඒ වගේම තමයි සාෆි වෛද්‍යවරයා ගැන කිසිම වැරුද්දක් ඔප්පු වෙලා නෑ.එතුමාට ඒ ලැබුණු දීමනාවත් එතුමා ඖෂධ ගන්න රජයට දීලා තියෙනවා.ඒක නිසා අපි එතුමාට මේ ශ්‍රී ලාංකික ජනතාවට ඉදිරියටත් සේවය කරන්න ශක්තිය ලැබෙන්න කියලා ප්‍රාථර්නා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා
සභාපතිතුමා මම අතිකාල දීමනා සම්බන්ධව කතා කරන්නේ.දැන් රජයෙන් සිකුරාදා නිවාඩු දිනයක් කරලා තියෙනවා.ඒක නිසා මේ සභාවේ අතිකාල ගෙවන්න එපා.මොකද මම දැක්කා ආදාහනාගාරය වහලා තිබුණ දවස්වලත් ඒ සේවකයන්ට අතිකාල ගෙවලා තිබුණා.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
ජුනි මාසේ ඉඳලා අතිකාල දිමනා  ගෙවන්නේ නෑ.ඒ කලින් මාසවල ඒවා දාලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි සීතා ඩයස් මිය
මම ලේකම්තුමියට යෝජනා දෙකක් දීලා තියෙනවා පාරක් සම්බන්ධව.ඒක ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා.අතුල මන්ත්‍රීතුමාටත් ඒකේ බලපෑමක් තියෙනවා.ටවුන්ගෙදරවත්ත පාර කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.ඒ වගේම මගේ පාරෙත් මැදින් වතුර ගලා යන නිසා පාර ලිස්සනවා.

ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා
අතිකාල දීම සම්බන්ධව කතා කරන කොට සෙනසුරාදා,ඉරිදාත් වරිපනම් පැත්ත විවෘත කරන්න වෙනවා.ඒක නිසා සේවය මාරු කරලා හරි කල හැකි දෙයක් කරන්නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි තුසිතා ප්‍රියංගනී මිය

අපේ පාර දෙපස කැලෑව වැවිලා.වාහන යන්නත් අපහසුයි.ඒකට අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා ඉල්ලනවා.

7. කාරක සභා වාතර්ාව සලකා බැලීම

8. ආදායම් හා වියදම් වාතර්ා සලකා බැලීම

8.1 2022 අප්‍රේල් මාසයේ ආදායම් හා වියදම් වාතර්ා සභාවේ දැන ගැනීම සඳහා සභාගත කිරීම

9. පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.

නැත.

න්‍යාය පත්‍රානුකූලව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසුව මහ සභාවේ කටයුතු ප.ව 2.30 ට පමණ අවසන් විය.